LIBERATIONBASE
ඩිජිටල් පුස්තකාලය

ඩිජිටල් පුස්තකාලය සහ ලේඛණ සංරක්ෂණ ව්‍යාපෘතිය
ආරම්භය (*NMSG Library* ලෙස): 2010
LIBERATIONBASE ලෙස නැවත නාමකරණය: 2013

සූචිකරණ දත්ත
- කෘතිය: සහාග ආණ්ඩුව ගැන
- කතෘ/පරිවර්තක: මාඕ සේතුං/-
- ප්‍රකාශක: කම්කරුවා ප්‍රකාශනයකි, කොළඹ
- පළමු ඩිජිටල් පළ කිරීම: 2019-05-31
- ඩිජිටල් සංස්කරණයන්: V1:2019-05-29
- පිටු ගණන: 108
- භාෂා මාධ්‍ය: සිංහල
- ගොනු ආකෘතිය: PDF

Web: https://liberationbase.wordpress.com
Email: slradical@ymail.com

මා ඕ සේතුං
විසිනි

සහාග ආණ්ඩුව ගැන

සභාග ආණ්ඩුව ගැන

1945 අප්‍රේල් 27

I චීන ජනතාවගේ මූලික ඉල්ලීම

LIBERATIONBASE

අපේ සම්මේලනය පැවැත්වෙන්නේ පහත සඳහන් තත්වයක් යටතේය. චීන ජනතාව විසින් අසීමිත පරිත්‍යාගයන් කරමින්, මෙතෙකැයි කිව නොහැකි තරම් කම්කටොලු විඳිමින්, ජපන් ආක්‍රමණිකයින්ට විරුඩව ගෙන ගිය අදිටන් සහගත, වීරෝදාර, නොපසුබට අරගලයට අවුරුදු අටක් පමණ කාලයක් ගතවීමෙන් පසු අළුත් තත්වයක් උද්ගත වී ඇත; ලෝකය සමස්තයක් වශයෙන් ගත් විට පැසිස්ට ආක්‍රමණිකයින්ට විරුඩව කළාවූ සාධාරණ සහ ශුද්ධ යුඩයක තීරණාත්මක ජයක් අත්වී තිබේ. මිත්‍ර රටවල් සමග එක් වී චීන ජනතාව විසින් ජපන් ආක්‍රමණිකයන් පරාජය කරන මොහොත වැඩි ඈත නොවේ. ඒත් චීනය භේද භින්නව සිටියි. ඇය තවමත් බරපතල අර්බුදයකට මුහුණ දෙමින් සිටියි. මෙබඳු තත්වයක් යටතේ අප කළ යුත්තේ කුමක්ද? නිසැකවම වහාම කළයුත්ත නම් සියලු දේශපාලන පක්ෂවල සහ කණ්ඩායම් වල පාක්ෂික බැදීම් වලින් තොරව සියළුම ජනතාවන්ද එක්කොට ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණයන් ක්‍රියාත්මක කරනු සඳහාත් වර්තමාන අර්බුදයෙන් ගොඩ එනු සඳහාත්, ජපන් ආක්‍රම-ණිකයින් පරාජය කරනු පිණිසත්, මිත්‍ර රටවල් සමග එක්වී සටන් කිරීමටත් සියළු ජපන් විරෝධී බලවේග පණපොවා එක්සත්

කම්කරුවා ප්‍රකාශක මන්දිරය
121, යූනියන් පෙදෙස, කොළඹ 2.

කිරීමෙන් ඔවුන්ගේ ග්‍රහණයෙන් මිදීමට චීන ජනතාවට මග පාදනු සඳහාත්, තාවකාලික ප්‍රජාතන්ත්‍රවාදී සභාග ආණ්ඩුවක් පිහිටුවීමයි. එයින් පසු කළයුත්තේ පුළුල් ජන සම්මත පදනමක් මත ජාතික මන්ත්‍රී මණ්ඩලයක් පිහිටුවා නීත්‍යානුකූලව සැදුම්ලත් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක් පිහිටු වීමයි. මේ ආණ්ඩුවද සභාග රජයක ස්වරූපයෙන් යුක්ත විය යුතුය. ඒ තුල සියලු පක්ෂ හා කණ්ඩායම්ද කිසිම පක්ෂයකට සම්බන්ධ නොවූ ජනකොටස්ද වඩා පුළුල් ලෙස නියෝජනය විය යුතුය. ස්වතන්ත්‍ර, ස්වාධීන, ප්‍රජාතන්ත්‍රවාදී, එක්සත්, සෞභාග්‍යමත් සහ බලගතු නව චීනයක් ගොඩ නඟනු සඳහා, විමුක්තිය ලද මුළු රටේ ජනතාව මෙහෙය වීමට එම ආණ්ඩුව සමත් විය යුතුය. කොටින් කියතොත් අපේ ප්‍රතිපත්තිය විය යුත්තේ සමගිය හා ප්‍රජාතන්ත්‍රය පදනම් කර ගෙන ආක්‍රමණිකයින් පරදවා අළුත් චීනයක් ගොඩ නැගීමයි.

චීන ජනතාවගේ මූලික ඉල්ලීම් ඉටු කළ හැක්කේ මෙමගින් පමණක් බව අපගේ විශ්වාසය වේ. එනිසා මගේ වාර්තාවට ප්‍රධාන වශයෙන් විෂය වනුයේ මේ ඉල්ලීමය. ප්‍රජාතන්ත්‍රවාදී සභාග ආණ්ඩුවක් පිහිටුවිය යුතුද, නැද්ද, යන වග චීන ජනතාවගේ මෙන්ම, මිත්‍ර රටවල ප්‍රජාතන්ත්‍රවාදී ජනමතයෙහි දැඩි සැලකිල්ල යොමුවී ඇති කරුණක් වී තිබේ. එම නිසා මේ ප්‍රශ්නය විවරණය කරනු සඳහා මගේ වාර්තාවෙන් විශේෂ වෙහෙසක් ගනු ලබන්නේය.

ජපන් විරෝධී ප්‍රතිප්‍රහාරක යුද්ධය පැවති අට වසර තුළ චීන කොමියුනිස්ට් පක්ෂය බොහෝ බාධා මැඩගෙන විශාල ජයග්‍රහණයන් අත්කර ගෙන තිබේ. එහෙත් දැනට පවත්නා තත්වය අනුව පෙනී යන්නේ අප පක්ෂය හා ජනතාව තවමත් බරපතළ කරදර වලට මුහුණ පාමින් සිටින බවයි. වර්තමාන තත්වය අනුව බලන විට අප පක්ෂය තව තවත් වෙහෙස මහන්සියෙන් වැඩ කළ යුතුය. කරදර කම්කටොළු මැඩ ගෙන ඉදිරියට යමින් චීන ජනතාවගේ මූලික ඉල්ලීම් ඉටු කරනු සඳහා දිගින් දිගටම උත්සාහ ගත යුතුය.

II ජාත්‍යන්තර හා දේශීය තත්වය

මේ මූලික වුවමනාවන් ඇත්ත වශයෙන්ම ඉටු කර ගැනීමට චීන ජනතාව සමත් වන්නේද ? මේ ප්‍රශ්නයට පිළිතුරු පවත්නේ ඔවුන්ගේ දේශපාලන ප්‍රබෝධයේ, සමගියේ හා වීර්යයේ මට්ටම උඩය. ඒ එක්කම වර්තමාන ජාත්‍යන්තර හා දේශීය තත්වය අනුව අතිශයින් හිතකර අවස්ථාවන්ගෙන් හොඳින් ප්‍රයෝජන ගෙන උද්යෝගිමත්ව, ප්‍රමාණවත්ව, නොපසුබටව සටන් කිරීමට චීන ජනතාවට පුළුවන් වුනොත් ආක්‍රමණිකයන් නිසැකයෙන්ම පරදවා නව චීනයක් ගොඩ නැගීමට හැකි වන්නේය. මේ උතුම් කර්තව්‍යයන් ඉටු කරනු සඳහා ඔවුන් ගන්නා වෙහෙස දෙගුණ තෙගුණ කළ යුතුය,

වර්තමාන ජාත්‍යන්තර තත්වය කෙබඳුද?

වර්තමාන යුද්ධ තත්වය කිමෙක්ද යත් සෝවියට් හමුදව බර්ලින්යට පහර දෙමින් සිටී. බ්‍රිතාන්‍යයේ, අමෙරිකා එක්සත් ජනපදයේ හා ප්‍රංශයේ මිත්‍ර හමුද සෝවියට් ප්‍රහාරය සමග ඒකාග්‍රතාවයකින් යුතුව ක්‍රියා කරමින් ශේෂ වී ඇති හිට්ලර්වාදී බලකායනට පහර දෙමින් සිටිත්. ඉතාලි ජනතාව කැරළි ගැසීමට පටන් ගෙන තිබේ. මේ සියල්ලෙහි ප්‍රතිඵලය වනුයේ හිට්ලර් සදහටම මකබෑවී යාමයි. හිට්ලර් පිසදැමීමෙන් පසු ජපන් ආක්‍රමණිකයන්ගේ පරාජය වැඩි ඈත නොවේ, චීන හා විදේශීය ප්‍රතිගාමීන්ගේ අනාවැකි බොරු කරමින් පැසිස්ට්වාදී ආක්‍රමණික බලවේග නිසැකයෙන්ම පෙරළා දමා ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී බලවේගයෝ නියත විජයග්‍රහණයක් අත්කර ගන්නවා ඇත. ලෝකය ප්‍රගති මාවත මිස ප්‍රතිගාමී මාවත ඔස්සේ නොයන බව සහතිකය. හැබැයි, අප සිටිය යුත්තේ සෝදිසියෙනි. ඇතැම් තාවකාලික

LIBERATIONBASE

හෝ බරපතළ පසුබෑම් සිදුවීමට ඉඩ තිබෙන බව අප මතක තබා ගත යුතුය. ස්වදේශීය හා විදේශීය ජනතාවගේ සමගිය, ප්‍රගතිය හා විමුක්තිය නුරුස්නා බලගතු ප්‍රතිගාමී බලවේගයන් බොහෝ රටවල තිබේ. මේ කරුණ නොදකින්නෝ දේශපාලන වැරදිවල බැඳෙත්. කෙසේ වුවද ඉතිහාසයේ පොදු පෙර ගමන් මග දන් පැහැදිලිව තීරණය වී හමාරය, එය වෙනස් වන්නේ නැත. මෙය අහිතකර වනුයේ පැසිස්ටවාදීන්ටත් ඔවුන්ගේ උදව්කාරයන් වන සියළු රටවල ප්‍රතිගාමීන්ටත් පමණි. එහෙත් මෙය සියළු රටවල ජනතාවට හා සංවිධානය වූ ප්‍රජාතන්ත්‍රවාදී බලවේගවලට ශාන්තියකි. ජගත් ඉතිහාසය මෙහෙයවන බලවේගය ජනතාව මිස, අන් කිසිවෙක් නොවෙත්; මහා බලපරාක්‍රමයක් ගොඩ නගා ඇති සෝවියට් ජනතාව පැසිස්ටවාදය පරාජය කරන්නාවූ ප්‍රධාන බල වේගය වී තිබේ. පැසිස්ටවාදය විනාශ කිරීමට හැකිවී තිබෙන්නේ සෝවියට් ජනතාවගේ සහ අනෙකුත් පැසිස්ට විරෝධී මිත්‍ර රට වල ජනතාවගේ වෙහෙස මහන්සියට පින්සිදු වන්නටය. යුද්ධය විසින් ජනතාවගේ නැණැස පාදා තිබේ. යුද්ධය දිනනු ලබන්නේත්, සාමය දිනනු ලබන්නේත්, ප්‍රගතිය දිනනු ලබන්නේත්, ජනතාව විසිනි.

මේ අළුත් තත්වය පළමුවන ලෝක යුද්ධයේ තත්වයට වඩා බොහෝ සෙයින් වෙනස්ය. එකල සෝවියට් දේශය බිහිවී නොතිබුණි. මෙකල බොහෝ රටවල මහජනතාව මෙන් එකල මහජනතාව දේශපාලන අවදිවීමකින් සිටියේ නැත. ලෝක යුද්ධ දෙක විසින් නියෝජනය කරනුයේ එකිනෙකට සහමුලින් වෙනස් යුග දෙකකි.

මෙහි තේරුම පැසිස්ටවාදී ආක්‍රමණික රටවල් පරාජය කොට දෙවන ලෝක යුද්ධය අවසන් කර ජාත්‍යන්තර සාමය පිහිටුවා ලීමෙන් පසු වැඩි දුර අරගල නොපවත්නා බවත් නොවේ. පුළුල් ලෙස පැතිර පවත්නා ශේෂ වී ඇති පැසිස්ටවාදී බලවේග කරදර ඇති කිරීමට පටන් ගනු නියතය. එවගේම දනට පැසිස්ට ආක්‍රමණයට විරුද්ධව සටන් කරමින් සිටින කඳවුර තුළම ප්‍රජාතන්ත්‍රයට හතුරුවූද අනිකුත් ජාතීන් පෙළන්නාවූද බලවේගයෝ වෙත්. මොවුන් විවිධ රටවල, යටත් විජිතවල හා අර්ධ යටත් විජිතවල ජනතාවන් නොකඩවා පෙළනු ඇත. එම නිසා ජාත්‍යන්

තර සාමය පිහිටුවාලූ පසුත් ලොව බොහෝ පෙදෙස්වල පැසිස්ට විරෝධී ජනතාව සහ පැසිස්ට වාදයේ සුන්බුන් අතරත්, ප්‍රජා–තන්ත්‍රයේ හා ප්‍රජාතන්ත්‍ර විරෝධය අතරත්, ජාතික විමුක්තිය හා ජාතික පීඩනය අතරත් අනේක අරගලයන් පවතිනු ඇත. ජනතාවට ඉතාම පුළුල් ජය අත්වනුයේ දිගු කලක් මුළුල්ලේ කෙරෙන අනවරත අරගල තුළින් පමණි. ශේෂවී ඇති පැසිස්ට වාදී බලවේග සහ ප්‍රජාතන්ත්‍ර විරෝධී බලවේග පරාජය කිරීමෙන් පසුව පමණි. මේ දිනය ඉක්මණින් හෝ පහසුවෙන් හෝ ළඟා වන්නක් නොවන මුත් එය ළඟා වන බව නම් සිකුරුයි. පැසිස්ට විරෝධී දෙවන ලෝක යුද්ධයෙන් අත්වන ජය පශ්චාත් යුද්ධ අරගලවලදී ජනතාවට ජය අත්කර දීමට මග පාදන්නේය. ස්ථිර හා කල් පවත්නා සාමයක් උදාවනුයේ මේ අරගල වලින් ජය අත්කර ගත් පසුව පමණි.

LIBERATIONBASE

වර්තමාන දේශීය තත්වය කෙබඳුද ?

දිගුකල් පැවැති චීනයේ යුද්ධය නිසා චීන ජනතාවට විශාල පරිත්‍යාගයන් කිරීමට සිදුවිය. අනාගතයේදීද එසේ වනු ඇත. එහෙත් මේ එක්කම යුද්ධය නිසා චීන ජනතාව පන්නරය ලබා සිටිත්. ඉකුත් සියක් වසර මුළුල්ලේ කෙරුනු සියළු අරගල වලින් චීන ජනතාව අවදිමත් වූ, සමගි සම්පන්න වූ මට්ටමට වඩා විශාල මට්ටමකින් මේ යුද්ධය නිසා ඔවුහු අවදි වී සිටිත්, සමගි වී සිටිත්. චීන ජනතාව බලගතු ජාතික සතුරෙකුට පමණක් නොව සතුරාට රුකුල් දෙන ප්‍රබල දේශීය ප්‍රතිගාමී බලවේගවලටද මුහුණ දෙත්. මෙය පිංතූරයේ එක පැත්තක් පමණි. මීන් පෙර අන්කිසි කලෙක නොවූ ලෙසින් චීන ජනතාව දේශපාලන ප්‍රබෝ–ධයක් ලබා සිටීමත්, බලගතු විමුක්ති ප්‍රදේශ හා දිනෙන් දින දියුණු වන දේශ ව්‍යාප්ත ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයක් ගොඩනගා තිබීමත් ප්‍රශ්නයේ අනෙක් මුහුණත විය. මේ කරුණු හේතු කොට ගෙන දේශීය වශයෙන් හිතකර තත්වයන් ඇතිවී තිබේ. ඉකුත් සියවස මුළුල්ලේ චීන ජනතාව ස්වකීය අරගල වලදී පරාජයනට හා පසුබෑම් වලට මුහුණ දීමට සිදුවූ යම්කිසි ජාත්‍යන්තර හා දේශීය වශයෙන් අවශ්‍යව පැවති තත්වයන් එද නොමැතිව තිබුනත් අද තත්වය ඊට වඩා වෙනස්ය. අවශ්‍ය සෑම තත්වයක්ම දන් උදාවී තිබේ. පරාජය වළකා ජයග්‍රහණය අත්කර ගැනීමට

සෑම ඉඩක් ඇත්තේය. සමස්ත ජනතාව අදිටන් සහගත අරගලයක යෙදෙන පරිදි ඔවුන් සමගි කළහැකි නම්, ඔවුනට නිවැරදි නායකත්වය දිය හැකි නම්, අප ජයගනු නියතය.

ආක්‍රමණිකයන් පරදවනු සඳහා සමගිවීමටත්, නව චීනයක් ගොඩනැගීමටත් දැන් චීන ජනතාව තුළ පවත්නේ පෙර පැවැතියාට වඩා දැඩි විශ්වාසයකි. සියළු කම්කටොළු අභිභවා යමින් ස්වකීය මූලික වුවමනාවන් ඉටුකර ගැනීමටත්, තමන්ගේ ශ්‍රෙෂ්ඨ ඓතිහාසික ප්‍රාර්ථනයන් මුදුන් පත්කර ගැනීමටත් චීන ජනතාවට දැන් කාලය පැමිණ තිබේ. මේ ගැන කිසි සැකයක් තිබේද ? නැතැයි මම සිතමි.

පොදුවේ සළකා බලන විට වර්තමාන ජාත්‍යන්තර හා දේශීය තත්වය ඔන්න ඔබඳුය.

III ජපන් විරෝධී යුධයේ ක්‍රියාමාර්ග දෙක

චීනයේ ප්‍රශ්නවලට මූලික හේතුව

දේශීය තත්වය ගැන කථා කරන විට චීනයේ ප්‍රතිප්‍රහාරක යුද්ධය ගැන විශේෂ විග්‍රහයක් කළ යුතුය.

පැසිස්ට් වාදයට විරුද්ධව යුද වැදී සිටින විශාලතම රටවල් පහෙන් එකකි, චීනය, ආසියා මහාවීපය තුල ජපන් ආක්‍රමණිකයනට විරුද්ධව සටන් කරන ප්‍රධාන රට චීනයයි. චීන ජනතාව ජපානයට විරුද්ධව කරන යුද්ධය අතින් අතිවිශාල කාර්යභාරයක් ඉටුකර තිබෙනවා පමණක් නොව, ඔවුන් යුද්ධය හමාර වීමෙන් පසුව ලොවෙහි සාමය රැකීම අතින්ද අතිමහත් කාර්යය භාර්යයක් ද, පෙරදිග සාමය රැකීම අතින් තීරණාත්මක සේවයක්ද ඉටු කරනු ඇත. ජපන් විරෝධී ප්‍රතිප්‍රහාරක යුද්ධය කෙරුණු අට වසර තුළදී චීනය ස්වකීය විමුක්ති ලාභය සඳහා අතිවිශාල වෙහෙසක් ගෙන ඇති අතර මිත්‍ර රටවලට උපකාරී වනු සඳහාද විපුල මහන්සියක් ගෙන තිබේ. මූලික වශයෙන් මේ වෙහෙස මහන්සිය දරන ලද්දේ චීන මහජනතාව විසිනි. චීන හමුදුවල නිලධාරීන් හා භටයන් විශාල සංඛ්‍යාවක් යුද බිමෙහි සටන් කොට ලේ පුද තිබේ, යුද පෙරමුණට පිටුපසින් හිඳගෙන චීනයේ කම්කරුවන්, ගොවීන්, බුද්ධිමතුන් හා කර්මාන්ත හිමියන් දැඩි මහන්සියකින් ක්‍රියා කර ඇත. විදෙස් ගතව සිටින චීනුන් යුද්ධයට ආධාර වනු පිණිස මුදල් සහ ද්‍රව්‍ය පරිත්‍යාග කර තිබේ. ජනතාවට පසමිතුරු සාමාජිකයන් හැරුණු විට සියළුම ජපන් විරෝධී දේශපාලන පක්ෂ යුද්ධයේදී ස්වකීය යුතුකම් කොටස ඉටු කළහ, කොටින් කියතොත් පුරා අටවසක් මුළුල්ලෙහි චීන ජනතාව ලේ සුහ ඩහදිය පෙරා ගෙන ජපන් ආක්‍රමණිකයනට විරුද්ධව විරෝ

LIBERATIONBASE

දුර සටනක් කර තිබේ. එහෙත් යුද්ධයේදී චීන ජනතාවගෙන් ඉටුවූ මෙහෙය පිළිබඳ සත්‍යය ලෝකයට වසන් කර තබනු සඳහා චීන ප්‍රතිගාමීයෝ වසර කිහිපයක් මුළුල්ලේ දූෂමාන ආරංචි පතුරුවමින් මහජන මතය නොමඟ යවා ඇත්තාහ. තවද මේ අට වසරක යුද සමය තුළදී චීනය ලැබූ විවිධ අත්දැකීම් පිළිබඳව අංග සම්පූර්ණ සම්පිණ්ඩනයක් මෙතෙක් සපයා නොමැත. එම නිසා ජනතාවට අවබෝධයක් ලබා දෙනු පිණිසත්, ක්‍රියාමාර්ගය සඳහා අප පක්ෂයට පදනමක් සපයා ගනු පිණිසත් මේ සම්මේලනය විසින් එකී අත්දැකීම් සම්භාරය හරියාකාර සම්පිණ්ඩනය කළයුතුව තිබේ.

මෙබඳු සම්පිණ්ඩනයක් කෙරෙන විට චීනය හමුවෙහි දෙ-ආකාරයක ක්‍රියාමාර්ගයන් ඇති බව කාටත් පැහැදිලි වේ. මින් එක් ක්‍රියාමාර්ගයක් ජපන් ආක්‍රමණිකයන්ගේ පරාජය කරා යොමුවී පවත්නා අතර, අනෙක් ක්‍රියා මාර්ගය නිසා ඔවුන් පරාජය කරනු නොහැකි වනවා පමණක් නොව. ඇතැම් අංශවලින් ඇත්ත වශයෙන්ම ඔවුනට රුකුල් ලැබී අපේ ප්‍රතිප්‍රහාරක යුද්ධය අබල දුබල වන්නේය.

කුඕමින්තාන් ආණ්ඩුව ජපානය සම්බන්ධයෙන් සාමකාමී විරෝධය පෑමේ ප්‍රතිපත්තියක් අනුගමනය කරන අතර, දේශීය වශයෙන් අමු අමුවේ ජනතාව පෙළීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් යුද්ධ පරාජයන්ටත්, යෝධ භෞමික පාඩුවලටත්, මුදල් හා ආර්ථික අර්බුදයනටත්, ජනතා පීඩනයට හා දුෂ්කරතාවයනටත්, ජාතික සමගිය කඩාකප්පල් වීමටත් මුහුණ පෑමට සිදුවිය. යුද්ධය සාර්ථක ලෙස කරගෙන යනු සඳහා චීන ජනතාවගේ ජපන් විරෝධී සකල බලවේගයන් පණ පෙවීමට හා එක්සත් කිරීමටද ජනතාවගේ අවදිවීමට හා සමගියටද මේ ප්‍රතිගාමී පිළිවෙත බාධාවක් විය. එහෙත් මේ දේශපාලන ප්‍රබෝධය හා මේ සමගිය වර්ධනයවීම කිසිදක අත්හිටියේ නැත. එදා ජපන් ආක්‍රමණිකයන්ගේ හා කුඕමින්තාන් ආණ්ඩුවේ දෙයාකාර මර්දනයට හසුවී, කම්කටොළු සහගත මාවතක් ඔස්සේ ඉදිරියට ගමන් කොට තිබේ. දිගු කලක පටන් චීනයෙහි ක්‍රියාමාර්ග දෙකක් හටගෙන ඇති බව පැහැදිලිය. එනම් ජනතා මැඩලීමේ හා සාමකාමී විරෝධය පෑමේ කුඕමින්තාන් ආණ්ඩු

LIBERATIONBASE

වේ ප්‍රතිපත්තියත්, ජනතා යුද්ධයක් කරනු සඳහා ස්වකීය ප්‍රබෝධය හා සමගිය වඩන්නාවූ චීන ජනතාවගේ ප්‍රතිපත්තියත්ය. චීනයේ සියළු ප්‍රශ්න වලට මූලික හේතුව වන්නේ මෙයයි.

ඉතිහාසය ගමන් ගන්නේ කම්කටොළු සහගත මගකය:

චීනයේ සියළු ප්‍රශ්නවලට මූලික හේතුව වනුයේ ක්‍රියාමාර්ග දෙකක් පිළිබඳ මේ ප්‍රශ්නය බව මහජනයාට ඒත්තු යෑම පහසු වනු සඳහා ජපානයට විරුද්ධව අප කරන්නාවූ ප්‍රතිප්‍රහාරක යුද්ධයේ ඉතිහාසය අවුස්සා බැලීම සුදුසුය.

චීන ජනතාවගේ ප්‍රතිප්‍රහාරක යුද්ධය ගමන් කර ඇත්තේ කම්කටොළු සහගත මහක් ඔස්සේය. මේ යුද්ධය ඇරඹුණේ 1931 තරම් ඈත කාලයකය. ඒ අවුරුද්දේ සැප්තැම්බර් 18 වැනිද ජපන් ආක්‍රමණිකයෝ ශෙන්යාන් ප්‍රදේශය අල්ලා ගත්හ. මාස කිහිපයක් තුළදී ඔවුහු නිරිත දිග පළාත් තුන අල්ලා ගත්හ. කුඕමින්තාන් ආණ්ඩුව මෙහිදී අනුගමනය කළේ ප්‍රතිප්‍රහාරයක නොයෙදීමේ ප්‍රතිපත්තියකි. එහෙත් කුඕමින්තාන් ආණ්ඩුවේ අභිමතයට විරුද්ධව යමින්ද, චීන කොමියුනිස්ට් පක්ෂයේ නායකත්වය හෝ සහයෝගය ඇතිවද, මහජනතාව සහ මේ පළාත් වල දේශප්‍රේමී හමුද කොටස් එක්වී ජපන් විරෝධී ස්වේච්ඡා බලකාය සහ ජපන් විරෝධී එක්සත් හමුදව ගොඩ නගා විරෝදර ගරිල්ලා සටන් ව්‍යාපාරයක් ඇරඹූහ. එක් වකවානුවකදී මේ වීර ගරිල්ලා සටන් බොහෝ සෙයින් පැතිරී ගිය අතර කෙතරම් කරදර හා පසුබෑම් තිබුණේ වී නමුත් ඔවුන්, මෙල්ල කිරීමට සතුරා අසමත් විය. 1932 දී ජපන් ආක්‍රමණිකයන් ෂැන්හයි නුවරට පහර දුන් අවස්ථාවේ කුඕන්තාන් පිළේ සිටි දේශප්‍රේමී කණ්ඩායමක් නැවතත් කුඕමින්තාන් ආණ්ඩුවේ අභිමතයට පිටුපාමින් ජපන් ආක්‍රමණිකයනට විරුද්ධව ප්‍රතිප්‍රහාරයක් එල්ල කරනු සඳහා 19 වෙනි මාර්ග හමුදව මෙහෙය වූහ. 1933 දී ජපන් ආක්‍රමණිකයෝ ජෙහොල් සහ චහාර් යන පළාත් වලට කඩා වැදුණාහ. තුන්වැනි වරටත් දේශප්‍රේමීන් කොටසක් කුඕමින්තාන් ආණ්ඩුවේ අභිමතයට පටහැනිව යමින් සතුරාට විරුද්ධව සටන් කරනු සඳහා ජපන් විරෝධී මිත්‍ර හමුදව සංවිධානය කරනු සඳහා කොමියුනිස්ට් පක්ෂය සමග සහයෝගයෙන්

කටයුතු කළහ. ජපානයට විරුද්ධව කළාවූ මේ සියළු සටන් වලදී මුළුමහත් සහයෝගය ලැබුණේ චීන ජනතාවගෙන්, චීන කොමියුනිස්ට් පක්ෂයෙන්, අනෙකුත් ප්‍රජාතන්ත්‍රවාදී කණ්ඩායම් වලින් සහ විදෙස් ගතව විසූ දේශප්‍රේමී චීනුන්ගෙනි. මේ අතර තුරේ සතුරාට විරුද්ධව ප්‍රතිප්‍රහාරයෙහි නොයෙදීමේ පිළිවෙතක් අනුගමනය කළ කුඕමින්තාන් ආණ්ඩුව ඒ සටන් වලදී කිසිදු සහයක් නොදුන්නේය. අනෙක් අතට කුඕමින්තාන් ආණ්ඩුව කළේ ෂැන්හයි සහ චහාර් යන පෙදෙස්වල ජපන් විරෝධී වැඩ කටයුතු කඩාකප්පල් කිරීමය. 19 වෙනි මාර්ග හමුදව විසින් පූකියෙන්හි පිහිටුවන ලද මහජන ආණ්ඩුවද කුඕමින්තාන් ආණ්ඩුව විසින් 1933 දී විනාශ කර දමන ලදී.

එද කුඕමින්තාන් ආණ්ඩුව ප්‍රතිප්‍රහාරයෙහි නොයෙදීමේ පිළිවෙතක් අනුගමනය කළේ මන්ද? ඊට මූලික හේතුව කුඕමින්තාන් ආණ්ඩුව විසින් 1927 දී කුඕමින්තාන් - කොමියුනිස්ට් සහයෝගය සහ චීන ජනතාවගේ සමගිය කඩා බිඳහෙළා තිබීමයි.

1924 දී චීන කොමියුනිස්ට් පක්ෂයේ යෝජනාවන් පිළිගත් ආචාර්ය සුන්යත් සෙන් කුඕමින්තානයේ පළමුවන ජාතික සම්මේලනය කැඳවීය. කොමියුනිස්ට් වරුන්ද සහභාගි වූ මේ සම්මේලනයේදී රුසියාව සමග මිත්‍රත්වයෙන් කටයුතු කිරීමේ, කොමියුනිස්ට් පක්ෂය සමග සහයෝගයෙන් ක්‍රියා කිරීමේ සහ ගොවි කම්කරුවනට ආධාර සැපයීමේ තුන් මහ පිළිවෙත අනුමත විය. මේ සම්මේලනය විසින් වම්පෝආ යුධ ඇකඩමිය පිහිටුවා කුඕමින්තානය, කොමියුනිස්ට් පක්ෂය සහ සියළු ජන කොටස් ඇතුලත් ජාතික එක්සත් පෙරමුණ පිහිටුවා ගන්නා ලදී. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් කුවාන්ටුන් පළාතේ ප්‍රතිගාමී බලවේග 1924-1925 දී විනාශ කරනු ලැබූහ. 1926-1927 දී ජයග්‍රාහී උතුරුබද ප්‍රහාරය එල්ල කරන ලදී. යැන්ට්සි සහ කහ ගඟ බඩවූ බොහෝ පෙදෙස් ආපසු අල්ලා ගනු ලැබීය. උතුරෙහි තිබුණු යුද්ධාධිපති ආණ්ඩුව පරාජය කිරීමෙහි ජනතාවගේ ජාතික විමුක්ති අරගලය චීන ඉතිහාසයෙහි ඉන් පෙර නොවූ විරූ පරිමාණයකින් වර්ධනය වූයේය. එහෙත් උතුරු ප්‍රහාරය සිදුවෙමින් තිබියදී එක් වැදගත් මොහොතකදී—එනම් 1927 වසන්තයේ අගභාගයේදී හා

ගිම්හානයේ මුල්භාගයේදී කුඕමින්තාන් අධිකාරීන් විසින් අනුගමනය කරන ලද "පක්ෂය පිරිසිදු කිරීමේ" සහ මනුෂ්‍ය සංහාරක ද්‍රෝහි ප්‍රතිගාමී ප්‍රතිපත්ති කරණකොටගෙන චීන ජනතාවගේ විමුක්ති ව්‍යාපාරයත් එහි සියළු විප්ලවකාරී ප්‍රතිපත්තිත් ගැබ්වී සැදුම් ලත් ජාතික එක්සත් පෙරමුණ-කුඕමින්තානයේ කොමියුනිස්ට් පක්ෂයේ හා සියළු ජන කොටස්වල එක්සත් පෙරමුණ කඩාකප්පල් වී ගියේය. ඊයේ පෙරෙයිද වනතුරු මිත්‍ර සහායකයින් වූ චීන කොමියුනිස්ට් පක්ෂය හා චීන ජනතාව දැන් සලකනු ලබන්නේ සතුරන් පිරිසක් ලෙසිනි. ඊයේ පෙරෙයිද වනතුරු සතුරන් වූ අධිරාජ්‍යවාදීන් හා රදළයන් දැන් සලකනු ලබන්නේ මිත්‍ර සහායකයින් ලෙසිනි. ඉදින් හිටිහැටියේම චීන කොමියුනිස්ට් පක්ෂයට හා ජනතාවට විරුද්ධව දුෂ්ඨ ප්‍රහාරයක් එල්ල කොට ඒ උදාර ජංගම ප්‍රාණවත් විප්ලවය පොඩිපට්ටම් කර දමන ලදී. එතැන් පටන් සමගිය වෙනුවට ඇතිවූයේ සිවිල් යුද්ධයයි. ප්‍රජාතන්ත්‍රය වෙනුවට ඇතිවූයේ ඒකාධිපත්‍යයයි. ප්‍රභාමත්ව දිදුළුණු චීනයක් වෙනුවට ඇතිවූයේ අන්ධකාරයෙන් වැසී ගිය චීනයකි. එහෙත් චීන කොමියුනිස්ට් පක්ෂය හෝ චීන ජනතාව හෝ මෙල්ල කිරීමටවත් යටපත් කිරීමටවත් සමූලඝාතනය කිරීමටවත් නොහැකි විය. ඔවුහු නැගී සිටියහ. ලේ පිසද ගත්හ. දිවි තොරවූ සහෝදරයන් භූමදාන කළහ. නැවතත් සටන් බිමට වැදුණාහ. විප්ලවයේ ධජය ලෙළදෙවමින් ඔව්හු ආයුධ සන්නද්ධ ප්‍රතිප්‍රහාරයන් සඳහා නැගී සිටියහ. චීනයේ අතිවිශාල පෙදෙසක් පුරා ඔව්හු මහජන ආණ්ඩු පිහිටුවාලූහ. ඉඩම් ප්‍රතිසංස්කරණයක් ක්‍රියාත්මක කළහ. ජනතාවගේ හමුදවක්-චීන රතු හමුදව-ගොඩනැගූහ. චීන ජනතාවගේ විප්ලවීය බලවේගයන් සුරක්ෂිත කළහ, ව්‍යාප්ත කළහ. කුඕමින්තාන් ප්‍රතිගාමීන් විසින් ඉවත විසි කරන ලද ආචාර්ය සුන්යත් සෙන් ගේ විප්ලවවාදී ත්‍රිවිධ ජනතා ප්‍රතිපත්ති මහජනතාව, කොමියුනිස්ට් පක්ෂය හා සෙසු ප්‍රජාතන්ත්‍රවාදීන් විසින් ඉදිරියට ගෙන යන ලදී.

ජපන් ආක්‍රමණිකයන් නිරිත දිග පළාත් තුන ආක්‍රමණය කළ විට එවකට රතු හමුදවටත් විප්ලවවාදී මූලස්ථානවලටත් පහර දෙමින් සිටි, සියළු කුඕමින්තාන් හමුදවනට 1933 දී යෝජනාවක් කළ චීන කොමියුනිස්ට් පක්ෂය, ජපානයට එක්සත් ප්‍රති-

LIBERATIONBASE

ප්‍රහාරයක් එල්ල කළ හැකිවන පරිද්දෙන් සමාදාන ගිවිසුමකට එළැඹිය යුතුයයි කියා සිටියේය. මේ යෝජනාවට කොන්දේසි තුනක් අඩංගු විය. එනම් පහරදීම නවතාලිය යුතුබවත්, ජනතාවට ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් පවරාදිය යුතු බවත්, ජනතාව ආයුධ සන්නද්ධ කළයුතු බවත්ය. එහෙත් කුඹමින්තාන් බලධරයෝ මේ යෝජනාව ප්‍රතික්ෂේප කළහ. ඒ අවස්ථාවේ පටන් කුඹමින්තාන් ආණ්ඩුවේ සිවිල් යුද පිළිවෙත වඩ වඩා නපුරු විය. ජපානයට විරුද්ධව එක්සත් ප්‍රතිප්‍රහාරයක යෙදිය යුතු බවත්, සිවිල් යුද්ධය නවතාලිය යුතු බවත් කියා සිටිමින් නැඟුණු චීන ජනතාවගේ හඬ, වඩ වඩා බලගතු වන්නට පටන් ගති. ෂැන්හයි නුවර සහ තව බොහෝ පෙදෙස්වල දේශප්‍රේමී මහජන සංවිධාන ගොඩ නැඟෙන්නට විය. 1934–1936 අතර කාලයේදී යැංසි ගංභාවට උතුරින් හා දකුණින් රැඳී අප පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ නායකත්වය යටතේ රතු හමුදාවේ ප්‍රධාන බලකායන් නොවිදි ගැහැටක් නැත. ඊළඟට ඔවුහු වයඹ දිග චීනය හරහා ගමන් ගෙන එහි සිටි රතු හමුදාවේ සේනාංක වලට එක්වූහ. අලුත් තත්වයට අනුකූල වන අන්දමින් නවතම අංග සම්පූර්ණ දේශපාලන ක්‍රියාමාර්ගයක් චීන කොමියුනිස්ට් පක්ෂය විසින් සකස් කරන ලද්දේත්, එය ක්‍රියාත්මක කරන ලද්දේත් මේ, දැවුරුද්ද තුළය. ඒ ක්‍රියාමාර්ගය නම් ජපන් විරෝධී ජාතික එක්සත් පෙරමුණක් ගොඩ නැඟීමේ කාර්යයයි. මේ අරගලයේ පරමාර්ථය වූයේ ජපානයට විරුද්ධව එක්සත් ප්‍රතිප්‍රහාරයක යෙදීමත්, නව ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයක් පිහිටුවීමත්ය. 1935 දෙසැම්බර් 9 වෙනිද පීකිනයේ ශිෂ්‍ය ජනකාය අප පක්ෂයේ නායකත්වය යටතේ වීරෝදාර දේශමාමක ව්‍යාපාරයකට මුල පිරූහ. චීන ජාතික විමුක්ති පෙරමුණු බලකාය පිහිටුවාලූ ඔව්හු එම ව්‍යාපාරය චීනයේ සියළු මහ නගරවල පතුරුවාලූහ. ජපානයට ප්‍රතිප්‍රහාරයක් එල්ල කිරීමට කැමැත්ත පළකළ දේශාභිමානි කුඹමින්තාන් කණ්ඩායම් දෙකක් වන නිරිත දිග හමුදාව සහ 17 වෙනි මාර්ග හමුදාව, 1936 දෙසැම්බර් 12 වෙනිද එකට එක්වී සුප්‍රසිද්ධ සියාන් සිද්ධිය ඇති කළහ. ඔවුන් මේ පියවර ගත්තේ ජපානයට යටහත් පහත් වෙමින්ද, රටේ ජනතාව මරා දමමින්ද, කුඹමින්තානය ගෙන යන ප්‍රතිගාමී ප්‍රතිපත්තියට එරෙහිව ධෛර්ය සම්පන්නව නැඟී

සිටිමිනි. කුඹමින්තානය තුළ සිටි අනෙකුත් දේශප්‍රේමියෝ එකට කුඹමින්තාන් බලධරයන් අනුගමනය කළ පිළිවෙත ගැන කලකිරී උන්හ. සිවිල් යුද පිළිවෙත අතහැර දැමීමටත්, ජනතාවගේ ඉල්ලීම් වලට ඇහුම්කන් දීමටත්, කුඹමින්තාන් බලධරයනට සිදුවූයේ මෙබඳු තත්වයන් යටතේය. සියාන් සිද්ධිය සාමකාමීව බේරුම්කර ගැනීම, තත්වය වෙනස් කිරීමට තුඩුදුන් සිද්ධිය විය. අලුත් තත්වය යටතේ අභ්‍යන්තරික සහයෝගය ගොඩ නැගී ජපානයට විරුද්ධව දේශ ව්‍යාප්ත ප්‍රතිප්‍රහාරයක් ඇවිළෙන්නට පටන් ගත්තේය. ලූ කව් චියාඕ සිද්ධියට ටිකකට කලින් 1937 මැයි මස ඓතිහාසික ජාතික සම්මේලනයක් පැවැත්වූ අප පක්ෂය එහිදී පක්ෂයේ මධ්‍යම කාරක සභාව 1935 පටන් අනුගමනය කරන අළුත් දේශපාලන ක්‍රියාමාර්ගය අනුමත කෙරිණි.

1937 ජුලි 7 වෙනිද සිදුවූ ලූකව්-චියාඕ සිද්ධියේ පටන් 1938 ඔක්තෝබරයේ වූහානයේ වැටීම දක්වා වූ කාලය තුළදී කුඹමින්තාන් ආණ්ඩුව ජපන් විරෝධී යුද්ධය සැහෙන උද්යෝගයකින් කරගෙන ගියේය. බහුල වශයෙන් ජපනාගෙන් පහරවල් එල්ලවීම නිසාද, මුළු මහත් ජනතාවගේ දේශානුරාගී කෝපාග්නිය බුර බුරා ඉහළ නගින්නට වූ නිසාද, ජපන් ආක්‍රමණිකයින්ට විරුද්ධව ප්‍රතිප්‍රහාරයෙහි යෙදීම ස්වකීය ප්‍රතිපත්තියෙහි මුදුන් කණුව කර ගැනීමට කුඹමින්තාන් ආණ්ඩුවට සිදුවිය. මේ හේතු කොට ගෙන මුළු හමුදාවත් මුළු ජනතාවත් ජපානයට විරුද්ධව ගෙන යන අරගලය පණපෙවුනේය. කලක් යනතුරු අළුත් ප්‍රාණවත් වාතාවරණයක් දක්නට තිබුණි. ජාතිය අන්තරායකට මුහුණ පාමින්ද ජනතාව උද්‍යෝගයෙන් ඇලලී යමින්ද සිටියාවූ ඒ අවස්ථාවෙන් කුඹමින්තාන් ආණ්ඩුව නිසි ප්‍රයෝජන ගෙන ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණ ඇති කොට, ආචාර්ය සුන්යත් සෙන්ගේ විප්ලවවාදී ත්‍රිවිධ ජනතා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරනු ඇතැයි කොමියුනිස්ට්වාදීන් සහ සෙසු ජනසම්මතවාදීන් ඇතුළු සකල ජනතාව අවංකවම බලාපොරොත්තු වූහ. එහෙත් ඔවුන්ගේ බලාපොරොත්තු සුණුවිසුණු වී ගියේය. තරමක් හෝ දැඩිව ප්‍රතිප්‍රහාරයෙහි යෙදුණු ඒ අවුරුදු දෙක තුනදී පවා කුඹමින්තාන් බලධරයෝ ජනතා යුද්ධයක් සඳහා මහජනයා ආයුධ සන්නද්ධ කිරීමට දිගින් දිගටම විරුද්ධ වෙමින් ජපන් විරෝධී ජනසම්මතවාදී එක්

LIBERATIONBASE

සත් ප්‍රයත්නයක යෙදීමට ජනතාව අතර නිරායාසයෙන් ඇති වූ ව්‍යාපාරයට බාධා කිරීමටත් පටන් ගත්හ. කුඕමින්තාන් ආණ්ඩුව චීන කොමියුනිස්ට් පක්ෂය හා අනෙකුත් ජපන් විරෝධී පක්ෂ කෙරෙහි කලින් දක්වූ ආකල්පය තරමක් දුරට වෙනස් කර තිබුණ නමුත් එම පක්ෂවලට සමාන තත්වයක් නොදීමට ඒවායෙහි කටයුතු නන් අයුරින් සීමා කිරීමට දිගින් දිගටම ක්‍රියා කළෝය. දේශප්‍රේමී දේශපාලන සිරකරුවන් විශාල සංඛ්‍යාවක් එතෙක්මත් සිරගෙවල්වල රඳවා සිටිනු ලැබීය. මේ සියල්ලටත් වඩා අන්ත දෙයක් වූයේ 1927 සිවිල් යුද්ධය ඇරඹීමෙන් පසු කුඕමින්තාන් ආණ්ඩුව විසින් පිහිටුවන ලද අතළොස්සකගේ ඒකාධිපත්‍යය තවමත් එලෙසින්ම පවත්වා ගෙන යාමයි. මේ නිසා ජාතියේ ඒකමතික අභිමතය නියෝජනය කරන්නාවූ ජනසම්මත සභාග ආණ්ඩුවක් පිහිටුවීම අසීරු කරුණක් විය.

ජපානයට විරුද්ධව චීනය කරගෙන යන ප්‍රතිප්‍රහාරක යුද්ධය හමුවෙහි එකක් තෝරා ගනු සඳහා ක්‍රියාමාර්ග දෙකක් ඇති බවත්, එක්කෝ ජයග්‍රහණය අත්කර දෙන සර්වප්‍රකාර ජනතා යුද්ධයක් කළ යුතු බවත්, එසේ නැත්නම් පරාජය කරා යොමු වන ජනතාව දිගින් දිගටම පීඩනයට ගොදුරු කර තබන අර්ධ යුද්ධයක් කළ යුතු බවත්, කොමියුනිස්ට්වාදීන් වන අපි ඒ වකවානුව තුළදී පෙන්වා දුනිමු, එමෙන් යුද්ධය කල්අල්ලන බවත් බොහෝ කරදර කම්කටොළුවලට මුහුණ පෑම නොවැළැක්විය හැකි බවත්, එසේ වුවද අවසානයේදී චීන ජනතාව ස්වොත්සාහයෙන් ජය අත්කර ගැනීම සිකුරු බවත් අපි පෙන්වා දුනිමු.

ජනතා යුද්ධය:

මේ වකවානුව තුළදී චීනයෙහි වයඹ දිගට ගොස් සිටි කොමියුනිස්ට් නායකත්වයෙන් යුත් රතු හමුදාවේ ප්‍රධාන සේනාංක චීන ජාතික විප්ලවකාරී හමුදාවේ අටවැනි මාර්ග හමුදාව යනුවෙන් නැවත නම් කරනු ලැබීය. මේ අතර යැන්ට්සි ගංඟාවට දෙපැත්තෙන් වූ විවිධ පෙදෙස්වල රැඳී සිටි චීන රතු හමුදාවේ ගරිල්ලා හට සේනාංක චීන ජාතික විප්ලවකාරී හමුදාවේ අළුත් සිව්වැනි හමුදාව යනුවෙන් නම් කරන ලදී. පළමු කී හමුදාව චීනයෙහි උතුරු පෙරමුණේ සටනට ගිය අතර, දෙවන කී සේනාංකය

සටන් වැදුණේ මැද පෙරමුණෙහිය. වම්පෝආ යුධ ඇකඩමියේ සහ උතුරු ප්‍රහාරය සමයෙහි ජාතික විප්ලවකාරී හමුදාවෙහි පැවැති ප්‍රජාතන්ත්‍රවාදී උරුව රකිමින් හා වඩමින් හැඩගැසුණු චීන රතු හමුදාව සිවිල් යුද්ධයේ එක් වකවානුවකදී ලක්ෂ කිහිපයක හට සංඛ්‍යාවකින් යුත් හමුදාවක් බවට දියුණු විය. එහෙත් කුඕමින්තාන් ආණ්ඩුව විසින් අපේ දකුණු දිග කඳවුරු පෙදෙස්වල කරන ලද දයාවිරහිත විනාශයේ ප්‍රතිඵලයක් වශයෙන්ද ජපන් විරෝධී ප්‍රතිප්‍රහාරක යුද්ධය ආරම්භයේදී චීන රතු හමුදාව දහස් ගණනාවක් දක්වා පහත බැස තිබිණි. මේ නිසා මේ හමුදාවේ ශක්තිය ගැන සුළු කොට තැකූ අයද වූහ. ජපානයට විරුද්ධව කෙරෙන ප්‍රතිප්‍රහාරක යුද්ධයේදී බලාපොරොත්තු තැබිය යුත්තේ කුඕමින්තානය මත බව ඔව්හු විශ්වාස කළහ. එහෙත් දක්ෂතම විනිසකරුවන් මහජනතාවය. අටවැනි මාර්ග හමුදාව සහ අළුත් සිව්වැනි හමුදාව එවකට සංඛ්‍යාව අතින් සුළු වුවද තත්වය අතින් ඉහළ මට්ටමක පැවති බවත් නියම ජනතා යුද්ධයක් කිරීමට ශක්තිය ඇත්තේ ඔවුනට පමණක් බවත්, ජපන් විරෝධී පෙරමුණු කරා ළඟාවී එහි පුළුල් ජනතාව සමග එක්වූ පසු ඔවුනට සීමාරහිත ඉඩකඩ පැදෙන බවත් මහජනයා දත්හ. මහජනයා නිවැරදිය. දැන් මා, මේ වාර්තාව ඉදිරිපත් කරන මොහොතේ අප හමුදාව භටයන් 9,10,000 දක්වා ඉහළ නැඟ තිබේ. සාමාන්‍ය නිෂ්පාදන කටයුතු වලින් ඈත් නොකොට තබා සිටින අපේ ග්‍රාමීය බලකායෙහි ශක්තිය 2,200,000 දක්වා ඉහල නැඟ ඇත. අපේ නිත්‍ය හමුදාවේ සංඛ්‍යා බලය කුඕමින්තාන් හමුදාවේ සංඛ්‍යා බලයට වඩා අඩුවුවත් අප හමුදාව චීනයේ ප්‍රතිප්‍රහාරක යුද්ධයේ ප්‍රධාන බලවේගය බවට පත්වී තිබේ. අප හමුදාව මුහුණ දෙන ජපන් හමුදාවල සහ රූකඩ හමුදාවල සංඛ්‍යාව දෙස බලන විටත්, අප හමුදාවෙහි සටන් පෙරමුණුවල ප්‍රමාණය දෙස බලන විටත්, එහි සටන් සාර්ථකත්වය දෙස බලන විටත්, යුද කටයුතුවලදී ඊට ලැබෙන සහාය දෙස බලන විටත්, එහි දේශපාලන තත්වය ඒකාග්‍රතාවය දෙස හා සමගිය දෙස බලන විටත්, පෙර සඳහන් නිගමනයට බැසිය යුතුව තිබේ.

මේ හමුදාව බලගතුව සිටින්නේ එහි සියළුම සාමාජිකයනට දේශපාලන අවබෝධය මත පදනම් වූ විනයක් තිබෙන නිසාය.

LIBERATIONBASE

ඔවුන් එක්රැස්වී සටන් කරන්නේ පුද්ගලයන් අතළොස්සකගේ හෝ පටු කල්ලියකගේ පෞද්ගලික යහපත සඳහා නොවේ. ඔවුන් සටන් කරන්නේ පුළුල් ජනතාවගේ සහ මුළු මහත් ජාතියේ සුබ සෙත සඳහාය. මේ හමුදාවේ එකම කාර්යය වනුයේ චීන ජනතාව සමග අවලව සිටිමින් ඔවුනට මුළු හදවතින් සේවය කිරීමය.

මේ කාර්යය විසින් මඟ පෙන්වනු ලබන චීන රතු හමුදාවට අප්‍රතිහත ධෛර්යයක් ඇත්තේය. මේ හමුදාව සියළු සතුරන් පරාජය කිරීමටත් කිසිදක යටත් නොවීමටත් අදිටන් කරගෙන සිටී. කරදර හා කම්කටොළු කුමක් වුවද අන්තිමේ එක හටයෙක් ඉතුරු වුණත් ඔහුද සටන් කරනු ඇත.

මේ කාර්යය විසින් මඟ පෙන්වනු ලබන මේ හමුදාව ස්වකීය හටයන් අතරත් ස්වකීය හටයන් හා පිටස්තර ජනතාව සමගත් පුදුමාකාර සමගියක් ගොඩ නඟා ගෙන තිබේ. අභ්‍යන්තරික වශයෙන් නිලධාරීන් හා හටයන් අතරද ඉහළ නිල දරනවුන් හා පහළ නිල දරනවුන් අතරද යුද කටයුතු, දේශපාලන කටයුතු හා පසුබිමෙහි කෙරෙන කටයුතු අතරද ඒකාග්‍රතාවයක් පවතී. බාහිර වශයෙන් හමුදාව හා ජනතාව අතරත්, හමුදාව හා ආණ්ඩු සංස්ථාවන් අතරත්, අප හමුද හා මිත්‍ර හමුද අතරත් ඒකාග්‍රතාවයක් පවතී. මේ ඒකාග්‍රතාවයට සම්බාධකව පවත්නා ඕනෑම දෙයක් අභිභවාලීම අනිවාර්යයෙන්ම කළ යුත්තකි.

මේ කාර්යය විසින් මඟ පෙන්වනු ලබන මේ හමුදාව සතුව, සතුරු නිලධාරීන් හා සතුරු හටයන් තමන් වෙත දිනාගැනීමේ සහ යුද සිරකරුවන් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ නිවැරදි පිළිවෙතක් ඇත්තේය. යටත්වන සියළු සතුරු හමුදාවල හටයන් අපේ පැත්තට එන හෝ ආයුධ බිම තබා පොදු සතුරාට විරුද්ධව සටන් කිරීමට කැමති වන අය සාදරයෙන් පිළිගෙන ඔවුනට නියම් අධ්‍යාපනයක් සපයනු ලැබේ. කිසිම යුද සිරකරුවකු මරා දැමීම හෝ ඔහුට නරක ලෙස සැලකීම හෝ පරිභව කිරීම තහනම්ය.

මේ කාර්යය විසින් මඟ පෙන්වනු ලබන මේ හමුදාව ජනතා යුද්ධයට අවශ්‍ය උපක්‍රම හා උපා මාලාවක් සකස් කරගෙන තිබේ.

මේ හමුදාව වෙනස් වන යථා තත්වයනට අනුකූලව සුබනම්‍ය කැලෑ සටන්වල යෙදීමට මෙන්ම ජංගම යුධයේ යෙදීමටද සමත් ය.

මේ කාර්යය විසින් මඟ පෙන්වනු ලබන මේ හමුදාව ජනතා යුද්ධයට අවශ්‍ය දේශපාලන ක්‍රියාපටිපාටියක් ගොඩනගා තිබේ. එහි අරමුණ වනුයේ තමන් අතර මෙන්ම තමන් හා මිත්‍ර හමුද අතරත්, තමන් හා ජනතාව අතරත් සමගිය තහවුරු කිරීමයි. ඒ වගේම සතුරු හමුද කැබලි කොට දමා සටනේදී ජය සහතික කර ගැනීමයි.

මේ කාර්යය විසින් මග පෙන්වනු ලබන මුළු මහත් හමුදාව කැලෑ සටන්වල යෙදෙන තත්වයන් යටතේ ක්‍රියා කරන ගමන් සටන් අතර පවත්නා විවේක කාලය සහ අභ්‍යාස පවත්නා වකවානු අතර ඇති විවේක කාලය ධාන්‍ය හා අනිකුත් අවශ්‍යතාවයන් නිපදවනු සඳහා යොද ගැනීමට සමත්ය. ඇත්ත වශයෙන්ම හමුදාව විසින් ස්වකීය විවේක කාලය ඒ කටයුතු සඳහා යොදවා තිබේ. මෙසේ කිරීමෙන් හමුදාවට සම්පූර්ණයෙන් හෝ අඩ වශයෙන් හෝ ස්වයංපෝෂිත විය හැක. මේ ආකාරයෙන් ආර්ථික කරදර වලින් මිදී ජීවන තත්වය දියුණු කරගෙන ජනතාවගේ කර පිට පැටවී ඇති බර අඩු කිරීමට හැකිවේ. විවිධ යුද කඳවුරු පෙදෙස්වල කුඩා ආයුධ නිෂ්පාදනාගාර ගණනාවක් ඇති කිරීමට තිබුණු සෑම ඉඩකඩකින්ම ප්‍රයෝජන ගෙන තිබේ.

තවද මේ හමුදාව බලසම්පන්න වී තිබෙන්නේ ඒ සමග සහයෝගයෙන් සටන් කරනු සඳහා ජනතාවගේ ආත්මාරක්ෂක බලකාය හා මිලීෂියා බලකායක්–එනම් ආයුධ සන්නද්ධ යෝධ ජනතා සංවිධාන ඇති නිසාය. චීනයෙහි විමුක්ති ප්‍රදේශවල බාල මහළු ස්ත්‍රී – පුරුෂ සෑම දෙනා ජපන් විරෝධී මහජන ආත්මාරක්ෂක බලකායන් තුළ සංවිධානය වී සිටිත්. ඔවුන් ඒවාට බැඳී සිටින්නේ ස්වේච්ඡාවෙනි. ජනසම්මතවාදී පදනමක් උඩය. මේ බලකායට බැඳී සිටියත් ඔවුන් නිෂ්පාදන කටයුතු අත්හිටවා නැත. ආත්මාරක්ෂක බලකායේ යොදය බඳු කොටස-හමුදාවට හෝ කැලෑ සටන් සේනාංක වලට බැඳෙන අය හැර–මිලීෂියා හමුදාවට ඇතුළු කරනු ලැබේ. ජනතාවගේ මේ ආයුධ සන්නද්ධ බලවේග වල සහයෝගය නොමැතිව සතුරා පරාජය කළ නොහැක.

LIBERATIONBASE

අන්තිම වශයෙන් කිවයුත්තේ මේ හමුදව බලසම්පන්නව සිටින්නේ එය කොටස් දෙකකින් සමන්විත වන නිසා බවයි. එනම්, ප්‍රධාන හමුදවන් සහ ප්‍රාදේශීය හමුදවන්ය. ප්‍රධාන හමුදවෝ ඕනෑම අවස්ථාවක ඕනෑම පළාතක සටන් කිරීමට සූදනමින් සිටිත්. ප්‍රාදේශීය හමුදවෝ ඔවුන් වෙසෙන ඒ ඒ පළාත් ආරක්‍ෂා කිරීමට හා ප්‍රාදේශීය මිලිෂියා හමුදංකය සහ ආත්මාරක්‍ෂක හමුදංකය සමග එක්වී සතුරාට පහර දීමට බැඳී සිටිත්. මේ ශ්‍රම විභජනයට ජනතාවගේ සම්පූර්ණ සහයෝගය ලැබී ඇත. මේ නිවැරදි ශ්‍රම විභජනය නොතිබෙන්නට–නිදසුනක් දක්වතොත් ප්‍රධාන හමුදවල වැඩ කටයුතු කෙරෙහි පමණක් සැලකිල්ලක් දක්වන අතර ප්‍රාදේශීය හමුද නොසළකා හැරියොත්–චීනයේ විමුක්ති පෙදෙස්වල පවත්නා තත්වයන් යටතේ සතුරා පරාජය කිරීම අසීරු වන්නේය. ප්‍රාදේශීය හමුදවන් යටතේ නොයෙක් ආයුධ සන්නද්ධ කම්කරු කණ්ඩායම් සංවිධානය කර තිබේ. ඔවුන් මනාසේ පුහුණු කොට තිබෙන නිසා යුද කටයුතු දේශපාලන කටයුතු හා මහජන කටයුතුවල යෙදීමට වඩාත් සුදුසු වේ. සතුරු හමුදවලට යටත් වී ඇති ප්‍රදේශ ඇතුළට කාවදින ඔවුහු එහිදී සතුරාට පහරදී ජපන් විරෝධී අරගලයෙහි නිරතවන පරිදි ජනතාව පුබුදුවාලති. මෙසේ කිරීම විවිධ විමුක්ති පෙදෙස්වල යුද පෙරමුණෙහි කෙරෙන සංග්‍රාමීය කටයුතු වලට රුකුලක් වේ. මේ සියළු කටයුතු වලින් ඔවුන් ඉතා සාර්ථක ප්‍රතිඵල ලබා තිබේ.

LIBERATIONBASE

ස්වකීය ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවල නායකත්වය යටතේ චීනයේ විමුක්ති පෙදෙස්වල සියළු ජපන් විරෝධී ජනතාවට ආයාචනයක් කරනු ලැබේ. ඒ ආයාචනය නම් ආයුධ සන්නද්ධ හමුදවලට සහාය වනු පිණිස විවිධ කාර්‍යයන් ඉටු කරන කම්කරු සංවිධාන, ගොවි සංවිධාන, තරුණ සංවිධාන, කාන්තා සංවිධාන, සංස්කෘතික සංවිධාන, උසස් වෘත්තිවල සංවිධාන ආදියට බැඳෙන ලෙසය. මේ සංවිධාන මගින් කෙරෙන වැඩ කටයුතු හමුදවට බැඳෙන ලෙස ජනතාව පෙළඹවීමට හෝ ධාන්‍ය එහා මෙහා ගෙන යාමට හෝ හටයන්ගේ දරු පවුල් රැක බලාගැනීමට හෝ ස්වකීය ද්‍රව්‍යමය අවශ්‍යතාවයන් පිරිමසා ගනු සඳහා හමුදවට උපකාරී වීමට හෝ පමණක් සීමා වී නැත. දිගට හර

හට සතුරාට පහර දෙනු සඳහාත්, සතුරාට අනතුරු කරනු පිණිස පොළොව යට වෙඩි වළලනු සඳහාත්, සතුරා පිළිබඳ තොරතුරු ලබා ගනු සඳහාත්, ද්‍රෝහීන් සහ ඔත්තු කරුවන් අල්ලා ගනු සඳහාත්, තුවාල කරුවන් එහා මෙහා ගෙන යාම සහ රැක ගැනීම සඳහාත්, හමුදවේ වැඩකටයුතු වලට කෙළින්ම සහභාගි වනු සඳහාත් කැලෑ හට සේනාංක වලට, මිලිෂියා බලකායනට අවශ්‍ය බඩුබාහිරාදිය හා ආධාර සැපයීමද ඒ වැඩ කටයුතු වලට ඇතුළත්ය. ඒ එක්කම සියළු විමුක්ති ප්‍රදේශවල ජනතාව විවිධාකාර දේශපාලන, ආර්ථික, සංස්කෘතික හා සෞඛ්‍යය කටයුතුවල උද්යෝගයෙන් නියැලී සිටිත්. මේ සම්බන්ධයෙන් ඉතාම වැදගත් කටයුත්තක් වනුයේ ධාන්‍ය සහ අනිකුත් අවශ්‍ය දේවල් නිපදවනු සඳහා ජනතාව උනන්දු කිරීමත් හමුදවේ සහ ජනතාවගේ ස්වයංපෝෂණ වැඩ සටහනේ අඩුපාඩු ඇතොත් ඒවා පිරිමැසෙන පරිදි විවේක සමය නිෂ්පාදන කටයුතු සඳහා යොදවනසේ සියළු ආණ්ඩු ආයතන සහ පාසැල් පෙළඹවීමත්ය. මෙසේ කටයුතු කරන විට දිගුකල් පවත්නා ප්‍රතිප්‍රහාරක යුද්ධය නඩත්තු කරනු සඳහා නිෂ්පාදන කටයුතු බොහෝ සේ ඉහළ නැංවිය හැකි වන්නේය. චීනයේ විමුක්ති පෙදෙස්වල සතුරා විසින් කර තිබෙන විනාශය අතිවිශාලය. එමෙන්ම ගංවතුරු නිසා උවදුරු සහ කෘමි වසංගත නිසා සිදුවී ඇති පාඩුවද අතිවිශාලය. කෙසේ වුවද එම ප්‍රදේශවල පවත්නා මේ කරදරකාරී තත්වයෙන් සංවිධානාත්මක ලෙසින් ගොඩ එනු පිණිස ඒ ප්‍රදේශවල ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු විසින් ජනතාවට මහ පෙන්වා තිබේ. කෘමීන් විනාශ කිරීම ගංවතුර මැඩලීම සහ සහනාධාර සැළසීම පිණිස ගෙන යන විශාල ජනතා ව්‍යාපාර මගින් අපූරුව ජනක ප්‍රතිඵල ලැබී තිබේ. මේ හේතුකොටගෙන දිගුකල් පවත්නා ප්‍රතිප්‍රහාරක යුද්ධය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය තොග රැකගත හැකිව තිබේ. කොටින් කියතොත් සියල්ල යුද පෙරමුණ සඳහා කැප කරනු, සියල්ල ජපන් ආක්‍රමණිකයන් පරාජය කරනු සඳහා කැප කරනු, සියල්ල චීන ජනතාව මුදගනු සඳහා කැප කරනු යනු පොදු සටන් පාඨය වී තිබේ. මුළු යුද හමුදව සහ චීනයේ විමුක්ති ප්‍රදේශවල මුළු ජනතාව වෙනුවෙන් පවත්නා පොදු පිළිවෙත වී තිබේ.

නියම ජනතා යුද්ධයක හැටි ඔන්න ඔබදුය. ජාතියේ සතුරා පරාජය කළ හැක්කේ මෙබඳු යුද්ධයක් මගින් පමණි. කුඕමින්තාන ජාතියේ සතුරා පරාජය කිරීමට අසමත් වී ඇත්තේ ඔවුන් ජනතා යුද්ධයට බිහිසුණු ලෙස විරුද්ධ වන හෙයිනි.

නූතන අවි ආයුධ වලින් සන්නද්ධ වූ පසු චීනයේ විමුක්ති ප්‍රදේශවල හමුදව තව තවත් බලසම්පන්න වනු ඇත. එමෙන් ජපන් ආක්‍රමණිකයන් අවසාන වශයෙන් පරාජය කිරීමට සමත් වනු ඇත.

සටන් පෙරමුණු දෙක:

ආරම්භයේ පටන්ම චීනයේ ප්‍රතිප්‍රහාරක යුද්ධයට පෙරමුණු දෙකක් තිබුණි. කුඕමින්තාන් පෙරමුණ හා විමුක්ති පෙදෙස් වල පෙරමුණය.

1937 ඔක්තෝබරයේදී වුහානය ඇද වැටීමෙන් පසු ජපන් ආක්‍රමණිකයෝ කුඕමින්තාන් පෙරමුණට විරුද්ධව ගෙන ගිය උපක්‍රමික ප්‍රහාරය නවතා තමන්ගේ ප්‍රධාන හමුදවන් විමුක්ති පෙදෙස්වල පෙරමුණ කරා ක්‍රමක්‍රමයෙන් මෙහෙය වූහ. මේ එක්කම කුඕමින්තාන් ආණ්ඩුවේ පරාජිත හැඟීම් සවකීය වාසියට පෙරළා ගත් ජපන් ආක්‍රමණිකයෝ ඔවුනට වාසිවන අන්ද මේ සාමයකට එළඹීමට කැමති බව පළ කළහ. චීන ජනතාව මුළා කරනු සඳහා ඔවුන් කළේ චුන්කිනයෙන් ඉවත්වී ගොස් නැන්කිනයෙහි රූකඩ ආණ්ඩුවක් පිහිටුවීමට වාන්චින්වෙයි ද්‍රෝහියා පෙළඹවීමය. අනතුරුව කුඕමින්තාන් ආණ්ඩුව සවකීය ප්‍රතිපත්තිය වෙනස් කිරීමට පටන් ගත්තේය. ජපානයට විරුද්ධව ප්‍රතිප්‍රහාරයෙහි යෙදීමට වඩා ඔවුන් උනන්දු වූයේ කොමියුනිස්ට් පක්ෂයට හා ජනතාවට විරුද්ධ වීමටය. මේ වෙනස මුලින්ම දක්නට ලැබුණේ සංග්‍රාමය අංශයෙහිය. තමන්ගේ යුධ ශක්තිය එලෙසින්ම රැකගනු සඳහා කුඕමින්තාන් ආණ්ඩුව කළේ ජපානයට අකර්මන්‍ය විරෝධය පෑමේ පිළිවෙතක් අනුගමනය කරන ගමන් මුළු වෙර යොද විමුක්ති ප්‍රදේශවලට පහර දෙන පරිදි ජපන් ආක්‍රමණිකයනට ඉඩකඩ සළසමින් සටන් කිරීමේ බර පොදිය විමුක්ති ප්‍රදේශවල සටන් පෙරමුණේ හිසමත පැටවීමය. මේ

අවස්ථාවේ ඔවුන් කළේ "කොටියන් දබර කරගනු බලමින් කඳු මුදුනට වී සිටීමය."

"විදේශීය පක්ෂවල වැඩ කටයුතු සීමාකිරීමේ පියවර" යනු වෙන් 1939 දී ප්‍රතිගාමී පියවරක් ගත් කුඕමින්තාන් ආණ්ඩුව ජනතාව හා ජපන් විරෝධී පක්ෂ ප්‍රතිප්‍රහාරක යුද්ධයේ මුල් වකවානුවේදී දිනාගත් සියළු අයිතිවාසිකම් එමගින් ඔවුනට අහිමි කළේය. එවක් පටන් කුඕමින්තාන් පෙදෙස්වල පැවති චීන කොමියුනිස්ට් පක්ෂය ඇතුළු සියළු ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ කුඕමින්තාන් ආණ්ඩුව විසින් මර්දනය කර තිබේ. එම ප්‍රදේශවල සෑම ප්‍රාන්තයක හිර කඳවුරු සහ වධ කඳවුරු පිරී ඇත්තේ කොමියුනිස්ට් වාදීන්ගෙන්, තරුණ දේශප්‍රේමීන්ගෙන් හා ප්‍රජාතන්ත්‍රවාදය සඳහා සටන් කරන සෙස්සන්ගෙනි. ජාතික සමගිය කඩාකප්පල් කරනු සඳහා 1939 පටන් 1943 ශරත් සෘතුව දක්වාවූ පස් අවුරුද්ද තුළදී විශාල කොමියුනිස්ට් විරෝධී ප්‍රහාරයන් තුනක් කුඕමින්තාන් ආණ්ඩුව විසින් එල්ල කරන ලදී. මේ නිසා සිවිල් යුද්ධයක් ඇතිවීමේ බරපතල අන්තරායක් මතුවිය. අළුත් සිව්වෙනි හමුදව විසුරුවා ලීමට අණදෙන උද්දේ මේ වකවානුවෙහිදීය. දකුණු ආන්වෙයිහි සිටි මේ හමුදවේ නම දහසකට අධික භට සංඛ්‍යාවක් අමු අමුවේ සමූලඝාතනය කරන ලදී. මෙය ලෝකය කම්පා කළ සිද්ධියක් විය. කුඕමින්තාන් හමුද විසින් විමුක්ති ප්‍රදේශවල හමුදවනට පහරදීම නවතා නැත. අනාගතයේදී නවතන බවට ලකුණක්ද නැත. මේ එක්කම කුඕමින්තාන් ප්‍රතිගාමියෝ නොයෙක් විදියේ මුසාවාද සහ අවලාද පතුරන්නට වූහ. කොමියුනිස්ට් පක්ෂයට, අටවැනි හා සිව්වැනි හමුදවලට, විමුක්ති ප්‍රදේශ වලට මඩ ගසනු සඳහා "ද්‍රෝහී පක්ෂය" "ද්‍රෝහී හමුදව" "ද්‍රෝහී ප්‍රදේශ" සහ "ප්‍රතිප්‍රහාරක යුද්ධය කඩාකප්පල් කිරීමක්" "රාජ්‍යය අනතුරේ හෙළීමක්" ආදි පාඨ නිමවන ලද්දේ ඔවුන් විසිනි. මේ අර්බුදයට මුහුණ දෙනු සඳහා 1939 ජූලි 7 ද රැස්වූ චීන කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරක සභාව පහත සඳහන් සටන් පාඨ අඩංගු ප්‍රකාශනයක් නිකුත් කළහ: "නොකඩවා ප්‍රතිප්‍රහාරය කර ගත යනු, යටත් වීමකට විරුද්ධ වනු, සමගිය රැකීමට නොකඩා ක්‍රියා කරනු, භේදයකට විරුඬ වනු, ප්‍රගතිය සඳහා නොකඩවා ක්‍රියා කරනු, අපගමනයට විරුද්ධවනු," මේ

LIBERATIONBASE

අවුරුදු පහ තුළදී මෙකී කාලෝචිත සටන් පාය අනුව ක්‍රියා කරමින් ප්‍රතිගාමීන් ජනතා විරෝධී, කොමියුනිස්ට් විරෝධී ප්‍රහාර තුන මෙල්ල කිරීමට ප්‍රාණවත්ව ක්‍රියා කළ අප පක්‍ෂය ඒ සැම අවස්ථාවකදීම අර්බුදයෙන් ගොඩ ආවේය.

ඇත්ත වශයෙන් ඒ අවුරුදු කිහිපය තුළදී කුඕමින්තාන් පෙරමුණෙහි දරුණු සටන් පැවතුණේ නැත. ජපන් ආක්‍රමණයේ දරුණුම ප්‍රහාරය ප්‍රධාන වශයෙන් එල්ල වූයේ විමුක්ති ප්‍රදේශ වලට විරුද්ධවය. 1943 වනවිට විමුක්ති ප්‍රදේශවල හමුදව සහ ජනතාව චීනයේ ජපන් හමුදවලින් 64% කටත් රුකඩ හමුද වලින් 95% කටත් පහර දුන් අතර කුඕමින්තාන් පෙරමුණ මුහුණ දුන්නේ ජපන් හමුද වලින් 36% කටත් රුකඩ හමුද වලින් 5% කටත් පමණි.

1944 දී චීනයේ උතුරු-දකුණු ප්‍රධාන දුම්රිය මාර්ග අල්ලා ගනු සඳහා ප්‍රහාරයක් එල්ල කළහ. බියට පත් කුඕමින්තාන් හමුදවෝ ඔවුනට ප්‍රතිප්‍රහාරයන් එල්ල කිරීමට කිසිසේත් සමත් නොවූහ. මාස කිහිපයක් තුළදී හෝනාන්, හුනාන්, ක්වාන්සි සහ ක්වාන්තුන් ප්‍රාන්තවල විශාල පෙදෙස් සතුරා අතට පත්වුණි. පෙරමුණු දෙකෙහි සටන් වැදී සිටින සතුරු හමුදවල අනුපාත යෙහි වෙනසක් සිදුවූයේ මෙයින් පසු පමණි. එසේ වුවද මේ වාර්තාව ඉදිරිපත් කරන මොහොතෙහි පවා චීනයට කඩාවැදී සිටින සොල්දදුවන් 5,80,000 කින් සමන්විත ජපන් සේනාංක 40 න් (මීට නිරිත දිග පළාත් තුනෙහි සිටින ජපන් හමුද අඩංගු නැත.) හටයන් 3,20,000 ක් ඇතුළත් සේනාංක 22½ක්ම එනම් මුළු ජපන් හට සංඛ්‍යාවෙන් 56% ක් සටන් කරන්නේ විමුක්ති ප්‍රදේශවල පෙරමුණෙහිය. හටයන් 2,60,000 කින් සමන්විත ජපන් සේනාංක 17½ කට-එනම් 44% ක්-සටන් කරන්නේ කුඕමින්තාන් පෙරමුණෙහිය. පෙරමුණු දෙකෙහි සටන් කරන රුකඩ හමුදවල අනුපාතයෙහි කිසිදු වෙනසක් සිදුවී නොමැත.

පෙන්වා දිය යුතු තවත් කරුණක් නම් හටයන් 8,00,000කට අධික රුකඩ හමුද ප්‍රධාන වශයෙන් සමන්විත වී තිබෙන්නේ ඔවුන්ගේ කුඕමින්තාන් අණදෙන නිලධාරින්ගේ නියෝග උඩ යටත්වූ සේනාංක වලින් හෝ යටත් වීමෙන් පසු කුඕමින්තාන්

නිලධාරීන් විසින් සංවිධාන කරන ලද සේනාංක වලිනි. කුඕ-මින්තාන් ප්‍රතිගාමීන් විසින් මෙ රුකඩ හමුදවලට කල් තබාම වැරදි සහගතවූද දේශද්‍රෝහී වූද න්‍යායක් සපයා තිබුණි. එනම් "වක් මාවතක් ඔස්සේ ගොස් ජාතිය බේරා ගැනීමේ" න්‍යායයි. තවද කුඕමින්තාන් ප්‍රතිගාමීන් විසින් මේ රුකඩ හමුද යටත් වූද පටන් ඔවුනට මානසික හා සංවිධානාත්මක ආධාර සපයා ජපන් ආක්‍රමණිකයන් සමග සහයෝගීව චීන ජනතාවගේ විමුක්ති ප්‍රදේශවලට පහර දෙන ලෙස ඔවුන් මෙහෙයවා තිබේ. ශෙන්සි-කාන්සු-නින්සියා සීමා ප්‍රදේශය හා අනෙකුත් විමුක්ති ප්‍රදේශ යන් වටකොට ඒවාට පහර දෙනු සඳහා හටයන් 7,97,000 කට නොඅඩු විශාල හමුදවක් ප්‍රතිගාමීන් විසින් යොදවා තිබේ. කුඕ-මින්තාන් ආණ්ඩුවේ පුවත් යටපත් කිරීමේ පිළිවෙත අනුව මේ භයානක තත්වය බොහෝ චීනුන්ට හා විදෙස්සනට රහසක් ලෙසින් තබා ගෙන සිටිත්.

LIBERATIONBASE

චීනයේ විමුක්ති ප්‍රදේශ:

කොමියුනිස්ට් පක්‍ෂයේ නායකත්වය යටතේ පවත්නා චීන යේ විමුක්ති ප්‍රදේශවල දැනට වෙසෙන ජනගහණය 9,55,00,000 ක් පමණ වෙති. උතුරින්, ඇතුළු මොන්ගෝලියාවේ පටන් දකුණෙන් හයිනාන් දූපත දක්වා විමුක්ති ප්‍රදේශ පැතිරී තිබේ. සතුරා කොහේ ගියත් එතැනදී ඔවුනට එක්කෝ අටවෙනි මාර්ග හමුදව නැත්නම් අළුත් සිව්වැනි හමුදව ඒත් නැත්නම් වෙන යම් මහජන හමුදවක් මුණ ගැසේ. මුදගත් මේ අතිවිශාල භූමි ප්‍රදේශය ප්‍රධාන විමුක්ති ප්‍රදේශ 19 කින් යුක්ත වේ. ඊට ලියාමිනින්, ජේහොල්, චහාර්, සුයියුආන්, ශෙන්සි, කාන්සු, නින්සියා, ශාන්සි, හෝපෙයි, හෝනාන්, ශාන්ටුන්, කියාන්සු, චෙකියාන්, ආන්වෙයි, කියාන්සි, හූපේ, හුනාන්, ක්වන්ටුන් සහ පූකියේන් යන ප්‍රාන්ත වලින් ලොකු කුඩා කොටස් ඇතුළත්ය. මේ සියළු විමුක්ති ප්‍රදේශවලට මහ පෙන්වන මධ්‍යස්ථානය යේනානයයි. කහ ගඟට බටහිරින් පිහිටා ඇති 16,00,000 ක ජනගහණයකින් සමන්විත ශෙන්සි-කාන්සු-නින්සියා සීමා ප්‍රදේශය චීනයේ මෙ විශාල විමුක්ති ප්‍රදේශයට ඇතුළත් පළාත් 19 න් එකක් පමණි. නැගෙනහිර චෙකියානයෙහි සහ හයිනාන් දූපතෙහි පිහිටි විමුක්ති ප්‍රදේශය

අඩුම ජනගහණයෙන් යුත් විමුක්ති ප්‍රදේශයයි. මේ ගැන නොදන්නා සමහරු සිතන්නේ චීනයෙහි විමුක්තිය ලත් ප්‍රදේශයෙන් වැඩි කොටස වනුයේ ශෙන්සි–කාන්සු–නින්සියා සීමා ප්‍රදේශයෙන් බවයි. මේ වැරදි මතය ඇති වන්නේ කුඕමින්තාන් ආණ්ඩුව විසින් කර තිබෙන වටලෑමේ හේතුවෙනි. ඒ සියළු විමුක්ති ප්‍රදේශ ජපන් විරෝධී ජාතික එක්සත් පෙරමුණේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කර තිබේ. මේ ප්‍රදේශ පාලනය වනුයේ මහජනයා විසින් තෝරා පත් කර ගත් ප්‍රාදේශීය සභාග ආණ්ඩු මගිනි. දැනට එබඳු ආණ්ඩු පිහිටුවා නැති පෙදෙස්වල ඒවා පිහිටුවා ගෙන යනු ලැබේ. මේ ආණ්ඩු සැදී ඇත්තේ කොමියුනිස්ට්වාදීන්ගෙන් අතිකුත් ජපන් විරෝධී පක්ෂවල නියෝජිතයන්ගෙන් හා කිසිම පක්ෂයකට අසම්බන්ධ අයගෙනි. විමුක්ති ප්‍රදේශවල ජනතාවගේ මුළු මහත් ශක්තිය පණ පොවා තිබේ. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් සතුරාගේ දැඩි බලය අබිමුවෙහි කුඕමින්තානයෙහි හමුදු වටලෑම හා ප්‍රහාරයන් අබිමුවෙහි–බාහිර ආධාර කිසිවක් නොමැති තත්වයක් යටතෙහි චීනයේ විමුක්ති ප්‍රදේශ වලට නොසැලී සිටීමටත් නොබා වර්ධනය වීමටත් සතුරු භූමි ප්‍රදේශය අඩු කරන ගමන් තමන් සතු ප්‍රදේශය පුළුල් කර ගැනීමටත් හැකිවී තිබේ. විමුක්ති ප්‍රදේශ ප්‍රජාතන්ත්‍රවාදී චීනයක ආකෘතිය බවට පත්වී ඇත. මිත්‍ර රටවල් සමග යුද්ධමය සහයෝගයක් ඇති කර ගෙන ජපන් ආක්‍රමණිකයන් පළවා හැරීමටත් චීනජනතාව මුදගනු සඳහාත් ඇත්තාවූ ප්‍රධාන බලවේගය විමුක්ති ප්‍රදේශයන්ය. චීනයේ විමුක්ති ප්‍රදේශවල අටවැනි මාර්ග හමුදුව අළුත් සිව්වැනි හමුදුව සහ අනෙකුත් මහජන හමුද විසින් ජපනාට විරුද්ධව සටන් කිරීම අතින් වීරෝදර ආදර්ශයක් පා තිබීම හැරුණු විට ජපන් විරෝධී ජාතික එක්සත් පෙරමුණේ ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම අතින්ද ආදශියක් පා තිබේ. ''අද චීනයට අවශ්‍යදේ වන ආචාර්ය සුන් යත් සෙන් ගේ ත්‍රිවිධ ජනතා ප්‍රතිපත්ති සහමුලින් ක්‍රියාත්මක කරනු සඳහා වෙහෙස වීමට අප පක්ෂය සූදානම්ය,''යි සහතික කරමින් චීන කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරක සභාව 1937 සැප්තැම්බර් 22 වෙනිද නිකුත් කළ ප්‍රකාශනය චීනයේ විමුක්ති ප්‍රදේශ තුළ සහමුලින් ක්‍රියාවට නඟා තිබේ.

කුඕමින්තාන් ප්‍රදේශ:

ඒකාධිපති පාලනයෙහි දැඩි ලෙස එල්බ ගෙන සිටින කුඕමින්තානයේ ප්‍රධාන පාලකයන් කණ්ඩායම ජපානය සම්බන්ධයෙන් අනුගමනය කර ඇත්තේ අකර්මන්‍ය විරෝධය පෑමේ පිළිවෙතකුත් දේශීය වශයෙන් අනුගමනය කර ඇත්තේ ජනතා විරෝධී ප්‍රතිපත්තියකුත්ය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ඔවුන්ගේ යුද හමුදවල ප්‍රමාණය මුලින් පැවති ප්‍රමාණයට අඩකින් අඩුවී තිබේ. මේ හමුද වලින් බොහෝවක සටන් කෞශල්‍යය සහමුලින්ම පාහේ සිඳී ගොස්ය. කුඕමින්තාන් පාලකයන් කල්ලියත් පුළුල් ජනතාවත් අතර ඇත්තේ ගැඹුරු පරතරයකි. ජනතාව දුගී බවේ බරපතළ අර්බුදයකට මුහුණ පාමින් සිටිත්. මේ නොසන්සුන්තාවය හා කැරළි ගැසීම පැතිරෙමින් පවතී. මේ පාළකයන් කණ්ඩායම අතින් යුද්ධය සඳහා ඉටුවන කාර්යභාරය බෙහෙවින් අඩුවී තිබෙනවා පමණක් නොව චීන ජනතාවගේ සියළු ජපන් විරෝධී බලවේග පණපෙවීමට හා සමඟි කිරීමට ඔවුන් බාධාවක් වී තිබේ.

කුඕමින්තානයේ ප්‍රධාන පාළක පිරිසේ නායකත්වය යටතේ මෙබඳු බරපතළ තත්වයක් ඇතිවී තිබෙන්නේ මන්ද? මෙබඳු තත්වයක් ඇතිවී තිබෙන්නේ එම කණ්ඩායම චීනයේ මහ ඉඩම් හිමියන්ගේ, විශාල බැංකු හිමියන්ගේ සහ මහා කොම්ප්‍රදෝරු ධනපතියන්ගේ වුවමනා එපාකම් වෙනුවෙන් පෙනී සිටින පිරිසක් නිසාය. මේ ප්‍රතිගාමී කණ්ඩායමට අයත් මිනිසුන් අතලොස්ස කුඕමින්තාන් ආණ්ඩුව යටතේ පවත්නා සියළු වැදගත් යුද්ධමය, දේශපාලන, ආර්ථික හා සංස්කෘතික සංස්ථාවන් තමන්ගේ තනි අයිතිය යටතට ගෙන තිබේ. ඔවුහු තමන්ගේ ශුභසිද්ධිය ආරක්ෂා කර ගැනීම, ජපනාට විරුද්ධව ප්‍රතිප්‍රහාරය එල්ල කිරීමට වඩා අගය කරත්. ''සියල්ලට පළමු ජාතියේ ශුභ සිද්ධිය'' ගැන සැළකිය යුතු බව ඔවුන්ගේ මුවින්ද පැවසෙන නමුත් ඔවුන්ගේ ක්‍රියාවන් ජාතියේ විශාල වැඩි සංඛ්‍යාවකගේ වුවමනාවනට අනුකූල නැත. ''සියල්ලට පළමු රාජ්‍යය ආරක්ෂා කර ගත යුතුය''යි ඔවුන් ද කියා සිටින නමුත් ඔවුන් එය ආරක්ෂා කිරීමට අදහස් කරන්නේ ලොකු ඉඩම් හිමියන්ගේ විශාල බැංකු හිමියන්

LIBERATIONBASE

ගේ සහ මහා කොම්ප්‍රදෝරු ධනපතියන්ගේ රදළ-පැසිස්ට් ඒකාධිපත්‍යය මිස මහජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් නොවේ. එම නිසා ඔව්හු මහජනයා හිස එසවීම ගැන බියවෙති. ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරය ගැන බියවෙති. ජපානයට විරුද්ධව යුද්ධ කරනු සඳහා මහජනතාව සහමුලින් පණගැන්වීමට පැකිළෙති. ඔවුන් ජපානයට විරුද්ධව අකර්මන්‍ය විරෝධතා පිළිවෙතක් අනුගමනය කිරීමට මූලික හේතුවත් ජනතාවට ප්‍රජාතන්ත්‍රයට හා කොමියුනිස්ට් පක්ෂයට එරෙහිවූ ප්‍රතිගාමී දේශීය පිළිවෙතක් අනුගමනය කිරීමට මූලික හේතුවත් එය වේ. සෑම කරුණකදීම ඔවුන් අනුගමනය කරන්නේ දෙබිඩි පිළිවෙතකි. එක අතකින් ජපානයට ප්‍රතිප්‍රහාරය එල්ල කරන ඔවුන් අනෙක් අතින් අනුගමනය කරන්නේ අකර්මන්‍ය යුද පිළිවෙතකි. එපමණක් නොව ජපනුන් විසින් යටත් කර ගැනීමට නිතරම පොළඹවා ගනු ලබන්නේ ඔවුන්ය. චීනයේ ආර්ථිකය වර්ධනය කිරීමට ඔවුන් කථා කරන නමුත් ඇත්ත වශයෙන් ඔවුහු ස්වකීයම වූ නිලධාරි-ප්‍රාග් ධනය-එනම් මහ ඉඩම් හිමියන්ගේ බැංකු හිමියන්ගේ හා කොම්ප්‍රදෝරු ධනපතියන්ගේ ප්‍රාග් ධනය ගොඩ නඟත්. චීන ආර්ථිකයේ ජීවනාලීන් තනි අයිතියට යටත් කර ගෙන සිටිත්. අනුකම්පා විරහිතව ගොවි ජනතාව, කම්කරුවන් සුළු ධනපතියන් හා ඒකාධිකාරී ධනපතියන් පෙළත්. ''ප්‍රජාතන්ත්‍රය'' ''ක්‍රියාවට නැගීම'' ගැනත් ''රාජ්‍ය බලය ආපසු ජනතාවට පැවරීම'' ගැනත් ඔව්හු කථා කරති. එහෙත් ජනතාව ප්‍රජාතන්ත්‍රය දිනා ගැනීම සඳහා ගෙන යන ව්‍යාපාරය දයාවිරහිතව මැඩලන ඔව්හු ඉතා සරළ ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණයන් පවා ක්‍රියාත්මක කිරීම ප්‍රතික්ෂේප කරත්. ''කොමියුනිස්ට් ප්‍රශ්නය දේශපාලන ප්‍රශ්නයක් වන නිසා එය දේශපාලනයෙන්ම විසඳිය යුතුය,''යි කියා සිටින ඔවුන් ඒ වෙනුවට කරන්නේ නිරානුකම්පිකව චීන කොමියුනිස්ට් පක්ෂය යුද්ධමය දේශපාලන හා ආර්ථික වශයෙන් මැඩලීමයි. ''චීන කොමියුනිස්ට් පක්ෂය ''නොම්මර එකේ'' සතුරා ලෙසිනුත් ජපන් ආක්‍රමණිකයන් ''නොම්මර දෙකේ'' සතුරා ලෙසිනුත් සැලකීම ඔවුන්ගේ සිරිතය. දිවා රෑ දෙකේ ඔවුන් මහන්සි වන්නේ සිවිල් යුද්ධයක් ඇවිලවීමටත් කොමියුනිස්ට් පක්ෂය සමූලෝත්පාටනය කරනු සඳහා කුමන්ත්‍රණය කිරීමටත්ය. ''නවීන රාජ්‍යයක්', ගොඩනඟන්නෙමුයි ඔවුන් පවසන නමුත් ඔවුන් උමතු උත්සාහ

යකින් මහන්සි වන්නේ මහ ඉඩම් හිමියන්ගේ බැංකු හිමියන්ගේ හා කොම්ප්‍රදෝරු ධනපතියන්ගේ රදළ-පැසිස්ට් ආධිපත්‍යය රැකීමටය. ඔව්හු සෝවියට් දේශය සමග චාරිත්‍ර ප්‍රකාර තානාපති සබඳකම් පවත්වන නමුත් ඇත්ත වශයෙන්ම එරටට සතුරුව ක්‍රියා කරත්. පැසිස්ට් ජර්මනියේ ආයුෂ දික්කිරීමේ අටියෙන් ඔවුහු තනිකොට පහරදීමේ න්‍යාය ඉදිරිපත් කළ ඇමරිකානුන්ගේ ''යුරෝපයට කලින් ආසියාවය.'' යන පාඨය පිළිරුව නගන්නට වූහ. පැසිස්ට් ජර්මනියේ ආයුෂ දික්කිරීමෙහි තේරුම චීන ජනතාව මත පැසිස්ට් පාලනයක් පටවා ඇති ඔවුන් ඇතුළු සෑම තැනක වෙසෙන පැසිස්ට්වාදීන්ගේ ජීවිත කාලය දිග්ගැසෙන බවයි. ක්‍රියාවෙන් පැසිස්ට්වාදීන් වූවත් ඔවුහු පැසිස්ට් විරෝධී වීරයන් ලෙසින් වෙස්වළා ගෙන සිටිත්. මෙබඳු පරස්පර විරෝධී දෙබිඩි ප්‍රතිපත්තිවලට නිධානය වී ඇත්තේ මහ ඉඩම් හිමියන්ගේ බැංකු හිමියන්ගේ කොම්ප්‍රදෝරු ධනපතියන්ගේ සමාජ තට්ටුව බව ඒ ගැන සොයා බැලුවහොත් ඔබට පෙනී යනු ඇත.

කෙසේ වුවද කුඕමින්තානය ඒකමතිකත්වයකින් යුත් දේශපාලන පක්ෂයක් නොවේ. විශාල ඉඩම් හිමියන්ගේ බැංකු හිමියන්ගේ හා කොම්ප්‍රදෝරු ධනපතියන්ගේ සමාජ තට්ටුව නියෝජනය කරන ප්‍රතිගාමී කල්ලියක් විසින් මේ පක්ෂයේ බලය අල්ලා ගෙන සිටින නමුත් මුළු පක්ෂයම ඔවුන් හා සමානයයි නොසිතිය යුතුය. ඇතැම් කුඕමින්තාන් නායකයෝ මේ කල්ලියට අයත් නොවෙති. ඔවුනට පහර දෙනු ලැබේ. ඔවුන් කොන් කරනු ලැබේ. කුඕමින්තාන් පක්ෂයේ කාඩර්වරු සහ සාමාන්‍ය සාමාජිකයෝද ''ත්‍රිවිධ ජනතා ප්‍රතිපත්ති තරුණ සංගමයේ'' බොහෝ සාමාජිකයෝද නායකයන් කල්ලිය කෙරෙහි කලකිරී සිටිත්. ඇතැම්හු ඔවුනට විරුද්ධව ක්‍රියා කරත්. මේ ප්‍රතිගාමී කල්ලියේ පාලනයට හසුව පවත්නා සියළු කුඕමින්තාන් හමුදා වලත් ආණ්ඩු සංස්ථාවලත් ආර්ථික හා සංස්කෘතික ආයතනවලත් තත්වය ඊට නොදෙවෙනිය. මේ සියළු සංවිධාන තුළ ප්‍රජාතන්ත්‍රවාදී කොටස් සිටිත්. තවද එකිනෙකා සමග කුළල් කා ගන්නා ප්‍රතිගාමී කල්ලිය හොඳින් සමගි සම්පන්න පිරිසක් නොවේ. කුඕමින්තානය ඒකමතික අදහස් දරන ප්‍රතිගාමීන්ගේ සංවිධානයක් ලෙසින් සැලකීම වැරදිය.

LIBERATIONBASE

වෙනස

විමුක්ති ප්‍රදේශ හා කුඹමින්තාන් ප්‍රදේශ අතර පවත්නා බලගතු වෙනස චීන ජනතාවට පෙනේ.

කරුණු හොඳාකාරව පැහැදිලි නැද්ද ? මේ පළාත් දෙකෙහි පවත්නේ ක්‍රියාමාර්ග දෙකකි. එකක ජනතා යුද්ධයේ ක්‍රියාමාර්ග යයි. අනෙකෙහි අකර්මන්‍ය විරෝධය පෑමේ ක්‍රමයයි. -ජනතා යුද්ධයකට පටහැනිවූ ක්‍රියාමාර්ගයයි. චීනයේ විමුක්ති ප්‍රදේශ කිසිම බාහිර ආධාරයෙකින් තොරව කටුක තත්වයන් යටතේ පවත්නා නමුත් ජනතා යුද්ධයේ ක්‍රියාමාර්ගය එහි ජය පත්වී ඇතිමුත් විදේශ ආධාර ඇත්තාවූද අතිශය හිතකර තත්වයන් යටතේ පවත්නාවූද කුඹමින්තාන් පෙදෙස්වල අනෙක් ක්‍රියා මාර්ගය පරාජයට තුඩුදී තිබේ.

LIBERATIONBASE

තමන්ගේ පරාජයනට හේතුව අවි ආයුධ හිඟකම යයි කුඹමින්තාන් ආණ්ඩුව කියයි. එහෙත් ප්‍රශ්නය නම් ඇත්ත වශයෙන්ම ආයුධ හිඟවී ඇත්තේ කුඹමින්තාන් හමුද වලටද? එසේ නැත්නම් විමුක්ති ප්‍රදේශවල හමුද වලටද? යන්නයි. චීනයේ සියළු හමුද අතුරින් උග්‍රතම ආයුධ හිඟයකට මුහුණ පාන්නේ විමුක්ති ප්‍රදේශවල හමුදවන්ය. මේ හමුද සතුව ඇත්තේ සතුරාගෙන් අල්ලා ගන්නා ආයුධත් ඉතා නොදියුණු තත්වයන් යටතේ නිපදවන ආයුධත්ය.

කෙලින්ම කුඹමින්තාන් මහාණ්ඩුව යටතෙහි පවත්නා හමුදවන් ප්‍රාදේශීය හමුදවනට වඩා බොහෝ හොඳින් ආයුධ සන්නද්ධ වී ඇති බව සත්‍යයක් නොවේද? එහෙත් සටන් සාර්ථකත්වය අතින් මහාණ්ඩුවේ බොහෝ හමුද ප්‍රාදේශීය හමුද වලට වඩා දුර්වලය.

කුඹමින්තානයට ප්‍රයෝජන ගනු සඳහා විශාල ජනගහණයක් සිටිත්. එහෙත් හමුදවට හටයන් බඳවා ගැනීමේදී ඔවුන් අනුගමනය කරන වැරදි ප්‍රතිපත්තිය නිසා හට සංඛ්‍යාවෙහි අඩුපාඩු පුරවා ලීම ඉතා අමාරු කරුණක් වී තිබේ. චීනයෙහි විමුක්ති ප්‍රදේශ සතුරා විසින් එකිනෙකින් වෙන් වෙන්ව කපාහැර දමා තිබෙන නමුත් ඒවගේම ඒ ප්‍රදේශ නිරන්තරව සටන්වල යෙදී සිටින නමුත් ජන ශක්තිය අතින් එම ප්‍රදේශවලට කිසි අඩුපාඩුවක් නැත. මීට හේතුව ජනතාවගේ අවශ්‍යතාවයනට මනාසේ ගැලපෙන අන්දමින් සකස් වී ඇති මිලීෂියා හා ආත්මාරක්ෂක බලකායන් ක්‍රමය සෑම තැනක ක්‍රියාත්මක කිරීමත් ජනශක්තිය නොමඟ යෙදීම හා නාස්ති කිරීම වළකා තිබීමත්ය,

කුඹමින්තාන්වරු ධාන්‍ය වලින් ගහණ විශාල පෙදෙස් පාලනය කරතත් ඒ පෙදෙස්වල ජනතාව වර්ෂයක් පාසා ධාන්‍ය 'තාන්' 7-10 කෝටියක් නිපදවතත් කුඹමින්තාන් හමුදව නිතරම ආහාර හිඟයකට මුහුණපායි. ඒ හමුදවල හටයන් වැහැරී ගොස්ය. මීට හේතුව මේ ධාන්‍ය වලින් වැඩි කොටස ඒවා බෙද හරිනවුන් විසින් වංචාකරනු ලැබීමයි. සතුරා පිටුපසින් පිහිටා ඇති චීනයෙහි බොහෝ විමුක්ති ප්‍රදේශ ''සියල්ල දවාලනු, සියල්ල මරා දමනු, සියල්ල කොල්ල කනු'' යන සතුරාගේ ප්‍රතිපත්තිය අනුව විනාශ කර තිබෙන නමුත් උතුරු ෂෙන්සි ප්‍රදේශ වැනි ඇතැම් ප්‍රදේශ අතිශයින් වියළි ප්‍රදේශ වන නමුත් අපේම උත්සාහයෙන් ගොවි නිෂ්පාදනය වැඩිකොට අපේ ධාන්‍ය ප්‍රශ්නය සාර්ථක ලෙස විසඳා ගෙන තිබේ.

කුඹමින්තාන් ප්‍රදේශ උග්‍ර ආර්ථික අර්බුදයකට මුහුණපාමින් සිටිත්. බොහෝ කර්මාන්ත බංකොළොත් වී ගොස්ය. වෙනකක් තබා රෙදිපිළි සහ අත්‍යවශ්‍ය ධාන්‍ය පවා අමෙරිකා එක්සත් ජනපදයෙන් ගෙන්වා ගැනීමට සිදුවී තිබේ. එහෙත් චීනයෙහි විමුක්ති ප්‍රදේශවල කර්මාන්ත සංවර්ධනයෙහි ප්‍රතිඵලයක් වශයෙන් එම පළාත්වලට අවශ්‍ය රෙදිපිළි හා වෙනත් භාණ්ඩ අතින් අගහිඟයක් නැත. කුඹමින්තාන් ප්‍රදේශවල කම්කරුවෝද ගොවියෝද වෙළඳ සේවකයෝද රජයේ සේවකයෝද සංස්කෘතික සේවකයෝද අන්ත දුගී ජීවිතයක් ගත කරත්. මේ අතර විමුක්ති ප්‍රදේශවල සියළු ජනයාට ආහාර රෙදිපිළි හා රැකීරක්ෂා අතින් හිඟයක් නැත. කුඹමින්තාන් ප්‍රදේශවල තවත් විශෙෂ ලක්ෂණයක් නම් ජාතික අර්බුදය ආත්ම ලාභය සඳහා හරවා ගත් රජයේ නිලධාරීන් තම රාජකාරියට අමතර වශයෙන් වෙළෙන්දන් හා පගාමරුවන් වී සිටීමයි. ඔවුහු කිසිම හිරිකිතයක් හෝ ලජ්ජාවක්

නොමැතිව මේ දූෂණවල යෙදී සිටිත්. චීනයෙහි විමුක්ති ප්‍රදේශවල විශේෂ ලක්‍ෂණයක් නම් කාඩර්වරුන් ආදශීමත් වාම ජීවිතයක් ගත කරමින් වෙහෙස වී වැඩ කිරීමයි. ඔවුහු ස්වකීය රාජකාරී කටයුතුවලට අමතර වශයෙන් නිෂ්පාදන කටයුතුවල නියැලෙත්. අල්ලස් ගැනීම හා කූට ජාවාරම්වල යෙදීම සහමුලින් තහනම් කර තිබෙන අතර අවංක භාවය මහත්සේ අගය කරනු ලැබේ.

කුඕමින්තාන් පෙදෙස්වල ජනතාවට කිසිම නිදහසක් නැත්තේය. චීනයේ විමුක්ති ප්‍රදේශවල ජනතාවට සම්පූර්ණ නිදහස තිබේ.

කුඕමින්තාන් පාලකයන් මුහුණපාන සියළු විෂමතාවයනට වගකිව යුත්තේ කවුද ? ඊට වගකිවයුත්තේ වෙනත් අයද? එසේ නැත්නම් ඔවුන්මද ? ඔවුනට අවශ්‍ය තරම් ආධාර නොදීම ගැන විදේශයනට දෙස් කිවයුතුද ? එසේ නැත්නම් කුඕමින්තාන් ආණ්ඩුවේ ඒකාධිපති පාලනයට දූෂිත භාවයට හා අදක්‍ෂතාවයට දෙස් කිවයුතුද ? මේ ප්‍රශ්නයට පිළිතුරු පැහැදිළි නොවේද?

ප්‍රතිප්‍රහාරක යුද්ධය කඩාකප්පල් කරන්නේ, රාජ්‍යය අනතුරෙහි හෙලන්නේ කවුරුන්ද?

චීන ජනතාවගේ ප්‍රතිප්‍රහාරක යුද්ධය කඩාකප්පල් කර තිබෙන්නේද අප රට අනතුරෙහි හෙළා තිබෙන්නේද කුඕමින්තාන් ආණ්ඩුවම බව අවිවාදයෙන් පිළිගත යුතු සාක්ෂි අනුව නොපෙනේද? දස වසරක් මුළුල්ලේ එම ආණ්ඩුව සිවිල් යුද්ධයක් කරගෙන ගියේය. ජාතික ආරක්‍ෂාව ගැන අල්පමාත්‍ර සැලකිල්ලක් නොදක්වූ ඔවුන් ස්වකීය ප්‍රහාරය එල්ල කළේ ජනතාවටම විරුද්ධවය. එම ආණ්ඩුව අනුගමනය කළ ප්‍රතිප්‍රහාරය නොදීමේ ප්‍රතිපත්තිය නිසා නිරිතදිග පළාත් හතර සතුරා අතට පත්විය. ජපන් ආක්‍රමණිකයන් මහා ප්‍රාකාරයෙන් දකුණු දෙසට ගමන් කරන්නට වූ විට කුඕමින්තාන් ආණ්ඩුව කළේ ඔවුනට විරුද්ධව ව්‍යාජ ප්‍රතිප්‍රහාරයක යෙදී ලූකව් ච්යාඕ හි සිට දිගටම ක්වෙයිචව් පළාත දක්වා පසුබැසීමයි. එහෙත් කුඕමින්තාන්වරුන් චෝදනා කරන්නේ කොමියුනිස්ට් පක්‍ෂය ප්‍රතිප්‍රහාරක යුද්ධය

LIBERATIONBASE

කඩාකප්පල් කරන බවටත් රාජ්‍යය අනතුරෙහි හෙළන බවටත්ය. (1943 සැප්තැම්බරයෙහි පවත්වන ලද කුඕමින්තාන් පක්‍ෂයේ මධ්‍යම විධායක කොමිටිය එකොළොස්වැනි පූර්ණ රැස්වීම් වාරයේ යෝජනාවන් බලන්න.) මේ චෝදනාව ඔප්පු කරනු සඳහා ඔවුන් ඉදිරිපත් කරන එකම සාක්ෂිය නම් ජපනාට විරුද්ධව වීරෝදර ප්‍රතිප්‍රහාරයක යෙදී සිටින විමුක්ති ප්‍රදේශ ගොඩ නඟනු සඳහා කොමියුනිස්ට් පක්‍ෂය සියළු ජනකොටස් සමග එක්සත්ව ක්‍රියා කර තිබීමයි. කුඕමින්තාන්වරුන්ගේ තර්කය චීන ජනතාව දරන මතයට කෙතරම් පටහැනිද කිවහොත් බොහෝ ප්‍රශ්න උඩ එකඟතාවයක් ඇති කර ගත නොහැකි වී තිබීම ගැන පුදුම විය යුතු නොවේ.

මෙන්න ප්‍රශ්න දෙකක්

පළමුව: හෙයිලුංකියාං පළාතෙහි සිට ලූකව්ච්යාඕ දක්වාද ලූකව්ච්යාඕ හි සිට ක්වෙයිචව් දක්වා විහිදී ඇති තරම් අතිවිශාලවූද ජනාකීර්ණවූද ප්‍රදේශයක් අතහැර දැමීමට කුඕමින්තාන් ආණ්ඩුවට සිදුවූනේ කාගේ වරදින්ද? මෙසේ වූයේ කුඕමින්තාන් ආණ්ඩුව විසින් ජපනාට විරුද්ධව මුලදී ප්‍රතිප්‍රහාරයෙහි නොයෙදීමේ ප්‍රතිපත්තියක්ද, එයින් පසු අකර්මන්‍ය ප්‍රහාරයෙහි යෙදීමේ ප්‍රතිපත්තියක්ද අනුගමනය කිරීමත්, දේශීය වශයෙන් ජනතාවට එරෙහිවීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමත් නිසා මිස අන් කවර හේතුවක් නිසාද?

දෙවනුව: ජපන් හා රුකඩ හමුදවල දරුණු හා දීර්ඝකාලීන ප්‍රහාර පොඩිපට්ටම් කර දමා ජාතියේ සතුරාගේ ග්‍රහණයෙන් විශාල ජනගහණයක් හා භූමි ප්‍රදේශයක් මුදා ගැනීමට විමුක්ති ප්‍රදේශවලට හැකිවූයේ කවර හේතුවක් නිසාද? එසේ කළහැකි වූයේ අප අනුගමනය කරන ජනතා යුද්ධයක නිවැරදි ක්‍රියාමාර්ගය නිසා මිස අන් කරුණක් නිසාද?

"ආණ්ඩුවේ සහ හමුදවේ නියෝගවලට අකීකරුවීම"

කුඕමින්තාන් ආණ්ඩුව චීන කොමියුනිස්ට් පක්‍ෂයට විරුද්ධව නගන තව නිරන්තර චෝදනාවක් නම් කොමියුනිස්ට් පක්‍ෂය

"ආණ්ඩුවේ සහ හමුදාවේ අණට කීකරු නොවන" බවයි. මේ සම්බන්ධයෙන් අප විසින් කිවයුතුව තිබෙන එකම දෙය නම් වාසනාවට මෙන් චීන ජනතාව මෙන්ම ප්‍රඥාන්විතව ක්‍රියා කරන චීන කොමියුනිස්ට් වරුන් චීන ජනතාව විසින් ඉමහත් කම්කටොළු මැද දැඩි වෙහෙසක් දරා හිමිකර ගන්නා ලද විමුක්ති ප්‍රදේශ ආපසු ජපන් ආක්‍රමණිකයන් අතට පත්වන අන්දමේ "ආණ්ඩු නියෝගවලට හා හමුදා නියෝග වලට" කීකරු වී නැති බවයි. මේ නියෝග වලින් සමහරක් නම් 1939 දී පනවන ලද "විදේශීය පක්ෂවල වැඩකටයුතු සීමා කිරීමේ නීති, "අටවන හතරවෙනි හමුදාව විසුරුවා හැරීමේ" අණ "කහ ගඟේ පැරණි මාවතට උතුරු දෙස දක්වා එම හමුදා පසුබස්වන්නැයි" 1941 දී නිකුත් කළ අණ "චීන කොමියුනිස්ට් පක්ෂය විසුරුවා හරින ලෙස" 1943 දී නිකුත් කළ අණ "සේනාංක දහයක් හැර අනිකුත් සියළුම හමුදා එක්තරා නියමිත කාලයක් තුළදී විසුරුවා දමන ලෙස" 1944 දී අපට කළ නියෝගය සහ කුඕමින්තාන් ආණ්ඩුව මෑතකදී අප සමග පැවැත්වූ සාකච්ඡා වලදී වාසියක් සැළසීමක් ලෙසින් හැඳින්වූ යෝජනාව-එනම් සහාග ආණ්ඩුවක් පිහිටු වන්නේ නැතිව ඔවුන්ගේ ඒකාධිපති ආණ්ඩුවෙහි නිලතල කිහිපයක් අප විසින් භාරගෙන ඒ වෙනුවට අපේ හමුදා සහ ප්‍රාදේශීය ආණ්ඩු ඔවුන් අතට බාරදීම—ආදියයි. වාසනාවට මෙන් අප මේ නියෝගවලට අවනත නොවීම නිසා නොකෙළසුණු භූමි ප්‍රදේශයක් හා චීන ජනතාව වෙනුවෙන් ජපනාට විරුද්ධව සටන් කරන වීරෝදාර හමුදාවක් රැක ගැනීමට අපට හැකි විය. මෙබඳු "අකීකරුකමක්" කිරීම ගැන චීන ජනතාව සතුටු වියයුතු නොවේද? කුඕමින්තාන් ආණ්ඩුව සවකීය පැසිස්ට්වාදී පාලන යන්ත්‍රයෙහි නියෝගවල හා පරාජිතවාදී හමුදා නියෝගවල ප්‍රතිඵලයක් වශයෙන් හෙයිලුන්කියාන් හි සිට ක්වෙයිචව් දක්වා වූ විශාල ජනාකීර්ණ ප්‍රදේශ ජපන් ආක්‍රමණිකයින්ට බිලිකොට ඇති බව ඔවුනට නොහැඟේ? මේ කියන "ආණ්ඩු නියෝග හා හමුදා නියෝග" ජපන් ආක්‍රමණිකයන්ගේ හා ප්‍රතිගාමීන්ගේ ප්‍රසාදය පිණිස වුවත් ඒවා කිසිම අවංක චීන දේශප්‍රේමියකුට අනුමත කළ හැකි දේවල්ද? නමින් පමණක් නොව ඇත්ත වශයෙන්ම සහාග ආණ්ඩුවක් නොපවතිනතාක් පැසිස්ට්වාදී ඒකාධිපතිත්වය

වෙනුවට ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක් නොපවතිනතාක් නිදහස දිනූ ජනතාවන් වෙසෙන විමුක්ති ප්‍රදේශ හා ප්‍රතිප්‍රහාරක යුද්ධයේදී විශිෂ්ඨ මෙහෙයක් ඉටු කළ මහජන හමුදා මේ පරාජිතවාදී, පැසිස්ට්වාදී ඒකාධිපති කුඕමින්තාන් ආණ්ඩුවට පවරාදීමට චීන ජනතාව චීන කොමියුනිස්ට්වාදීනට ඉඩ දෙන්නහුද? විමුක්ති ප්‍රදේශ හා මහජන හමුදා නොතිබෙන්නට චීන ජනතාවගේ ජපන් විරෝධී ව්‍යාපාරය අද තිබෙන තත්වයට පත්වනු ඇද්ද? ඒ වගේම මේවා නොතිබෙන්නට චීන් ජාතියේ අනාගතය කුමකින් කුමක්වේදැයි කාට කිවහැකිද?

සිවිල් යුද්ධයක අන්තරාය

මේ වනතුරුත් කුඕමින්තාන් පක්ෂයේ ප්‍රධාන පාලක පිරිස නොකඩවා අනුගමනය කර තිබෙන්නේ ඒකාධිපති පාලනයක හා සිවිල් යුද්ධයක ප්‍රතිගාමී ප්‍රතිපත්තියයි. එක්තරා මිත්‍ර රටක හමුදාවන් විසින් චීන මහා දේශයෙහි සෑහෙන කොටසක් ජපන් ආක්‍රමණිකයන්ගෙන් විනිර්මුක්ත කළ පසු සිවිල් යුද්ධයක් කරනු සඳහා දිගුකලක පටන් ලකලෑහැස්තියක් පවත්නා බවට බොහෝ ලකුණු තිබේ. බ්‍රිතාන්‍ය සෙන්පතියෙක් වූ ස්කෝබි ජනරාල්වරයා ග්‍රීසියෙහිදී කළ දෙයම ඇතැම් මිත්‍ර රටවල සෙන්පතියන් විසින් චීනයෙහිද කරනු ලබන්නේ යයි කුඕමින්තානය බලාපොරොත්තු වෙයි. ස්කෝබි සහ ප්‍රතිගාමී ග්‍රීක ආණ්ඩුව විසින් කරන ලද මනුෂ්‍ය සංහාරය කුඕමින්තානය විසින් අගය කරනු ලැබේ. 1927–37 සමය තුළදී මෙන් නැවතත් චීනය තුළ සිවිල් යුද්ධයක් ඇවිලවීමට ඔවුහු උත්සාහ දරත්. "ජාතික මන්ත්‍රී මණ්ඩලය කැඳවීමේ" හා "දේශපාලන විසඳුමක් සැපයීමේ" කඩතුරාවට මුවාවී ඔවුහු හොර රහසේම සිවිල් යුද්ධයකට අර අඳිමින් සිටිති. අපේ සහෝදර රටවැසියන් මේ උපක්‍රම අවබෝධ කර ගැනීමටත් ඒවා හෙළිදරව් කිරීමටත් අපොහොසත් වුවහොත්, දැනට සිවිල් යුද්ධයක් කරනු සඳහා කෙරෙන ලකලෑහැස්තිය නවතා නොදැමුව හොත් එක්තරා දිනක ඔවුනට සිවිල් යුද්ධයේ වෙඩි හඬ ඇසෙනු ඇත.

සාකච්ඡා

අනිකුත් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂවල අනුමැතිය ලබාගත් චීන කොමියුනිස්ට් පක්ෂය 1944 සැප්තැම්බරයේදී ජනතා දේශපාලන

LIBERATIONBASE

මණ්ඩලයේදී යෝජනාවක් ඉදිරිපත් කරමින් කුඕමින්තානයේ ඒකපාක්ෂික ඒකාධිපත්‍යය වහාම අහෝසි කර දමා ජපන් ආක්‍රමණිකයන් පරාජය කිරීම, නව චීනයක් ගොඩනැගීම සහ සිවිල් යුද්ධය වළකාලීම යන කරුණු ඉටු කරගනු සඳහා සභාග ආණ්ඩුවක් පිහිටුවිය යුතු බව කියා සිටියහ. මෙය කාලෝචිත ඉල්ලීමක් වන බවට සැකයක් නැත. මාස කිහිපයක කෙටිකලක් තුළදී මේ අදහස පුළුල් ජනතාව අතර බොහෝ සෙයින් ජනප්‍රිය වී තිබේ.

තනි පක්ෂයේ ඒකාධිපති පාලනය අහෝසි කර දැමීම සභාග ආණ්ඩුවක් පිහිටුවීම සහ අවශ්‍ය ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණයන් ක්‍රියාත්මක කිරීම යන ප්‍රශ්න ගැන අපි කුඕමින්තාන් ආණ්ඩුව සමග නොයෙක් විට සාකච්ඡා කළෙමු. එහෙත් ඔවුන් විසින් අප කළ සියළු යෝජනා ප්‍රතික්ෂේප කරන ලදී. කුඕමින්තානය ඒකපාක්ෂික ඒකාධිපත්‍යය අහෝසි කිරීමට හා සභාග ආණ්ඩුව පිහිටුවීමට අකමැතිවා පමණක් නොව, රහස් පොලීසිය නැතිකර දැමීම, ජනතා නිදහස මඩින ප්‍රතිගාමී නීති රීති අවලංගු කර දැමීම දේශපාලන සිරකරුවන් මුදහැරීම, දේශපාලන පක්ෂවල නීත්‍යානුකූල තත්වය පිළිගැනීම විමුක්ති ප්‍රදේශ නීතියෙන් පිළිගෙන එම ප්‍රදේශවලට අවහිර කරන හා පහරදෙන හමුදවන් ඉවත් කරගැනීම ආදී අත්‍යවශ්‍ය ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණයන් ක්‍රියාත්මක කිරීමටද අකැමැති වෙති. මේ හේතුවෙන් චීනයෙහි දේශපාලන සබඳතාවන් බොහෝ සේ ඉරිතලා ගොස් තිබේ.

සිදුවිය හැකි වැඩ දෙකක්

මුළු තත්වය අනුව බලන විටත් ජාත්‍යන්තර හා දේශීය තත්වය ගැන කරන ලද පෙර සඳහන් විග්‍රහය අනුව බලන විටත් සියළු දෙනා සෝදිසියෙන් සිටිය යුතු බවද ව්‍යාපාරයෙහි ඉදිරිගමන ලේසි පහසු එකක් නොවන බවද මෙහි සිටින සියළු දෙනා විසින් වටහා ගත යුතුය. සිදුවිය හැකි දේවල් දෙකක් තිබේ. එකක් හිතකරය. අනෙක අහිතකරය. සිදුවිය හැකි එක් දෙයක් නම් පැසිස්ට් ඒකාධිපති පාලනය නොකඩවා පැවතීමත් ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණවලට ඉඩ නොදීමත්ය. වැඩි වෙහෙසක් ගනු ඇත්තේ ජනතාවට පහරදීමට මිස ජපන් ආක්‍රමණිකයන්ට පහර දීමට නොවේ. ජපන්

ආක්‍රමණිකයන් පරාජය කළ පසු චීනය තුළ සිවිල් යුද්ධයක් ඇවිලී නිදහස, ස්වෛරීත්වය, ප්‍රජාතන්ත්‍රය, සමගිය, සෞභාග්‍යය හා ශක්තිය නොමැති පැරණි කාලකණ්ණි තත්වයටම යළිදු චීනය ඇද වැටෙනු ඇත. ජාත්‍යන්තර තත්වය වඩා වාසිදයක වූ නිසාවත් අප ජනතාවගේ දේශපාලන අවධිය අධිකවී තිබෙන නිසාවත් ඔවුන්ගේ සංවිධානය වූ ශක්තිය වැඩිවී තිබෙන නිසාවත් පෙර සඳහන් දේ සිදුවීමට ඇති ඉඩකඩ ඇහිරී ගොස් නැත්තේය. මෙකී දේ චීනයෙහි සිදුවන්නේයයි බලාපොරොත්තු වන්නේ කුඕමින්තානය තුළ සිටින ප්‍රතිගාමී කල්ලියත් විදේශයන්හි වෙසෙන අධිරාජ්‍යවාදී සිතුම් පැතුම් වලින් යුත් ප්‍රතිගාමීනුත්ය. මේ වූකලී සැලකිල්ලට ගතයුතු ප්‍රශ්නයේ එක් අංශයකි.

සිදුවීමට ඉඩ ඇති තව දෙයක් තිබේ. යළිදු මුළු තත්වය දෙස බලන විටත් ජාත්‍යන්තර හා දේශීය තත්වය පිළිබඳ පෙර සඳහන් විග්‍රහය දෙස බලන විටත් සිදුවීමට ඇති දෙවන කාර්යය ඉටු කර ගනු සඳහා අපට අමතර ආත්ම විශ්වාසයක් හා ධෛර්යයක් ලද හැකිය. සියළු කරදර කම්කටොළු මැඩලාගෙන සමස්ත චීන ජනතාව එක්සත් කොට කුඕමින්තානයේ පැසිස්ට්වාදී ඒකාධිපත්‍යය අහෝසි කරදමා ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කොට ජපන් විරෝධී බලවේග තහවුරු කොට හා ව්‍යාප්ත කොට ජපන් ආක්‍රමණිකයන් අන්ත පරාජයකට පත්කොට ස්වෛරී, ස්වාධීන ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් සෞභාග්‍යමත් බලපරාක්‍රමයෙන් යුත් නව චීනයක් ගොඩ නැඟීම කළ හැකි දෙවන කාර්යයයි. මේ හැකියාව චීනය තුළ යථාර්ථයක් බවට පත්වේයයි බලාපොරොත්තුවන්නෝ මහජනතාව, කොමියුනිස්ට් පක්ෂය හා රටේ ඇති අනෙකුත් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂත්, අප සමානත්වයෙහි ලා සලකන සෙසු සියළු ජාතීනුත් විදේශීය ප්‍රගතිශීලීන් හා පොදු ජනතාවත්ය.

කොමියුනිස්ට්වාදීන් වන අප හා සමස්ත චීන ජනතාව තවමත් විශාල කරදර වලට හා බොහෝ බාධකවලට මුහුණපාන බවත් අප ඉදිරියෙහි ඇත්තේ දීර්ඝ වූද කම්කටොළු සහගතවූද මාර්ගයක් බවත් අපි හොඳාකාරව දනිමු. ඒ එක්කම සමස්ත චීන ජනතාව මෙන්ම අපත් දන්නා තවත් කරුණක් නම් සියළු කරදර කම්කටොළු මැඩගෙන ඉතිහාසය විසින් චීනයට පවරා ඇති කාර්ය

LIBERATION BASE

තිස් හයක් වන ගොවි ජනතාවගේද තෙවනුව නාගරික සුළු ධනපතීන් ජාතික ධනපතීන් ප්‍රබුද්ධ ප්‍රභූවරුන් සහ අනෙකුත් දේශප්‍රේමීන්ගේද සහයෝගය දිනාගත හැකි නිසාත් දිනා ගනිමින් සිටින නිසාත් ය.

තවමත් මේ පන්තිය අතර ප්‍රතිවිරෝධතාවයන් පවත්නා බව සැබවි. විශේෂයෙන්ම කම්කරුවන් හා ධනපතියන් අතර පවත්නා ප්‍රතිවිරෝධතාවය ගැන කිව යුතුය. මේ නිසා ඒ ඒ පංතියට විශේෂ වූ ඉල්ලීම් ඇත්තේය. එහෙත් නව ප්‍රජාතන්ත්‍රවාදය පවත්නා අවධිය මුළුල්ලෙහි මේ ප්‍රතිවිරෝධතාවයන් මේ විවිධ ඉල්ලීම් වර්ධනය වී සියල්ලනට පොදු වූ ඉල්ලීම් අභිභවා නොයයි. එසේ අභිභවා යෑමට ඉඩදිය යුතුද නොවේ. කාටත් පිළිගත හැකි පරිදි මේ ප්‍රතිවිරෝධතාවයන් හැඩගසා ගත හැක. මෙබඳු හැඩ ගැස්මක් ඇතිකර ගතහොත් මේ පංතිවලට එක්වී නව ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයේ දේශපාලන ආර්ථික හා සංස්කෘතික කාර්‍ය්‍යයන් ඉටු කළ හැක්කේය. අප ඉදිරිපත් කරන නව ප්‍රජාතන්ත්‍රයේ දේශපාලනය වනුයේ විදේශීය පීඩනය හා දේශීය රදළ — පැසිස්ට් පීඩනය අහෝසි කර දමා පැරණි පන්නයේ ප්‍රජාතන්ත්‍රය වෙනුවට සියලුම ප්‍රජාතන්ත්‍රවාදී පන්තිවල එක්සත් පෙරමුණක් වන්නාවූ දේශපාලන ක්‍රමයක් පිහිටුවීමය. අපේ මේ අදහස් ආචාර්‍ය්‍ය සුන්යත් සෙන් ගේ විප්ලවවාදී මතිමතාන්තර වලට සහමුලින් එකඟය. කුඕමින්තානයේ ප්‍රථම ජාතික සම්මේලනයේ ප්‍රකාශනයෙහි ආචාර්‍ය්‍ය සුන් මෙසේ ලියා තිබේ: "නූතන රාජ්‍යවල ඊනියා ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය ධනපති පංතියේ ඒකාධිකාරයට යටවී තිබීම සිරිතක් වී තිබේ. මේ ක්‍රමය හුදෙක් පොදු ජනතාව මැඩලන ආයුධයක් බවට පත් වී ඇත්තේය. අනෙක් අතට කුඕමින්තානයේ ප්‍රජාතන්ත්‍රවාදය වූකලී පොදු සකල ජනතාව කොටස්කරුවන් වී ඇති ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයක් මිස අතළොස්සකගේ අයිතියට පත්වී ඇති ක්‍රමයක් නොවේ."

මෙය ආචාර්‍ය්‍ය සුන්ගේ දේශපාලන අනුශාසනයකි. චීන ජනතාව චීන කොමියුනිස්ට් පක්ෂය හා සියළු සෙසු ප්‍රජාතන්ත්‍රවාදීන් මේ අනුශාසනයට ගරු කළ යුතුය. එය තරයේ ක්‍රියාවට නැගිය යුතුය. එය උල්ලංඝනය කරන හෝ ඊට විරුද්ධ වන

සියළු පුද්ගලයනට හා කණ්ඩායම් වලට විරුද්ධව දැඩි සටනක් කළ යුතුය. එසේ කොට මේ සහමුලින් නිවැරදි නව ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ධර්මය ආරක්ෂා කළ යුතුය. වර්ධනය කළ යුතුය.

නව ප්‍රජාතන්ත්‍ර සමාජයේ සංවිධාන ප්‍රතිපත්තිය විය යුත්තේ මධ්‍යගත ප්‍රජාතන්ත්‍රවාදයයි. ප්‍රධාන ක්‍රියාමාර්ගයන් පිළිබඳව තීරණයක් ගැනීමේ හා විවිධ මට්ටම්වල පාලන සංස්ථා තෝරා පත් කර ගැනීමේ අයිතිය තිබිය යුත්තේ ජන සභාවලටය. මෙය එකවරම ප්‍රජාතන්ත්‍රවාදී වූද මධ්‍යගත වූද ක්‍රියා මාර්ගයකි. ප්‍රජාතන්ත්‍රය යටතේ මධ්‍යගතය. මධ්‍යගත මඟ පෙන්වීම යටතේ ප්‍රජාතන්ත්‍රවාදීය. සියළු මට්ටම්වල ජනසභා මත පැවරී ඇති බලතල අනුව ප්‍රජාතන්ත්‍රය සහමුලින් ක්‍රියාත්මක වනුයේ, ජනසභා විසින් ඒ ඒ මට්ටමේ පාලන සංස්ථාවලට පවරන ලද වැඩ කටයුතු මධ්‍යගත ලෙසින් පරිපාලනය කරන්නාවූද, ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී ජීවිතයට අවශ්‍ය සියළු දේ ආරක්ෂා කරන්නා වූද මධ්‍යගත පරිපාලන ක්‍රමයක පැවැත්ම සහතික කළ හැක්කේ මේ ක්‍රමය අනුව පමණි.

යුද හමුදව සහ සෙසු ආයුධ සන්නද්ධ බලවේගයෝ නව ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යබලයේ වැඩ පිළිවෙලෙහි වැදගත් තැනක් ගන්නාහ. මේවා නොමැතිව රාජ්‍යය ආරක්ෂා කළ නොහැක. බලය රැඳී ඇති අනිකුත් සියළු ආයතන මෙන් නව ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයේ ආයුධ සන්නද්ධ හමුදාවෝද ජනතාවට අයත් වෙති, ජනතාව ආරක්ෂා කරති. අතළොස්සක් දෙනාට අයිතිව තිබුණා වූද ජනතාව පෙළීමෙහි නිරතව සිටියාවූද පැරණි පන්නයේ හමුදාව පොලීසිය ආදියට මෙකී ආයුධ සන්නද්ධ හමුද කිසිසේත් සමාන නැත.

ඒවගේම අප ඉදිරිපත් කරන නව ප්‍රජාතන්ත්‍රයේ ආර්ථිකයද ආචාර්‍ය්‍ය සුන්ගේ ප්‍රතිපත්තිවලට එකඟය. ඉඩම් ප්‍රශ්නය ගැන ආචාර්‍ය්‍ය සුන් කීවේ, ඉඩම් ඒවා වගා කරන්නා සතුවිය යුතු බවයි. කර්මාන්ත හා වෙළඳාම ගැන ආචාර්‍ය්‍ය සුන් පෙර සඳහන් ප්‍රකාශනයෙහි මෙසේ සඳහන් කර ඇත.

"චීනුන් සතු හෝ විදේශීන් සතුවූද ඒකාධිකාරි ස්වරූපයකින් යුක්තවූද පෞද්ගලිකව පරිපාලනය කළ නොහැකි තරම්

LIBERATIONBASE

විශාලවූද බැංකු, දුම්රිය සේවා, වැනි ව්‍යාපාර රජය විසින් කර ගෙන යනු ලැබේ. පරිපාලනය කරනු ලැබේ. එවිට පෞද්ගලික ප්‍රාග්ධනයට ජනතා ජීවිතය කෙරෙහි ආධිපත්‍යයක් පෑ නොහැක. ප්‍රාග්ධනය විධිමත් කිරීමේ ප්‍රධාන මූලධර්මය මෙයයි.''

වර්තමාන අවධියේදී අපි ආර්ථික ප්‍රශ්න ගැන ආචාර්ය සුන් දුරු සේන් මතිමතාන්තර සමග සහමුලින් එකඟ වෙමු.

පෞද්ගලික පුරෝගාමීත්වයේ වර්ධනයටත් පෞද්ගලික ප්‍රාග්ධනයේ වර්ධනයට හා එහි ආරක්ෂාවටත් චීන කොමියුනිස්ට්වාදීන් විරුද්ධයයි සමහරුන් සැක කරතත් එය අභූත සැකයකි. චීන ජනතාවගේ පෞද්ගලික පුරෝගාමීත්වයේ වර්ධනයට කෲර ලෙස අකුල් හෙලන්නේද පෞද්ගලික ප්‍රාග්ධනයේ වර්ධනයට බාධා කරන්නේද ජනතාවගේ දේපළ විනාශ කරන්නේද විදේශීය හා රදළ පීඩනය මිස අනෙකෙක් නොවේ. මේ බාධාවන් ඉවත් කොට මේ විනාශය නවතා දමා සමාජයේ රාමුව තුළ ජනතාවට ස්වකීය පෞද්ගලිකත්වය නිදහසේ වර්ධනය කර ගැනීමට මඟ පෑදීමත් ජන ජීවිතය කෙරෙහි ආධිපත්‍යයක් නොපාන අතර ජන ජීවිතයට යහපතක් සලසන අන්දමේ පෞද්ගලික ධනවාදී ආර්ථිකයක් වේ නම් ඊට නිදහසේ වර්ධනය වීමට මඟ පෑදීමත් සියළු ආකාරයේ සුදුසු පෞද්ගලික දේපොළ ක්‍රම ආරක්ෂා කිරීමත් නව ප්‍රජාතන්ත්‍රය සතු කාර්‍ය්‍යයයි.

ආචාර්‍ය්‍ය සුන්ගේ ප්‍රතිපත්ති සහ චීන විප්ලවයේ අත්දැකීම් අනුව යමින් වර්තමාන අවධියේදී චීන ආර්ථිකය සමන්විත විය යුත්තේ රාජ්‍ය අංශය, පෞද්ගලික අංශය හා සමුපකාර අංශය යන කොටස් තුනෙනි. හැබැයි, මෙහිදී රාජ්‍යය ටික දෙනෙකුගේ පෞද්ගලික අයිතියට යටවී ඇති රාජ්‍යයක් නොවිය යුත්තේමය. එය නිර්ධන පංතියේ නායකත්වය යටතේ සකල පොදු ජනතාවගේ අයිතියට පත්වී ඇති නව ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් විය යුතුය.

ඒ වගේම නව ප්‍රජාතන්ත්‍රයේ සංස්කෘතියද සකල පොදු ජනතාව සතු සංස්කෘතියක් විය යුතුය. වෙන වචනවලින් කියතොත් එය ජාතික, විද්‍යානුකූල හා පොදුජන සංස්කෘතියක් විය යුතුය. කිසිම

හේතුවක් නිසාවත් එය ''ටික දෙනකුගේ අයිතියට පත්වූ'' නො විය යුතුය.

වර්තමාන අවධිය සඳහා, එනම් ධනපති ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයේ සමස්ත අවධිය සඳහා කොමියුනිස්ට්වාදීන් වන අප යෝජනා කරන පොදු වැඩ සටහන හෙවත් මූලික වැඩ සටහන ඔන්න ඔයාකාර වේ. අපගේ අනාගත වැඩ සටහන හෙවත් වැඩිම ප්‍රමාණයේ වැඩ සටහන සමාජවාදී ක්‍රමය හා කොමියුනිස්ට ක්‍රමය වන අතර අපගේ අඩුම ප්‍රමාණයේ වැඩ සටහන පෙර සඳහන් වැඩ සටහන වේ. මේ වැඩ සටහන ක්‍රියාත්මක කළවිට දැනට යටත්විජිත, අර්ධ යටත්විජිත හා අර්ධ රදළ චීන රාජ්‍ය හා චීන සමාජය නව ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් හා සමාජයක් කරා පියවරක් ඉදිරියට නගනු ඇත.

අප වැඩ සටහනට ඇතුළත් නිර්ධන පංතියේ දේශපාලන නායකත්වයත් නිර්ධනික නායකත්වයෙන් යුත් රාජ්‍යයත් ආර්ථිකයේ සමුපකාර අංශත් සමාජවාදී අංගයන්ය. එහෙත් මේ වැඩ සටහන ක්‍රියාත්මක කළ පමණින් චීනය සමාජවාදී සමාජයකට පරිවර්තනය නොවන්නේය.

කොමියුනිස්ට්වාදීන් වන අපි අපේ දේශපාලන සිතුම් පැතුම් සඟවන්නේ නැත. නියතවශයෙන් හා නිසැකයෙන්ම අපගේ අනාගත වැඩ සටහන හෙවත් වැඩිම ප්‍රමාණයේ වැඩ සටහන වනුයේ චීනය සමාජවාදී ක්‍රමය හා කොමියුනිස්ට ක්‍රමය කරා ඉදිරියට ගෙන යෑමය. අප පක්ෂයේ නම හා ලෝකය පිළිබඳව අප දරන මාක්ස්වාදී දර්ශනයෙන්ද කෙළින්ම පැහැදිලි වනුයේ අපගේ එල්ලය ඒ උත්තරීතර ආදර්ශමත් අනාගතය බවයි. ඒ අසමාන වශයෙන් ජෝතිමත්වූද ප්‍රභාමත්වූද අනාගතය බවයි. සෑම කොමියුනිස්ට වාදියෙක්ම පක්ෂයට බැඳෙන විට පැහැදිළි පරමාර්ථ දෙකක් හදවතෙහි රඳවාගෙන සිටියි. දැන් නව ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය සිදු කිරීමත් අනාගතයේදී සමාජවාදී ක්‍රමය හා කොමියුනිස්ට ක්‍රමය ගොඩනැගීමත්ය. කොමියුනිස්ට වාදයේ සතුරන්ගේ සතුරුකම් කෙතරම් වුවද, ඔවුන්ගේ අශිෂ්ට මුඩ අව ලාදයන් සහ අපහාසයන් සහ පරිහාසයන් කොතරම් වුවද කොමියු

LIBERATIONBASE

නිස්ට් වාදීයෝ මේ පරමාර්ථ ඉටුකර ගැනීමට සටන් කරන්නාහ. සතුරන්ගේ මෙකී ක්‍රියාවන්ට විරුද්ධව අප තරයේ පහරදිය යුතුය. අප ගැන සැක පහළ වී ඇති අවංක පුද්ගලයනට හොඳ හිතින් සහ ඉවසීමෙන් යුතුව කරුණු තේරුම් කර දිය යුතුය. ඔවුනට පහර ගැසීම වරදකි. මේ සියල්ල ඉතා පැහැදිළිය. නිශ්චිතය. ඍජුය.

එහෙත් චීනයේ සියළුම කොමියුනිස්ට් වාදීන් සහ කොමියුනිස්ට්වාදී අනුගාමිකයින් විසින් වර්තමාන අවධියේ පරමාර්ථ මුදුන්පමුණුවා ගනු සඳහා සටන් කළ යුතුව තිබේ. චීනයේ ජනතාව කාලකන්නි යටත් විජිත, අර්ධ යටත් විජිත හා අර්ධ රදළ අතවරයෙන් මුදගෙන නිර්ධන පංතියේ නායකත්වයෙන් යුත් නව ප්‍රජාතන්ත්‍රවාදී චීනයක් ගොඩනගනු සඳහාත්, ගොවි ජනතාවගේ විමුක්ති සාධනය ප්‍රධාන කාර්ය කොට ගත්තාවූ චීනයක් ගොඩනගනු සඳහාත් ආචාර්ය සුන් යත් සෙන් ගේ විප්ලවීය ජනතා ප්‍රතිපත්ති තුනට අනුකූලවූ චීනයක් ගොඩනගනු සඳහාත්, ස්වතන්ත්‍ර, ස්වාධීන, ජනසම්මතවාදී, සමගිසම්පන්න, සෞභාග්‍යමත් හා බලපරාක්‍රමයෙන් හෙබියාවූ චීනයක් ගොඩ නැගීම සඳහාත්, විදේශීය හා රදළ පීඩනයට විරුද්ධව ඔවුහු සටන් කළ යුත්තාහ. ඇත්තවශයෙන්ම අපි මෙතෙක් කරමින් සිටියේ මේ ටිකමය. චීන පොදු ජනතාව සමග උරෙනුර ගැටී කොමියුනිස්ට් වාදීන් වන අපි මෙම අරමුණ සඳහා ගතවූ අවුරුදු විසි හතර තුළ වීරෝදර ලෙස සටන් කර ඇත්තෙමු.

කිසියම් කොමියුනිස්ට්වාදියෙක් හෝ කොමියුනිස්ට් හිතවතෙක් සමාජවාදය සහ කොමියුනිස්ට්වාදය ගැන කතා කරන මුත් එම අරමුණ සඳහා සටන් කිරීමට අපොහොසත් වේ නම්, ධනපති ප්‍රජාතන්ත්‍ර විප්ලවය සුළු කොට තකන්නේ නම්, අල්ප මාත්‍ර වශයෙන් හෝ ඒ ගැන මන්දෝත්සාහී වන්නේ නම්, උකටලී වන්නේ නම් අඩුම තරමින් හෝ ඊට ද්‍රෝහී වන්නේ නම්, අකර්මණ්‍ය වන්නේ නම් හෝ ඒ සඳහා ස්වකීය රුධිරය හෝ ජීවිතය පූජා කිරීමට පසුබට වන්නේ නම් එබඳු, පුද්ගලයෙක් දැනුවත්ව හෝ නොදැනුවත්ව අඩු වැඩි වශයෙන් සමාජවාදය හා කොමියුනිස්ට්වාදය පාවා දෙන අතර, කොමියුනිස්ට්වාදය සඳහා දේශපාලන හැඟීමකින් යුතුව හා ස්ථිරසාරව සටන්

කරන්නකු නොවේ. සමාජවාදය උදකර ගත හැක්කේ ප්‍රජාතන්ත්‍ර අවධිය ඔස්සේ බව මාක්ස්වාදයේ රීතියකි. චීනයෙහි ප්‍රජාතන්ත්‍රය සඳහා ගෙන යන අරගලය දීර්ඝ වූවකි. එක්සත් නව ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයකින් තොරව, නව ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය ආර්ථික අංශයේ වර්ධනයකින් තොරව, ,පෞද්ගලික ධනපති හා සමූපකාර අංශවල වර්ධනයකින් තොරව, ජාතික, විද්‍යානුකූල හා මහජන සංස්කෘතියේ–එනම් නව ප්‍රජාතන්ත්‍රවාදී සංස්කෘතියේ වර්ධනයකින් තොරව, ලක්ෂ කෝටි සංඛ්‍යාත ජනතාවගේ පෞද්ගලිකත්වයේ විමුක්තියෙන් හා වර්ධනයෙන් තොරව–කොටින් කියතොත් කොමියුනිස්ට් පක්ෂයේ නායකත්වය යටතේ සිදු කෙරෙන නව පන්නයේ ද්‍රැඪතම ධනපති ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයකින් තොරව–යටත් විජිතමය, අර්ධ යටත් විජිතමය සහ අර්ධ වැඩවසම් නටබුන් මත්තෙහි සමාජවාදී සමාජයක් ගොඩ නැගීමට කල්පනා කිරීම හුදු මනස්ගාතයකි.

ධනපති ක්‍රමය ගැන බියවනු වෙනුවට ඇතැම් තත්වයන් යටතේ කොමියුනිස්ට්වාදීන් එහි වර්ධනයට රුකුල් දෙන්නේ මන්දැයි සමහර අයට නොතේරේ. අපේ පිළිතුර සරලය. විදේශීය අධිරාජ්‍යවාදයේ පීඩනය සහ දේශීය වැඩ වසම් ක්‍රමයේ පීඩනය වෙනුවට එක්තරා ප්‍රමාණයක ධනවාදී වර්ධනයකට ඉඩ සැලසීම ඉදිරි පියවරක් පමණක් නොව අනිවාර්ය ක්‍රියාදමයකි. ඉන් නිර්ධන පංතියට මෙන්ම ධනපති පංතියටද සෙත සැලසේ. සමහර විට නිර්ධන පංතියට වැඩි සෙතක් සැලසේ. වර්තමාන චීනයට නොගැලපෙන දෙයකට ඇත්තේ විදේශීය අධිරාජ්‍යවාදය හා දේශීය වැඩවසම් ක්‍රමය මිස දේශීය ධනවාදය නොවේ. ඇත්ත කියතොත් අප රටෙහි අවශ්‍ය තරමින් ධනපති ක්‍රමය නැතං. පුදුමයට කරුණ නම් චීන ධනපති පංතියේ ඇතැම් නියෝජිතයන් ධනපති ක්‍රමයේ වර්ධනයෙහි අවශ්‍යතාවය ගැන ඒ ලිපිය කියා පෑමට ලැජ්ජා වීමයි. ඔවුන් ඒ ගැන සඳහන් කරන්නේ වක් ලෙසිනි. චීනය අවශ්‍ය තරමේ ධනවාදී වර්ධනයකට ඉඩ නොදිය යුතුයිද, එක පිම්මෙන් සමාජවාදය කරා එළඹිය යුතුයිද, ත්‍රිවිධ ජනතා පිළිවෙත හා සමාජවාදය සතු කාර්යයන් තනි පාරින් ඉටු කළ යුතුය කියන්නාවූ තවත් පිරිසක් සිටිති. මේ මතවලින් එක් කෝ චීන ජාතික ධනපති පංතියේ දුබල බව පිළිබිඹු වේ. නැත්

LIBERATIONBASE

නම් මේවා මහ ඉඩම් හිමියන් සහ මහ ධනපති පංතිය ජනතාව රවටනු සඳහා කරන කූට ප්‍රචාරයන්ය. චීනයේ නව ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය ක්‍රමය යටතේ රාජ්‍ය අංශයත් වැඩ කරන ජනතාවගේ පෞද්ගලික සහ සමුපකාර අංශයනුත් වර්ධනය කිරීමට අමතරව සමාජ ප්‍රගතිය අරභයා ආර්ථිකයේ පෞද්ගලික අංශයේ වර්ධන යට රුකුල් දීම (එය ජන ජීවිතය කෙරෙහි ආධිපත්‍යයක් පාන්නේ නැති නම්) අවශ්‍ය වන බව කොමියුනිස්ට්වාදීන් වන අපි සමාජ සංවර්ධනය පිළිබඳව අප දන්නා මාක්ස්වාදී රීති අනුව පැහැදිලිව අවබෝධ කරගෙන සිටිමු. පුහු කතාවලින් සහ කූටෝපායයන්ගෙන් නොරැවටීමට කොමියුනිස්ට් වාදීන් වන අපි වග බලා ගන්නෙමු. ''වර්තමාන චීනයට අවශ්‍යව ඇත්තේ ත්‍රිවිධ ජනතා පිළිවෙත බැවින් එය සහමුළින් ක්‍රියාවට නංවනු සඳහා සටන් කිරීමට අප පක්ෂය සූදනම්'' බව කොමියුනිස්ට්වාදීන් වන අප පවසන විට ඇතැම් අය අපේ අවංකභාවය ගැන සැක පහළ කරති. මෙසේ වීමට හේතුව 1924 පැවැති කුඕමින්තාන යේ ප්‍රථම ජාතික සම්මේලනයේදී අනුමත වූ සහ අප විසින් පිළිගනු ලැබූ වැඩ සටහනෙහි ආචාර්ය සුන් යත් සෙන් විසින් ගෙන හැර දක්වන ලද ත්‍රිවිධ ජනතා පිළිවෙතේ මූලධර්මයන් වර්තමාන කාලය සඳහා ඇති අප පක්ෂයේ වැඩ සටහනේ – එනම් අඩුම වැඩ සටහනෙහි – ඇතැම් මූල ධර්මයනට සමාන බව වටහා ගැනීමට ඔවුන් අපොහොසත් වී තිබීමය. ආචාර්ය සුන් යත් සෙන්ගේ මේ ත්‍රිවිධ ජනතා පිළිවෙත වර්තමාන අවධිය සඳහා ඇති අපේ වැඩ සටහන සමග සමාන වන්නේ එක්තරා මූලධර්මයන් කිහිපයක් අතින් විනා සෑම කරුණක් අතින් නොවන බව පෙන්වා දිය යුතුය. ඇත්ත වශයෙන් අප පක්ෂයේ නව ප්‍රජාතන්ත්‍රවාදී වැඩ සටහන ආචාර්ය සුන්ගේ ප්‍රතිපත්තිවලට වඩා බෙහෙවින්ම අංග සම්පූර්ණ වූවකි. මීට විශෙෂ හේතුවක් වනුයේ නව ප්‍රජාතන්ත්‍රය පිළිබඳ අප පක්ෂයේ න්‍යාය, වැඩ සටහන සහ භාවිතය ආචාර්ය සුන්ගේ ඇවෑමෙන් පසු ගෙවුණු විසි වසර තුළ චීන විප්ලවයේ වර්ධනයත් සමග මහත් සේ වර්ධනය වී ඇති හෙයිනුත් එය තවදුරටත් වර්ධනය වන හෙයිනුත්ය. කෙසේ වුවද හරය වශයෙන් ගත් විට මේ ත්‍රිවිධ ජනතා පිළිවෙත කලින් තිබුණු පැරණි ත්‍රිවිධ ජනතා පිළිවෙත මෙන් නොව, නව ප්‍රජාතන්ත්‍රවාදී වැඩ සටහනකි. ස්වභාවයෙන්ම ඒවා ''වර්තමාන

චීනයට අවශ්‍ය'' දැය. එම නිසා ස්වභාවයෙන්ම ''අප පක්ෂය ඒවා සහමුළින් ක්‍රියාවට නංවනු සඳහා සටන් කිරීමට සූදනම්ය'' චීන කොමියුනිස්ට්වාදීන් වන අප අපගේ පක්ෂයේ අඩුම වැඩ සටහන සඳහා ගෙන යන අරගලය සහ ආචාර්ය සුන්ගේ විප්ලව වාදී, හෙවත් අළුත් ත්‍රිවිධ පිළිවෙත සඳහා ගෙන යන අරගලය සලකන්නේ මූලික වශයෙන් (සෑම අංශයකින් නොවූවත්) එකම අරගලයක් ලෙසිනි. එම් නිසා අතීතයේදී සහ වර්තමානයේදී මෙන්ම අනාගතයේදීද කොමියුනිස්ට්වාදීන් විප්ලවවාදී ත්‍රිවිධ ජනතා පිළිවෙත අතිශය අවංකව හා තරයේ ක්‍රියාත්මක කරන්නා වූ පිරිස බව ඔප්පු වනු ඇත.

කොමියුනිස්ට් පක්ෂය බලයට පත් වූ පසු රුසියාවේ ආදර්ශය අනුව යමින් නිර්ධන පංතික ආඥාදායකත්වය සහ ඒක පාක්ෂික ක්‍රමයක් පිහිටුවනු ඇතැයි සමහරු සැක පහළ කරති. ප්‍රජාතන්ත්‍රවාදී පංතිවල මිත්‍ර සහයෝගය මත පදනම් වූ නව ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යය මූල ධර්ම අතින් නිර්ධන පංතික ආඥාදායකත්වය යටතේ පවත්නා සමාජවාදී රාජ්‍යයකට වඩා වෙනස් බව ඊට අප දෙන පිළිතුරයි. නිසැක වශයෙන්ම අපගේ නව ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය ගොඩ නගනු ලබන්නේ නිර්ධන පංතියේ සහ කොමියුනිස්ට් පක්ෂයේ නායකත්වය යටතේය. එහෙත් නව ප්‍රජාතන්ත්‍රවාදී අවධිය පවත්නා තුරු චීනයට ඒක පංතික ආඥාදායකත්වයක් හා ඒක-පාක්ෂික ආණ්ඩුවක් පිහිටුවිය නොහැක්කේය. ඒ සඳහා උත්සාහ කළ යුතුද නොවේ. කොමියුනිස්ට් පක්ෂයට සහයෝගය දෙන හා ඊට සතුරු නොවන සියලු දේශපාලන පක්ෂ, සමාජ කණ්ඩායම් සහ පුද්ගලයන් සමග සහයෝගයෙන් කටයුතු කිරීම අප විසින් ප්‍රතික්ෂෙප කිරීමට කිසිදු හේතුවක් නැත. රුසියානු ක්‍රමය හැඩ ගැසී ඇත්තේ රුසියානු ඉතිහාසයට අනුවය. රුසියාවෙහි මිනිසා විසින් මිනිසා සූරා කෑම සමාජ ක්‍රමයක් වශයෙන් අහෝසි කර තිබේ. නවතම ප්‍රජාතන්ත්‍රවාදී පන්නයක දේශපාලන, ආර්ථික හා සංස්කෘතික ක්‍රමයක්, එනම් සමාජවාදය, ක්‍රියාත්මක කර ඇත්තේය. ජනතාව විසින් අතික් සෑම සමාජවාද-විරෝධී පක්ෂයක් පිටුදක බොල්ෂෙවික් පක්ෂයට පමණක් සහයෝගය දෙනු ලැබේ. රුසියානු ක්‍රමය හැඩගැසී ඇත්තේ මේ හැම කරුණක් අනුවය. එරටට ඒ ක්‍රමය සම්පූර්ණ

LIBERATIONBASE

යෙන් අවශ්‍යය. සහමුලින් ගැලපේය. එහෙත් එකම දේශපාලන පක්ෂය වශයෙන් බෝල්ෂෙවික් පක්ෂය පමණක් ඇත්තාවූ රුසියාවෙහි පවා රාජ්‍ය බල සංවිධානවල තවම ක්‍රියාත්මක වනුයේ කම්කරුවන්ගේ, ගොවීන්ගේ හා බුද්ධිමතුන්ගේ මිත්‍ර සහයෝගයකි. පක්ෂ සාමාජිකයන්ගේ සහ පක්ෂයට අසම්බන්ධ ජනයාගේ මිත්‍ර සහයෝගයකි. ඒ මිස එහි ඇත්තේ කම්කරු පංතිය හා බෝල්-ෂෙවික් පක්ෂය පමණක් ආණ්ඩු ආයතන තුළ ක්‍රියාකාරී වන ක්‍රමයක් නොවේ. වර්තමාන අවධිය සඳහා අවශ්‍ය චීන ක්‍රමය සැකසී ඇත්තේ චීන ඉතිහාසයේ වර්තමාන අවධියට ගැලපෙන පරිද්දෙනි. දිගු කලක් යන තුරු විශේෂ ක්‍රමයක රාජ්‍ය හා දේශපාලන බලයක් පවතිනු ඇත. එය රුසියානු ක්‍රමයට වෙනස් එකක් වන මුත් අපට සහමුලින් අවශ්‍ය හා ගැලපෙන ක්‍රමයකි. එනම් ප්‍රජාතන්ත්‍රවාදී පංතිවල මිත්‍ර සහයෝගය මත පදනම් වූ නව ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය ක්‍රමයයි.

LIBERATIONDBASE

අපේ විශේෂ වැඩ සටහන

මේ පොදු වැඩ සටහන මත පදනම් කොට ඒ ඒ අවධිය සඳහා විශේෂ වැඩ සටහනක්ද අප පක්ෂයට තිබිය යුතුය. අපේ නව ප්‍රජාතන්ත්‍රවාදී පොදු වැඩ සටහන ධනපති ප්‍රජාතන්ත්‍රවාදී විප්ලව සමය පුරා-එනම් අවුරුදු විසි-තිස් ගණනක් ගෙවෙන තුරු නොවෙනස්ව පවතිනු ඇත. එහෙත් මේ අවධියේ ඒ ඒ වකවානුව තුළදී තත්වයන් වෙනස් වී තිබෙනු ඇත. නොඑසේ නම් වෙනස් වෙමින් පවතිනු ඇත. එනිසා ඒ වෙනස්වීම් අනුව අපගේ විශේෂ වැඩ සටහන වෙනස් කිරීමට සිදුවීම ස්වාභාවිකය. නිදසුනක් දක්වතොත් උතුරු යුද ගමන, ගොවි ජන විප්ලවකාරී යුද්ධය, ජපන් විරෝධී ප්‍රතිප්‍රහාරක යුද්ධ යන සමයන්හිදී අපේ පොදු වැඩ සටහන නොවෙනස්ව පැවැති මුත් අපගේ විශේෂ වැඩ සටහනෙහි වෙනස්කම් සිදු කෙරිණි. ඊට හේතුව මේ වකවානු තුන තුළදී අපගේ මිතුරන් සහ සතුරන් ඒකාකාර නොවූ හෙයිනි.

චීන ජනතාව දැන් මුහුණ පාන තත්වය මෙබඳුය:

(1) ජපන් ආක්‍රමණිකයන් තවම පරාජයට පත් කර නැත.

(2) ජාතික සමගිය උදකර ගනු සඳහා චීන ජනතාව

වහාම එක්සත් වී ක්‍රියා කළ යුතුය. සියලු ජපන් විරෝධී බල වේග සීග්‍රයෙන් එක්සත් කොට සංවිධාන කොට අපගේ මිත්‍ර රටවල සහයෝගය ඇතිව ජපන් ආක්‍රමණිකයන් පරාජය කළ යුතුය.

(3) කුඕමින්තාන ආණ්ඩුව ජාතික සමගිය කඩා කප්පල් කොට එබඳු ප්‍රජාතන්ත්‍රවාදී විපර්යාසයකට බාධා කරයි.

මේ තත්වයනට ගැලපෙන පරිද්දෙන් අප ඉදිරිපත් කරන විශේෂ වැඩ සටහන කුමක්ද? වෙන වචන වලින් කියතොත් ජනතාවගේ ක්ෂණික ඉල්ලීම් කවරේද?

පහත සඳහන් දෑ සුදුසු හා අඩුම තරමේ ඉල්ලීම් යයි අපි කල්පනා කරමු:

ජපන් ආක්‍රමණිකයන් තරයේ පරාජය කරනු සඳහාත්, මිත්‍ර රටවල සහයෝගය ඇතිව ජාත්‍යන්තර සහයෝගය ගොඩ නගනු සඳහාත් තිබෙන සියලු බලවේග සංවිධාන කරනු;

කුඕමින්තානයේ ඒකපාක්ෂික ඒකාධිපත්‍යය පෙරළා දමා ප්‍රජාතන්ත්‍රවාදී සභාග ආණ්ඩුවක් සහ ඒකාබද්ධ හමුද සෙන්පති මණ්ඩලයක් පිහිටුවනු.

ජනතාවට හා ජාතික සමගියට සතුරුකම් කරන ජපනාට හිතවත් පුද්ගලයනට, පැසිස්ට්වාදීන්ට සහ පරාජිතවාදීන්ට දඬුවම් කොට ජාතික සමගිය ගොඩ නැගීමට රුකුල් දෙනු;

සිවිල් යුද්ධයක අන්තරාය ඇති කරන ප්‍රතිගාමීන්ට දඬුවම් කොට අභ්‍යන්තරික සාමය සහතික කිරීමට රුකුල් දෙනු;

දේශද්‍රෝහීන්ටත්, සතුරාට යටත්වන නිලධාරීන්ටත්, ජපන් ඔත්තුකාරයන්ටත් දඬුවම් කරනු.

ප්‍රතිගාමී රහස් ඔත්තු සේවය සහ එහි සියලු මර්දනකාරී කටයුතු අහෝසි කර දමනු; වධ කඳවුරු නැතිකර දමනු; කතා කිරීමේ, ලිවීමේ, රැස්වීමේ, සංගම් පිහිටුවීමේ, දේශපාලන මත දැරීමේ, ආගම් ඇදහීමේ, ජනතා නිදහස සහ පෞද්ගලික නිදහස

මැඩලනු සඳහා පනවා ඇති සියලු ප්‍රතිගාමී නීති සහ ආඥා අවලංගු කොට ජනතාවගේ සම්පූර්ණ සිවිල් අයිතිවාසිකම් සහතික කරනු;

සියලු ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂවල සහ කණ්ඩායම්වල නීත්‍යානුකූල තත්වය පිළිගනු;

සියලු දේශප්‍රේමී දේශපාලන සිරකරුවන් මුදා හරිනු; චීනයේ විමුක්ති ප්‍රදේශ වටලාගෙන සිටින සියලු සේනාංක ඉවත් කර ගෙන ඔවුන් ජපන් විරෝධී යුද පෙරමුණට යවනු;

ජපන් විරෝධී ආයුධ සන්නද්ධ හමුදවන් සහ චීනයේ විමුක්ති ප්‍රදේශවල පවත්නා මහජනයා තෝරාපත් කරගත් ආණ්ඩු පිළිගනු.

විමුක්ති ප්‍රදේශ සහ එහි හමුදවන් තහවුරු කරනු. ව්‍යාප්ත කරනු. නැති වූ බිම් පෙදෙස් ආපසු අල්ලා ගනු; ආයුධ සන්නද්ධ කැරලි ගසනු සඳහා රහස් හමුද සංවිධාන කිරීමට ජපනාට යටත් පෙදෙස්වල ජනයාට උදව් වෙනු;

චීන ජනතාවට ආයුධ සන්නද්ධ වීමටත්, එසේ කර තම ගෙවල් දෙරවල් සහ රට රැක ගැන්මටත් ඉඩ දෙනු;

කෙලින්ම කුඕමින්තානයේ ප්‍රධාන අණසක යටතේ පවත්නා නිතර සටන් වලින් පරදින, ජනතාව පීඩාවට ලක් කරන, කෙලින්ම එම අණසක යටතේ නොපවත්නා හමුදවලට වෙනස්කම් කරන හමුදවන් දේශපාලන හා යුද්ධමය වශයෙන් පරිවර්තනයකට ලක් කරනු. එබඳු විනාශදයක පරාජයනට වගකිවයුතු අණ දෙන නිලධාරින්ට දඬුවම් කරනු.

හමුද නිලධාරීන් හා භටයන් බඳවා ගැනීමේ ක්‍රමය හා ඔවුන්ගේ ජීවන තත්වය නංවනු.

ජපන් විරෝධී යුද පෙරමුණේ සටන් කරන නිලධාරීන්ට හා භටයන්ට ගෙදර දෙරේ ප්‍රශ්න ගැන කරදර නොවී සිටිය හැකි වන පරිදි ඔවුන්ගේ පවුල්වලට විශෙෂ සැලකිලි දක්වනු.

අනතුරට පත්වන භටයන්ට සහ රට වෙනුවෙන් දිවි පුදන භටයන්ගේ පවුල්වළට විශෙෂ සැලකිලි දක්වනු. යුද්ධයෙන් ඉවත් වූ භටයන්ට පැලපදියන් වී ජීවනෝපායක් සලසා ගැනීමට උදව් වෙනු. යුද්ධය කර ගෙන යෑම පහසුවෙන පරිද්දෙන් යුද කර්මාන්ත දියුණු කරනු;

මිත්‍ර රටවලින් ලැබෙන යුද්ධාධාර සහ ආර්ථික ආධාර ප්‍රතිප්‍රහාරක යුද්ධයට සහභාගී වී සිටින සියලු හමුදවනට අපක්ෂග්‍රාහීව බෙද දෙනු; දූෂිත නිලධාරීන් පන්නා පාලනය පිරිසිදු කරනු; මධ්‍යම හා පහළ ශ්‍රෙණියේ රජයේ සේවකයන්ගේ පඩි වැඩි කරනු;

චීන ජනතාවට ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් පිරිනමනු; පීඩාකාරී පාඕ-චියා ක්‍රමය[6] විනාශ කරනු; යුද අන්තරායනට සහ ස්වාභාවික විපත්ති වලින් අනතුරට පත්වූවනට සහනාධාර සලසනු. සතුරු ආක්‍රමණය යටතේ දුක් විඳි ජනතාවට පුළුල් ලෙස සහනය සලසනු සඳහා චීනයට අහිමි වූ බිම් පෙදෙස් ආපසු අල්ලා ගැනීමෙන් පසු සෑහෙන අරමුදලක් ලබා ගනු, අත්‍යාධික බදු සහ විවිධ අය කිරීම් නැති කර දමා ස්ථාවර ප්‍රගතිශීලී බද්දක් ඇති කරනු;

ග්‍රාමීය ප්‍රතිසංස්කරණ අරඹනු. බදු මිළ සහ පොලී අඩු කරනු, අඳ ගොවීන්ගේ අයිතිවාසිකම් රකිනු සඳහා සුදුසු පියවර ගනු, දුගී ගොවීනට අඩු පොලිය උඩ මුදල් ණයට දෙනු, ගොවි ද්‍රව්‍ය නිෂ්පාදනය අධික වන පරිදි ගොවීනට සංවිධාන වීමට දිරි දෙනු;

නිලධාරි ප්‍රාග් ධනය තහනම් කරනු;

වර්තමාන ආර්ථික පාලන ප්‍රතිපත්තිය අවලංගු කරනු;

හිතුමනාපේ මුදල් අච්චු ගැසීම සහ බඩුමිළ ඉහළ යාම මෙල්ල කරනු;

පෞද්ගලික කර්මාන්තවලට ආධාර කරනු; ඒවාට ණය ලබා ගැනීමේ පහසුකම් සලසනු; අමුද්‍රව්‍ය ලබා ගැනීමට හා නිෂ්පාදිත භාණ්ඩ අලෙවිකර ගැනීමට පහසුකම් සලසනු;

LIBERATIONBASE

කම්කරුවන්ගේ ජීවන තත්වය නංවනු, රක්ෂා රහිතවූවනට සහනය සලසනු, කාර්මික නිෂ්පාදනය අධික වීමට රැකවල් ලැබෙන පරිද්දෙන් කම්කරුවනට සංවිධානවීමට උදව්වෙනු;

අධ්‍යාපන මාධ්‍යය ඔස්සේ කුඕමින්තානයේ මත පතුරාලීම වලකා ජාතික, විද්‍යානුකූල හා මහජන සංස්කෘතියක්, අධ්‍යාපන ක්‍රමයක් ඇති කරනු, ගුරුවරුන්ගේ සහ අධ්‍යාපන ආයතනවල අනිකුත් මණ්ඩලීය සේවකයන්ගේ ජීවනෝපාය සහතික කරනු, ශාස්ත්‍රීය නිදහස සහතික කරනු; තරුණයන්ගේ, කාන්තාවන්ගේ සහ දරුවන්ගේ සුබසෙත රැක දෙනු, තරුණ ශිෂ්‍ය අනාථයනට ආධාර සපයනු, යුද ප්‍රයත්නයට හා සමාජ ප්‍රගතියට ප්‍රයෝජනවත් සෑම කටයුත්තකදී සමාන තත්වයක හිඳ, සහභාගී විය හැකි වන පරිදි තරුණයනට හා කාන්තාවනට සංවිධාන වීමට රුකුල් දෙනු, විවාහවීමේ නිදහස සහතික කරනු, පුරුෂ–කාන්තා දෙපක්ෂය අතර සමානතාවය සහතික කරනු, තරුණයන්ට හා දරුවන්ට ප්‍රයෝජනවත් අධ්‍යාපනයක් සපයනු; චීනයේ සුළු ජාතීන්ට වඩා හොඳින් සලකනු, ඔවුනට ස්වයංපාලන අයිතිය දෙනු, විදෙස්ගත චීනුන්ගේ සුබසෙත රකිනු, පෙරළා මව් රටට අවුත් සිටිනවුන්ට ආධාර කරනු; ජපන් පීඩනය නිසා චීනයට පලා අවුත් සිටින විදේශීන් ආරක්ෂා කරනු, ජපන් ආක්‍රමණිකයනට විරුද්ධව ඔවුන් ගෙන යන අරගලයට රුකුල් දෙනු; චීන–සෝවියට් සබඳතා වැඩි දියුණු කරනු.

මේ ඉල්ලීම් ඉටුකරගනු සඳහා කළයුතු ඉතාම වැදගත් දෙය නම් කුඕමින්තානයේ ඒකපාක්ෂික ඒකාධිපතිත්වය බිඳ හෙලා ප්‍රජාතන්ත්‍රවාදී තාවකාලික, මධ්‍යම ආණ්ඩුවක් – මුළු ජාතියේ සහයෝගය ලබන්නාවූද, ජපන් විරෝධී සියලු පක්ෂවල හා පක්ෂ වලට අසම්බන්ධ ජනයාගේ නියෝජිතයන්ගෙන් සැදුම්ලත් සභාග ආණ්ඩුවක් පිහිටුවීමයි.

මේ පූර්ව අවශ්‍යතාවය ඉටු නොකළහොත් කුඕමින්තාන ප්‍රදේශවල කිසිදු නියම පෙරළියක් සිදුකළ නොහැක. එනිසා මුළු රට සමස්තයක් ලෙසින් ගත්විට එහිද නියම පෙරළියක් සිදු කළ නොහැක.

මේ ඉල්ලීම් වලින් චීන මහජනතාවගේ සහ මිත්‍ර රටවල ප්‍රජාතන්ත්‍රවාදී පුළුල් ජන කොටස්වල සිතුම් පැතුම් ප්‍රකාශයට පත්වේ.

සියලු ජපන් විරෝධී ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂවල අනුමැතිය ලබන අඩුම තරමේ විශෙෂ වැඩ සටහනක් කිසිසේත් නැතිවම බැරිය. ඉහත සඳහන් වැඩ සටහන පදනම් කරගෙන අනිකුත් පක්ෂ සමග සාකච්ඡා පැවැත්වීමට අප සූදානම්ය. විවිධ පක්ෂ විවිධ ඉල්ලීම් ඉදිරිපත් කළහැක. එහෙත් සියලු පක්ෂ පොදු වැඩ පිළිවෙලකට එකඟ විය යුතුය.

කුඕමින්තාන ප්‍රදේශ සම්බන්ධයෙන් එබඳු වැඩ සටහනක් තවම පවත්නේ ජනතා ඉල්ලීමක තත්වයෙහිය. ජපනාට යටත් ප්‍රදේශවල එබඳු වැඩ සටහනක් ක්‍රියාත්මක කළ හැක්කේ ආයුධ සන්නද්ධ කැරලි ගැසීම් සඳහා රහස් හමුද සංවිධාන කිරීම පිළිබඳ කරුණ හැර–එම ප්‍රදේශ මුදගත් පසු පමණි. විමුක්ති ප්‍රදේශවල නම් මේ වැඩ සටහන දැනටමත් ක්‍රියාත්මක කර තිබේ. ක්‍රියාත්මක කරමින් තිබේ. ඉදිරියටත් ක්‍රියාත්මක කරනු ලැබේ.

ඉහත සඳහන් කරන ලද චීන ජනතාවගේ ක්ෂණික ඉල්ලීම් හෙවත් විශෙෂ වැඩ සටහන වැඩිදුරටත් පැහැදිලි කළ යුතු අන්දමේ යුද්ධකාලීන හා පශ්චාත් යුද කාලීන ප්‍රශ්න වලින් යුක්තය. මේ ප්‍රශ්න ගැන පහත කෙරෙන විස්තරයේදී කුඕමින්තානයේ ප්‍රධාන පාලක කල්ලිය දරණ වැරදි මත කිහිපයක් විවේචනය කරන ගමන් තව සමහරුන් නගන ප්‍රශ්නවලටද පිළිතුරු සපයන්නෙමු.

LIBERATIONBASE

1. ජපන් ආක්‍රමණිකයන් සහමුලින් පරාජය කරනු, අතරමග සම්මුතියකට ඉඩ නොදෙනු.

ජපන් අධිරාජ්‍යවාදීනට කොන්දේසි විරහිතව යටත් වීමට සිද්ධ කළ යුතුය යි කයිරෝ සම්මේලනය[7] ගත් තීරණය නිවැරදි එකකි. එහෙත් දැන් ජපන් ආක්‍රමණිකයෝ සම්මුති සාමයකට එළඹීමට රහසේ කටයුතු කරති. මේ අතර කුඕමින්තානය එහි සිටින ජපන් පාක්ෂික කොටස් රූකඩ නැන්කින් ආණ්ඩුව ඔස්සේ ජපානයේ රහස් දූතයන් සමග සබඳකම් පවත්වති. මෙසේ කිරීම අතහැර දමා නැත. එනිසා අතරමග ඇතිවිය හැකි සම්මුති සාමයක අනතුරු මුළුමනින් පහව් නැත. කයිරෝ සම්මේලනය තවත් හොඳ තීරණයක් ගත්තේය. එනම් ඊශානදිග පළාත් සතර, තායිවානය සහ පෙංගු දූපත් ආපසු චීනයට පැවරිය යුතු බවයි. එහෙත් කුඕමින්තාන ආණ්ඩුවේ මෑත කාලීන ප්‍රතිපත්ති දෙස බලන විට යාලු ගඟ දක්වා සටන් කොට අපගේ නැතිවූ සියළු බිම් පෙදෙස් ආපසු අත්කර ගැනීමට එම ආණ්ඩුව වෙහෙසෙතැයි විශ්වාස කළ නොහැක. මෙබඳු තත්වයක් යටතේ චීන ජනතාව කළ යුත්තේ කුමක්ද? කුඕමින්තාන ආණ්ඩුව ජපන් ආක්‍රමණිකයන් සහමුලින් විනාශ කළ යුතු බවත්, අතරමග සම්මුතියකට ඉඩ නොදිය යුතු බවත් ඔවුන් කියා සිටිය යුතුය. සම්මුතියකට එළඹීමට දරණ සෑම කූට ප්‍රයත්නයක් අහෝසි කළ යුතුය. කුඕමින්තාන ආණ්ඩුව දැනට අනුගමනය කරන අකර්මණ්‍ය විරෝධය පෑමේ පිළිවෙත වෙනස් කොට මුළු යුද බලය යොදා ජපානයට විරුද්ධව කාර්යශීලීව සටන් කළ යුතුයයි චීන ජනතාව ඉල්ලා සිටිය යුතුය. චීන ජනතාව තමන්ගේම හමුද — අටවෙනි මාර්ග හමුදව, නව සිව්වෙනි හමුදව සහ මහජනයාගේ සෙසු ආයුධ සන්නද්ධ බලකායන් — පුළුල් කළ යුත්තාහ.

සතුරා පැමිණ සිටින සෑම පෙදෙසක තමන්ගේම පුරෝගාමීත්වයෙන් ජපන් විරෝධී ආයුධ සන්නද්ධ හමුද පුළුල් ලෙස වර්ධනය කළ යුත්තාහ. තවද ඔවුහු මිත්‍ර රටවල සෘජු සහයෝගය ඇතිව සටන් කොට නැතිවූ සියළු පෙදෙස් ආපසු අල්ලා ගැනීමට සූදනම් විය යුත්තාහ. කිසිම හේතුවක් නිසා ඔවුන් තනිකර කුඕමින්තානය කෙරෙහි විශ්වාසය නොරැඳිය යුතුය. ජපන් ආක්‍රමණිකයන් පරාජය කිරීම චීන ජනතාව සතු ශුද්ධමය යුතු කමෙකි. ප්‍රතිගාමීහු ඔවුන්ට මේ අයිතිය අහිමි කිරීමට උත්සාහ දරත් නම්, ඔවුන්ගේ ජපන් විරෝධී වැඩ කටයුතු මර්ධනය කිරීමට හෝ ඔවුන්ගේ ශක්තිය හීන කිරීමට තැත් කරත් නම් එවිට චීන ජනතාව සවකීය ආත්මාරක්ෂාව පතා හොඳින් කියා ඔවුන් නමා ගත නොහැකි නම් දැඩි ප්‍රතිප්‍රහාරයක් එල්ල කළ යුතුය. මන්ද යත් ප්‍රතිගාමීන්ගේ එබඳු ජාතිද්‍රෝහී ක්‍රියාවලින් සිදුවන එකම දෙය ජපන් ආක්‍රමණිකයනට අනුබල ලැබීම පමණි.

LIBERATIONBASE

2. කුඕමින්තානයේ ඒකපාක්ෂික ඒකාධිපත්‍යය විනාශ කරනු, ප්‍රජාතන්ත්‍රවාදී සභාග ආණ්ඩුවක් පිහිටුවනු.

ජපන් ආක්‍රමණිකයන් අතුගා දමනු සඳහා රටපුරා ප්‍රජාතන්ත්‍ර ප්‍රතිසංස්කරණයන් ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ. එහෙත් කුඕමින්තානයේ ඒක පාක්ෂික ආඥාදායකත්වය අහෝසි කොට ප්‍රජාතන්ත්‍රවාදී සභාග ආණ්ඩුවක් පිහිටුවන තුරු ඒ අවශ්‍යතාවය ඉටු කළ හැකි නොවේ.

කුඕමින්තානයේ ඒකපාක්ෂික ආඥාදායකත්වය වූකලී ඇත්ත වශයෙන්ම කුඕමින්තානය තුළ සිටින ජනතා විරෝධී කල්ලියේ ආඥාදායකත්වය යි. චීනයේ ජාතික සමගිය කඩාකප්පල් කරන්නේ මේ ආඥාදායකත්වයයි. යුද්ධයේදී කුඕමින්තාන සටන් පෙර මුණ ලබන පරාජයන්හි කර්තෘවරයාද මේ ආඥාදායකත්වයයි. චීන ජනතාවගේ ජපන් විරෝධී බලවේග සංවිධාන කිරීමට හා එක්සත් කිරීමට බාධකයක්ව පවත්නේ මේ ආඥාදායකත්වයයි. ප්‍රතිප්‍රහාරක යුද්ධය කෙරෙද්දී පුරා අවුරුදු අටක් තුළ ලත් කටුක අත් දැකීම් නිසා චීන ජනතාව මේ ආඥාදායකත්වයේ දුෂ්ඨතාවයන් ගැන හොඳාකාරව දනිති. එම නිසා ස්වභාවයෙන්ම ඔවුහු මේ ආඥාදායකත්වය විනාශ කළ යුතුයයි ඉල්ලා සිටිති. සිවිල් යුද්ධය බෝකරනු ලබන්නේද මේ ප්‍රතිගාමී ආඥාදායකත්වය විසිනි. එය වහාම විනාශ නොකළහොත් සිවිල් යුද්ධයක නස්පැත්තිය නැවතත් ඔවුන්ගේ හිස මත කඩා වැටෙනු ඇත.

ජනතා විරෝධී ආඥාදායකත්වය විනාශ කළ යුතුයයි චීන ජනතාව කරන උද්ඝෝෂණය කෙතරම් පුළුල් ලෙස පැතුරුණා

වූ බරපතල වූ උද්ඝෝෂණයක්ද කිවහොත් ‘‘දේශපාලන භාරකාරත්වය ඉක්මනින් අවසාන කරන’’ බවට ප්‍රසිද්ධියේ එකඟ වීමට කුඕමින්තාන බලවතුන්ටම සිදුවී තිබේ. මහජන සම්මානය සහ සහයෝගය අතින් මේ ‘‘දේශපාලන භාරකාරත්වය’’ හෙවත් ඒකපාක්ෂික ආඥාදායකත්වය කෙතරම් බංකොලොත් වී තිබේදැයි එයින්ම පැහැදිලි වේ. ‘‘දේශපාලන භාරකාරත්වය’’ හෙවත් ඒකපාක්ෂික ආඥාදායකත්වය කිසිසේත් මැනවැයි හෝ විනාශ නොකළ යුතුයි හෝ ‘‘අවසන් කළ’’ යුතු නැතැයි හෝ තරයේ කියා සිටින එකද පුද්ගලයෙක්වත් චීනයෙහි නොමැත. එය තත්වයෙන් ලොකු වෙනසක් සිදුවී තිබෙන බවට ලකුණකි.

‘‘අවසන් කළ’’ යුතු බව ස්ථිරය, සැකයෙන් තොරය. එය වහාම අවසාන කර දමූ තාවකාලික ප්‍රජාතන්ත්‍රවාදී සභාග ආණ්ඩුවක් පිහිටුවනුයි සමහරු කියති. ටිකක් පමාවී ‘‘ජාතික මන්ත්‍රණ සභාව’’ රැස්කොට, ‘‘රාජ්‍ය බලය’’ සභාග ආණ්ඩුවකට නොව ‘‘ජනතාවට ආපසු බාර දිය යුතුය’’ යි තවත් පිරිසක් කියති.

මෙහි තේරුම කුමක්ද? එහි තේරුම වැඩේ කරන ක්‍රම දෙකක් තිබෙන බවයි.— එනම් අවංක ක්‍රමය සහ වංක ක්‍රමයයි.

පළමුව අවංක ක්‍රමය ගැන සලකා බලමු. අවංක ක්‍රමය නම් කුඕමින්තානයේ ඒක පාක්ෂික ආඥාදායකත්වය විනාශ කොට කුඕමින්තානයේ, කොමියුනිස්ට් පක්ෂයේ, ප්‍රජාතන්ත්‍රවාදී සංගමයේ සහ පක්ෂ සම්බන්ධතාවයක් නැති ජනතාවගේ නියෝජිතයන්ගෙන් සැදුම් ලත් තාවකාලික මධ්‍යම ආණ්ඩුවක් පිහිටුවාලීමත් අප විසින් ඉහත දක්වන ලද අන්දමින් ජාතික සමගිය යළි ගොඩනංවා ජපන් ආක්‍රමණිකයන් පරාජය කිරීමේ අරමුණ ඇතිව චීන ජනතාවගේ ක්ෂණික ඉල්ලීම් ඉටුවන අන්දමේ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනමය ක්‍රියාකාරී වැඩසටහනක් ආරම්භ කිරීමත්ය. මේ කරුණු ගැන සාකච්ඡා කරනු සඳහා විවිධ පක්ෂ වල හා පක්ෂවලට අසම්බන්ධ ජනයාගේ නියෝජිතයන්ගෙන් යුත් සම්මේලනයක් පවත්වා ඒ ගැන එකඟතාවයකට එළඹී ඒ අනුව ක්‍රියාකාරී විය යුතුය. චීන ජනතාවගේ දෘඪතම සහයෝගය ලබන සමගි මාවත මෙයයි. දෙවනුව සලකා බැලිය යුතු වංක ක්‍රමයයි. වංක ක්‍රමය නම් බහු ජනතාවගේ සහ සියළු ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ

LIBERATIONBASE

වල ඉල්ලීම නොසලකා හැරීමත් කුඹමින්තානයේ ජනතා විරෝධී කල්ලිය විසින් මෙහෙයවනු ලබන ඊනියා ජාතික මන්ත්‍රණ සභාව කැඳවා ''ආණ්ඩු ක්‍රම නීති පද්ධතියක්'' සම්මත කරගත යුතුයයි කියා සිටීමත්ය. මේ ආණ්ඩුක්‍රම නීති පද්ධතිය ක්‍රියාත්මක වීමේදී ප්‍රජාතන්ත්‍ර විරෝධී එකක් වනු ඇත. එවිසින් මේ කල්ලියේ ආඥාදයකත්වයෙහි සුදු හුණු ගෑමක් කරනු ඇත. කුඹමින්තාන නිලධාරීන් අතලොස්සක් පත්කොට පිහිටුවන ලද්දවූද, මහජනයා මත බලහත්කාරයෙන් පටවන ලද්දවූද, කිසිසේත් මහජන මතය උඩ පදනම් නොවූද පෞද්ගලිකව පිහිටුවාගත් ආණ්ඩුවක් වන නීති විරෝධී ''ජාතික ආණ්ඩුව'' නීත්‍යානුකූල භාවය නමැති වෙස්වලාවෙන් සැරසීම එමගින් කෙරෙන සේවය වේ. මේ අනුව බලන විට ''රාජ්‍ය බලය ආපසු මහජනයා අතට පැවරීම'' යන මුවාවෙන් ඇත්තවශයෙන්ම කෙරෙනුයේ කුඹමින්තානයේ ඒ ප්‍රතිගාමී කල්ලියටම බලය ''ආපසු පැවරීමයි''. මීට එරෙහි වන යමෙක් වෙත්නම් ඔහුට විරුද්ධව ''ප්‍රජාතන්ත්‍රය'' හා ''සමගිය'' කඩාකප්පල් කිරීමේ චෝදනාව නගා ඔහුට දඬුවම් කිරීමට එය ''සමාවට කරුණක්'' කරගනු ලැබේ. කඩාකප්පල්කාරී මාවත මෙයයි. මීට චීන ජනතාව තරයේ විරෝධය පානු ඇත.

අපේ ප්‍රතිගාමී වීරයන් මේ හෙදකාරී පිළිවෙතට අනුව ගැනීමට යන පියවරින් ඔවුන්ගේම විනාශයට මගපැදෙන්නේය. ඔවුහු සිය ගෙලවටා තොණ්ඩුව දමාගෙන එය හිරකර ගනිමින් සිටිත්. ''ජාතික මන්ත්‍රණ සභාව'' මේ තොණ්ඩුවයි. පළමුව සභාග ආණ්ඩුවක් ඇතිවීම වැලකීමටද, දෙවනුව සවකීය ආඥාදයකත්වය පවත්වාගෙන යෑමටද, තෙවනුව සිවිල් යුද්ධය යුක්ති සහගත බවට සමාවට කරුණක් සූදනම් කර ගැනීමටද ''ජාතික මන්ත්‍රණ සභාව'' මැජික් පොල්ලක් ලෙසින් පාවිච්චි කිරීම ඔවුන්ගේ අභිප්‍රායයි. එහෙත් ඉතිහාසයෙහි ගමන් විලාශය ඔවුන්ගේ සිතැඟිවලට පට හැනිය. ඔවුන් මේ කරන්නේ ''තමන්ගේම කකුල උඩ දමා ගනු සඳහා ගලක් ඉස්සීමයි. ''ඒ මන්දයත්, කුඹමින්තාන පෙදෙස්වල වෙසෙන ජනතාවට නිදහස නැති බවත්, ජපනාට යටත් පෙදෙස්වල වෙසෙන ජනයාට මැතිවරණයකට සහභාගි නොවිය හැකි බවත්, නිදහස භුක්ති විඳින විමුක්ති පෙදෙස් කුඹමින්තානය විසින් නොපිළිගන්නා බවත් දන් සියල්ලන්ටම පැහැදිලි වී තිබේ. තත්වය

මෙබඳු නම් ජාතික නියෝජිතයන් කෙසේ තෝරා ගත හැකිද? ''ජාතික මන්ත්‍රණ සභාවක්'' කෙසේ ඇතිවිය හැකිද? ඔවුන් මේ පිහිටුවිය යුතුයයි ඝෝෂා කරන්නේ මීට අට වසරකට පෙර සිවිල් යුද්ධය සමයෙහි කුඹමින්තාන ආඥාදයකත්වය විසින් සෑම සුළු කරුණක් අතින් පවා තමන්ට උවමනා අන්දමට වංචාකාරීව හැඩ ගසා ගන්නා ලද ''ජාතික මන්ත්‍රණ සභාව''කි. එබඳු මන්ත්‍රණ සභාවක් කැඳවතොත් මුළු ජාතිය අනිවාර්යයෙන්ම ඊට රැහැනිව නැගී සිටිනු ඇත, අපේ ප්‍රතිගාමී වීරයන් ඒ අකරතැබ්බයෙන් ගැලවෙන්නේ කෙසේදැයි ප්‍රශ්න කළ යුතුය. කොටින් කියතොත් ව්‍යාජ ජාතික මන්ත්‍රණ සභාව කැඳවීමෙන් ඔවුන්ගේම විනාශයට මගපැදෙනු ඇත. කුඹමින්තානයේ ඒකපාක්ෂික ආඥාදයකත්වය කෙළවර කරනු සඳහා කොමියුනිස්ට්වාදීන් වන අපි පියවර දෙකක් යෝජනා කරමු. පළමුව, වත්මන් අවධිය සඳහා සියළු පක්ෂවල හා පක්ෂවලට අසම්බන්ධ ජනතාවගේ නියෝජිතයන්ගේ පොදු එකඟතාවය උඩ ගොඩනැගෙන තාවකාලික සභාග ආණ්ඩුවක් පිහිටුවිය යුතුය. දෙවනුව, ඊළඟ අවධියේදී බාධා රහිත නිදහස් මැතිවරණයක් මගින් තෝරා පත්කරගන්නා ජාතික මන්ත්‍රණ සභාවක් කැඳවා ස්ථිර සභාග ආණ්ඩුවක් පිහිටුවිය යුතුය. මේ උභය අවධියෙහිම පවත්නේ වර්තමාන ජපන් විරෝධී සටනේදී සහ අනාගත ජාතික සංවර්ධනයේදී පොදු ප්‍රජාතන්ත්‍රවාදී වැඩපිළිවෙලක් උඩ එක්සත්ව ක්‍රියා කිරීමට කැමැති සියලු පංතිවල හා සියලු දේශපාලන පක්ෂවල නියෝජිතයන්ගෙන් සැදුම් ලත් සභාග ආණ්ඩුවකි.

කුඹමින්තානයේ හෝ අනිකුත් පක්ෂවල, කණ්ඩායම්වල හෝ පුද්ගලයන්ගේ අභිප්‍රායන් කුමක් හෝ වේවා, ඔවුන් ඊට කැමති හෝ අකැමති හෝ වේවා, ඔවුන් ඒ ගැන දැනගෙන සිටිනවා හෝ නොදැන සිටිනවා හෝ වේවා, චීනයට ගතහැකි එකම මාර්ගය මෙය වේ. මෙය ඓතිහාසික ධර්මතාවයකි. කිසිදු බලවේගයකට වෙනස් කළ නොහැකි ප්‍රවනතාවයකි.

මේ ප්‍රශ්නය සහ ජනසම්මතවාදී ප්‍රතිසංස්කරණයට අදාළ අනිකුත් ප්‍රශ්න සම්බන්ධයෙන් කොමියුනිස්ට්වාදීන් වන අප කියා සිටින්නේ, කුඹමින්තාන බලධරයන් තවමත් තම වැරදි පිළි

LIBERATIONBASE

වෙක්ගී දඩි ලෙස ඇලී ගැලී සිටියත්, ඔවුන් කල් අල්ලා ගැනීම සඳහා සහ මහජන මනස නලවනු සඳහා සාකච්ඡා පැවැත්වීම දඩමීමා කරගත්තත් වර්තමාන වැරදි පිළිවෙත් පිටුදක ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණවලට එකඟ වීමට ඔවුන් කැමැත්ත පළ කළ වහාම ඔවුන් සමග යළි සාකච්ඡා ඇරඹීමට අප සූදානම් බවයි. එහෙත් සාකච්ඡා පදනම් විය යුත්තේ ප්‍රතිප්‍රහාරය, සමගිය හා ප්‍රජාතන්ත්‍රය යන පොදු පිළිවෙත මතය. මේ පොදු පිළිවෙතින් බැහැර වූ කිසිදු ඊනියා පියවරකට, සැලැස්මකට හෝ පුහු ප්‍රකාශවලට – ඒවා කොතරම් ප්‍රියජනක පෙනීමකින් යුක්ත වුවත් – අපි එකඟ නොවන්නෙමු.

3. ජනතාවට නිදහස

දැනට චීන ජනතාවගේ විමුක්ති අරගලය මූලික වශයෙන් එල්ල වී ඇත්තේ ජපන් ආක්‍රමණිකයනට විරුද්ධවය. එහෙත් කුඕමින්තාන ආණ්ඩුව ඔවුන්ගේ නිදහස අහිමිකොට ඔවුන්ගේ අත දෙපය බැඳ තබා ජපන් ආක්‍රමණිකයනට විරුද්ධව සටන් කිරීමෙන් ඔවුන් වලකාලයි. මේ ප්‍රශ්නය විසඳන තුරු ජාතියේ සියලු ජපන් විරෝධි බලවේග එක්සත් කිරීම උගහටය. ඒක පාක්ෂික ඒකාධිපතිත්වය අහෝසි කිරීම, සභාග ආණ්ඩුවක් පිහිටුවීම, රහස් පොලිසිය විසුරුවා හැරීම, මර්දන නීති සහ ආඥා අවලංගු කිරීම, දේශද්‍රෝහීන්ට, ඔත්තුකාරයන්ට, ජපනාට පක්ෂ පුද්ගලයනට පැසිස්ට්වාදීන්ට සහ දූෂිත නිලධාරීන්ට දඬුවම් කිරීම, සියලුම ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂවල නීත්‍යානුකූලත්වය පිළිගැනීම, විමුක්ති ප්‍රදේශ වටලා සිටින හා ඊට පහරදෙන සේනාංක ඉවත්කර ගැනීම, විමුක්ති ප්‍රදේශ පිළිගැනීම, පාඩි–වියාක්‍රමය නැති කිරිමු ආදී ඉල්ලීම්ද ආර්ථිකයට, සංස්කෘතියට හා බහුජන ව්‍යාපාරයට අදළ නවත් ඉල්ලීම් ද අපගේ වැඩ සටහන මගින් ඉදිරිපත් කරන ලද්දේ ජපානයට විරුද්ධව සටන් කරනු සඳහා නිදහස ලැබෙන පරිද්දෙන් ජනතාවගේ සමගි බැමි තදකරන අභිප්‍රායෙනි. එක්සත් වී ප්‍රජාතන්ත්‍රය දිනාගන්නා අභිප්‍රායෙනි.

නිදහස වූ කලී ජනතාව විසින් අරගලය තුලින් අත්කරගන්නා දෙයකි. එය කිසිවෙක් තෑග්ගක් වශයෙන් නොපිරි නමත්. චීනයේ විමුක්ති ප්‍රදේශවල ජනතාව දැනටමත් නිදහස දිනාගෙන ඇති අතර අනිකුත් ප්‍රදේශවල ජනතාවටද නිදහස දිනාගත හැක්කේය. ඔවුන් නිදහස දිනාගත යුත්තේය. චීන ජනතාවගේ නිදහස වැඩිවූ තරමට, ඔවුන්ගේ සංවිධාන, ප්‍රජාතන්ත්‍රවාදී බලවේග, ශක්තිමත් වූ තරමට තාවකාලික හා එක්සත් සභාග ආණ්ඩුවක් පිහිටුවීමට ඇති ඉඩකඩ

පැවති පාලනය. මේ සභාග ආණ්ඩුව පිහිටෙව් පසු එය ජනතාවට නිදහස ලබාදී එමගින් සවකීය අඩිතාලම ශක්තිමත් කරගනු ඇත. ජපන් ආක්‍රමණිකයන් පෙරළා දැමීමෙන් පසු රටපුරා නිදහස් හා බාධාරහිත මැතිවරණයක් පැවැත්විය හැක්කේද ප්‍රජාතන්ත්‍රවාදී ජාතික මන්ත්‍රණ සභාවක් පිහිටුවිය හැක්කේද ස්ථිර, එක්සත් සභාග ආණ්ඩුවක් පිහිටුවිය හැක්කේද එයින් පසුව පමණි. ජනතාවට නිදහස තිබෙන තුරු ජාතික මන්ත්‍රණ සභාවක් හෝ ජනතාව විසින් ඇත්ත වශයෙන්ම තෝරා පත්කර ගන්නා ලද ආණ්ඩුවක් තිබිය නොහැක. මෙය පැහැදිලි නැත් ද?

කථා කිරීමේ, ලිවීමේ, රැස්වීමේ, සංගම් පිහිටුවීමේ, දේශපාලන මත දැරීමේ. ආගම් ඇදහීමේ නිදහස සහ පෞද්ගලික නිදහස ජනතාවගේ අතිශය වැදගත් නිදහස් අයිතිවාසිකම්ය. චීනයෙහි මේ නිදහස් අයිතිවාසිකම් සම්පූර්ණයෙන් ක්‍රියාත්මක වන්නේ විමුක්ති ප්‍රදේශ තුළ පමණි.

ආචාර්ය සුන් යත් සෙන් 1925 දී මරණ මංචකයේ හිඳගෙන නිකුත් කළ අන්තිම කැමැත්තෙහි මෙසේ සඳහන් වේ:

"චීනයට විමුක්තිය හා සමානතාවය දිනාගැනීමේ අරමුණ ඇතිව මම ජාතික විප්ලවීය ව්‍යාපාරයට සහභාගි වුනෙමි. මේ අරමුණ ඉටු කරගනු සඳහා බහුජනතාව පුබුදුවාලිය යුතු බවත්, අපට සමානතාවයෙන් සලකන සෙසු ලෝක ජාතීන් සමග පොදු සටනක් සඳහා එක්සත් විය යුතු බවත් මේ අවුරුදු හතළිහ තුළ මා ලබා ඇති අත්දැකීම්වලින් මට තරයේ ඒත්තු ගොස් තිබේ."

ආචාර්ය සුන්ගේ නිවට අනුගාමිකයන් ඔහු පාවාදී තිබේ. ඔවුහු ජනතාව පුබුදලනු වෙනුවට ඔවුන් පීඩනයට ලක් කරති. ඔවුන්ගේ කථාකිරීමේ, ලිවීමේ, රැස්වීමේ, සංගම් පැවැත්වීමේ දේශපාලන-ආගමික මත දැරීමේ සහ පෞද්ගලික නිදහස අහිමි කරති. ඔවුහු අවට තවම බහුජනතාව පුබුදු කරන්නාවූද ඔවුන්ගේ නිදහස හා අයිතිවාසිකම් සඳහා සටන් කරන්නාවූද කොමියුනිස්ට් පක්ෂයට අටවෙනි මාර්ග හමුදවට සහ නව සිව්වෙනි හමුදවට සහ විමුක්ති ප්‍රදේශවලට "දේශ ද්‍රෝහී පක්ෂය", "දේශ ද්‍රෝහී හමුදව" සහ "දේශද්‍රෝහී ප්‍රදේශ" යන නම් පටබඳිති. යුක්තිය අයුක්තිය නොපිට පෙරළී ඇති මේ තත්වය ඉක්මනින් වෙනස්වනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු.

4. ජනතාවගේ සමගිය

ජපන් ආක්‍රමණිකයන් පරාජය කරනු සඳහා, සිවිල් යුද්ධය වලකනු සඳහා, නව චීනයක් ගොඩනගනු සඳහා භේදවී ඇති චීනය එක්සත් චීනයක් බවට පත්කළ යුත්තේමය. මෙය චීන ජනතාවගේ ඓතිහාසික මෙහෙවර වේ.

එහෙත් චීනය එක්සත් කළ හැක්කේ කෙසේද? එය කළ යුත්තේ ආඥාදායකයකු විසින් කරනු ලබන බලහත්කාර සමගියක් මගින්ද? එසේ නැතහොත් ප්‍රජාතන්ත්‍රවාදී බහුජන සමගියක් මගින්ද? යු ආන් ශිහ්-කායිගේ[8] කාලයේ පටන් උතුරු පෙදෙසෙහි යුද්ධාධිපතියන් නැත්කළේ අත්තනෝමතික සමගියක් ඇති කිරීමටය. එහෙත් එහි ප්‍රතිඵලය වූයේ කුමක්ද? ඔවුන්ගේ අභිප්‍රායනට පටහැනිව යමින් සමගිය වෙනුවට භේද ඇතිවී අන්තිමේදී ඔවුහු බලයෙන් නෙරපුනහ. යු ආන් ශිහ් කායිගේ ක්‍රියාකලාපය අනුගමනය කරමින් කුඕමින්තානයේ ජනතා විරෝධී කල්ලිය අත්තනෝමතික ලෙස එක්සත් කරන්නට තැත්කර අන්තිමේදී අවුරුදු දහයක් පුරා සිවිල් යුද්ධයක් කළහ. මේ සටනේදී ඔවුන් ඕමෙයි[9] කඳු මුදුන කරා පසු බැස්ස අතර ජපන් ආක්‍රමණිකයෝ ඉදිරියට ආහ. එසේ වී තිබියදී දැන් ඔවුහු කඳු මුදුනේ හිඳගෙන අත්තනෝමතික එක්සත් කිරීම ගැන මොරගාති. ඔවුන් කෑගසන්නේ කාටද? දැනුම් තේරුම් ඇති, දේශප්‍රේමී කිසිදු චීන ජාතිකයෙක් ඔවුනට සවන් දෙයිද?

යුද්ධාධිපතීන්ගේ පාලනය යටතෙහි දහසය වසරක් ද, ඒකාධිපති කුඕමින්තාන පාලනය යටතෙහි දහ අට වසරක් ද ජීවත් වී ඇති ජනතාවට සෑහෙන අත්දැකීමක් ලැබී ඔවුන්ගේ දැස් පෑදී තිබේ ජනතාවට උවමනා කරන්නේ බහුජනතාවගේ මාර්ගයෙන් ඇති

LIBERATIONBASE

වන ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් කිරීමක් මිස ඒකාධිපතියකු අතින් සිදු කෙරෙන අත්තනෝමතික එක්සත් කිරීමක් නොවේ. කොමියුනිස්ට්වාදීන් වන අපි ජපන් විරෝධී ජාතික එක්සත් පෙරමුණු පිළිවෙත ඉදිරිපත් කළේ 1935 තරම් ඈත කාලයකදීය. එවක් පටන් අපි ඒ සඳහා සටන් කර ඇත්තෙමු. කුඕමින්තානය 1939 දී සවකීය ප්‍රතිගාමී ''වෙනත් පක්ෂවල වැඩ කටයුතු සීමා කිරීමේ පියවර'' ක්‍රියාත්මක කරමින් යටත්වීමේ, භේදවීමේ හා ආපස්සට යෑමේ ක්ෂණික අන්තරායන් ඇතිකරද්දී, කුඕමින්තාන් පාක්ෂිකයන් අත්තනෝමතිකලෙස එක්සත් කිරීමේ සවකීය න්‍යාය ගැන හඬතලද්දී, අපි නැවතත් මෙසේ ප්‍රකාශ කෙළෙමු.

ඇතිකළ යුත්තේ විරෝධය පෑම සඳහාවූ එක්සත් කිරීමක් මිස යටත්වීම සඳහාවූ එක්සත් කිරීමක් නොවේ. සහයෝගතාවය සඳහාවූ එක්සත් කිරීමක් මිස භේදවීම සඳහාවූ එක්සත් කිරීමක් නොවේ. ප්‍රගතිය සඳහා වූවක් මිස ආපස්සට යෑම සඳහා වූවක් නොවේ. නියම එක්සත් වීමක් වනුයේ ප්‍රතිප්‍රහාරය, සමගිය හා ප්‍රගතිය මත සඳහා වූවක් පමණකි. අන් කිසිම ආකාරයක එක්සත් කිරීමක් ප්‍රෝඩාවක් වන්නේය. හය අවුරුද්දක් ඉගෙවී ගොස් ඇතිමුත් තව මත් ප්‍රශ්නය එලෙසින්ම පවතී.

ජනතාවට නිදහස හා ප්‍රජාතන්ත්‍රය නොමැති විටෙක එක්සත් කිරීමක් තිබිය හැකිද? නැත. මේවා ඔවුනට හිමිවූ විගස එක්සත් වීම ඇතිවන්නේය. නිදහස ප්‍රජාතන්ත්‍රය හා සභාග ආණ්ඩුවක් සඳහා වීන ජනතාව ගෙනයන ව්‍යාපාරය ඒ සමගම එක්සත් වීම සඳහා ගෙනයන ව්‍යාපාරයක්ද වේ. අප විශේෂ වැඩ සටහන මගින් නිදහස ප්‍රජාතන්ත්‍රය පිළිබඳව ඉල්ලීම් සමගම සභාග ආණ්ඩුවක් පිළිබඳව ඉල්ලීම් ගණනාවක් ඉදිරිපත් කර ඇත්තේ ඒ නිසාය. ජනතා විරෝධී කුඕමින්තාන කල්ලියේ ඒකාධිපතිත්වය අහෝසි කොට ප්‍රජාතන්ත්‍රවාදී සභාග ආණ්ඩුවක් පිහිටුවන තුරු කුඕමින්තාන පෙදෙස්වල කිසිදු ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණයක් සිදු කිරීමට හෝ ජපන් ආක්‍රමණිකයන් පරාජය කරනු සඳහා එහි හමුදවන් සහ ජනතාව ක්‍රියාත්මක කිරීමට හෝ නොහැකිවනවා පමණක් නොව සිවිල් යුධයක විනාශයන්ද ලඟාවනු ඇත. පක්ෂවලට සම්බන්ධ සහ අසම්බන්ධ බොහෝ ප්‍රජාතන්ත්‍රවාදීන්–කුඕමින්තානයේ සිටින ප්‍රජාතන්ත්‍රවාදීන්ද ඇතුළුව — සභාග ආණ්ඩුවක් පිහිටුවිය යුතුයයි ඒකමතිකව

LIBERATIONBASE

ඉල්ලා සිටින්නේ මන්ද? එසේ කරනුයේ ඔවුන් වර්තමාන අර්බුදය පිළිබඳව පැහැදිලි අවබෝධයක් ඇතිව සිටින හෙයිනුත් මේ අර්බුදයෙන් මිදී සතුරාට විරුඬව සමගිය ගොඩනැගීමට අන්මගක් නැති බව වටහාගෙන ඇති හෙයිනුත්ය.

5. මහජන හමුදව

ජනතාවගේ පැත්ත ගත් හමුදවක් නොමැතිව චීන ජනතාවට නිදහස හා එක්සත් බව දිනාගත නොහැක්කේය. සභාග ආංඩුවක් පිහිටුවීමටද ජපන් ආක්‍රමණිකයන් තරයේ පරාජය කොට නව චීනයක් ගොඩ නැගීමටද නොහැක්කේය. දනට සම්පූර්ණයෙන් ජනතාවගේ පැත්ත ගෙන සිටින්නේ විමුක්ති ප්‍රදේශවල 8 වෙනි මාර්ග හමුදව හා නව 4 වැනි හමුදව පමණි. මේ හමුදවන් වැඩිය විශාල නැත. එය කොහෙත්ම ප්‍රමාණවත් නොවේ. එහෙත් ජනතාවට සතුරුකම කරන කුඕමින්තාන කණ්ඩායම විමුක්ති ප්‍රදේශ වල හමුදවන් කඩාකප්පල් කිරීමට හා විනාශ කිරීමට නොකඩවා උපක්‍රම යොදයි. විමුක්ති ප්‍රදේශවල ආයුධ සන්නඩ හමුදවන්ගෙන් 4/5 පංගුවක් "නිශ්චිත කාලසීමාවක් තුලදී විසුරුවා හල" යුතුයයි කියා සිටිමින් කුඕමින්තාන ආංඩුව 1944 දී කොමියුනිස්ට පක්‍ෂයට "යෝජනාවක්" ඉදිරිපත් කළේය, ඉතා මෑතකදී කෙරුන සාකච්ඡාවකදී — එනම් 1945 දී – එම ආංඩුව තවදුරටත් ඉල්ලා සිටියේ කොමියුනිස්ට පක්‍ෂය විසින් විමුක්ති ප්‍රදේශවල ආයුධ සන්නඩ හමුදවන් තමන්ට භාරදිය යුතු බවත්, එසේ නොකළහොත් කොමියුනිස්ට පක්‍ෂයට "නිත්‍යානුකූල තත්වය" පිරිනොනමන බවත්ය.

"ඔබේ හමුදවන් බාරදෙනු — එවිට අපි ඔබට නිදහස දෙන්නෙමු"යි කුඕමින්තානයේ මේ පුද්ගලයෝ කොමියුනිස්ට වාදීන්ට කියා සිටිති. ඔවුන්ගේ මේ යෝජනාව අනුව කිසිදු හමුදවක් නැති දේශපාලන පක්‍ෂයකට නිදහස භුක්ති විඳින්නට තිබුනි. එහෙත් 1924–27 කාලය තුලදී චීන කොමියුනිස්ට පක්ෂයට කුඩා සන්නඩ බලවේගයක් තිබුන නමුත් කුඕමින්තාන ආංඩුව පක්ෂය පිරිසිදු කිරීම හා ඝාතනය පටන්ගත් වහාම ඒ නිදහසද අහෝසිවී ගියේය. අද ආයුධ සන්නඩ හමුදවන් නොමැති

චීන ප්‍රජාතන්ත්‍රවාදී සංගමයට හා කුඕමින්තානය තුල සිටින ප්‍රජාතන්ත්‍රවාදීන්ට නිදහසක්ද නැත. කුඕමින්තාන පාලනය යටතේ සංස්කෘතික, අධ්‍යාපනික හා කාර්මික ව්‍යාපාරවල යෙදී සිටින කම්කරුවන්ගේ, ගොවීන්ගේ, ශිෂ්‍යයන්ගේ හා ප්‍රගතිශීලි මත දරන පුද්ගලයන්ගේ තත්වය කෙබඳුදැයි කල්පනා කර බලමු. ඉකුත් 18 වසර තුළදී මේ කිසිවෙක් සතුව සවකීයම වූ ආයුධ සන්නඩ හමුදවක් නොසිටි අතර මේ කිසිවෙකුට නිදහස තිබුනේද නැත. මේ සියල්ලනට සන්නඩ හමුදවන්ද නැත. නිදහසද නැත. මේ සියළු ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂවලට හා ජනතාවට නිදහස අහිමි කරන ලද්දේ ඔවුන් හමුදවන් සංවිධාන කළ නිසාද? "සවාධීන වැඩවසම් රජයක්" ඇතිකළ නිසාද? "දේශ ද්‍රෝහී ප්‍රදේශ" බිහි කළ නිසාද? කිසි "ආංඩුවේ හා හමුදවේ ආඥවන්" උල්ලංඝනය කළ නිසාද? කිසිසේත්ම ඒ හේතු නිසා නොවේ. අනිත් අතට ඔවුනට නිදහස අහිමි කර තිබෙන්නේ මේ කිසිදෙයක් ඔවුන් නොකළ නිසාය.

"හමුදව අයත් වන්නේ රාජ්‍යයටය" — සහතික ඇත්ත. රාජ්‍යයකට අයිති නැති හමුදවක් ලොවෙහි නොමැත. එහෙත් මොන විධියේ රාජ්‍යයක්ද? මහ ඉඩම් හිමියන්ගේ, මහ බැංකු හිමියන් ගේ සහ මහ කොම්ප්‍රදෝරු ධනපතියන්ගේ වැඩවසම් පැසිස්ට් ඒකාධිපතිත්වය යටතේ පවත්නා රාජ්‍යයක්ද? එසේ නැත්නම් පුළුල් බහුජනතාවගේ නව ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක්ද? චීනය විසින් පිහිටුවිය යුතු නව ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් පමණි. මේ පදනම මත ඇය නව ප්‍රජාතන්ත්‍රවාදී සභාග ආංඩුවක් පිහිටු විය යුතුය. චීනයේ සියළු ආයුධ සන්නඩ හමුදවන් එබඳු රාජ්‍යයකට එබඳු ආංඩුවකට සතුවිය යුතුය. ඔවුන්ට ජනතා නිදහස රැකදිය හැක්කේද විදේශීය ආක්‍රමණිකයිනට විරුඬව සාර්ථක ලෙස සටන් කළ හැක්කේද එවිටය. චීනයෙහි නව ප්‍රජාතන්ත්‍රවාදී සභාග ආංඩුවක් පිහිටෙවු විගස චීනයේ විමුක්ති ප්‍රදේශ විසින් සවකීය ආයුධ සන්නඩ හමුද වන් එම ආංඩුවට භාරදෙනු ලබන්නේය. ඒවාගේම ඒ සමගම සියළු කුඕමින්තාන හමුදවනුත් එම ආංඩුවට භාරදිය යුතුය.

ආචාර්ය සුන් යත් සෙන් 1924 දී මෙසේ පැවසීය: "අද දව සේදී ජාතික විප්ලවයේ නවයුගයක ආරම්භය පිළිබඳ සලකුණු විය යුතුය . . . . පළමුවන පියවර වනුයේ ආයුධ සන්නඩ හමුදවන්

LIBERATIONBASE

ජනතාව සමග සමගි කිරීමයි. ඊළඟ පියවර වනුයේ ඒවා ජනතාවගේ ආයුධ සන්නද්ධ හමුදාවන් බවට පරිවර්තනය කිරීමයි''10 අටවෙනි මාර්ග හමුදාව සහ නව සිව්වැනි හමුදාව ''ජනතාවගේ ආයුධ සන්නද්ධ හමුදාවන්'' එනම් මහජන හමුදාවන් බවට පත්වී ඇත්තේද ජයග්‍රහනයන් අත්කර ගැනීමට සමත්වී ඇත්තේද ඔවුන් මේ ප්‍රතිපත්තිය අනුගමනය කළ නිසාය.

උතුරු යුද ගමනෙහි මුල් වකවානුව තුළදී කුඕමින්තාන හමුදාවන් ආචාර්ය සුන් ගේ ''පළමු පියවර'' අනුගමනය කළ අතර ඒ හේතුවෙන් ජයග්‍රහණයන් අත්කර ගත්තාහ. උතුරු යුද ගමනට පසු වකවානුවේදී ඔවුන් ඒ ''පළමු පියවර'' පවා අත්හැර ජනතාවට එරෙහි වූ ප්‍රතිපත්තියක් අනුගමනය කළ නිසා එද පටන් අද දක්වා ඔවුන් වඩ වඩා දූෂිතවී තිබේ. පිරිහී තිබේ. අභ්‍යන්තරික යුද්ධවලදී සටන් කරන්නට හුරු පුරුදු වූ ඔවුන්ට විදේශික සතුරාට විරුද්ධ යුද්ධයකදී ඒ හැකියාව නොමැත. කුඕමින්තාන හමුදාවේ හෘදය සාක්ෂියක් ඇති සෑම දේශප්‍රේමී නිලධාරියෙක් සුන් යත් සෙන් ගේ හැඟීම්වලට පණ දෙමින් සවකීය හමුදාවන් පරිවර්තනය කිරීමට පටන් ගත යුතුය.

පැරණි හමුදාවන් පරිවර්තනය කිරීමේදී සවකීය යල් පැනගිය මත අතහැර දමා මහජන හමුදාවෙහි රැඳී එහි සේවය කළ හැකි වන පරිදි නිවැරදි දර්ශනයන් අත්කර ගැනීමට සමත් සියළු නිලධාරීන්ට සුදුසු අධ්‍යාපනයක් සැපයිය යුතුය.

චීන ජනතාවගේ හමුදාව ගොඩනගනු සඳහා සටන් කිරීම සමස්ත ජාතියම සතුවූ යුතුකමකි. මහජන හමුදාවක් නැත්නම් ජනතාවට කිසිදෙයක් නැත්තේය. මේ ප්‍රශ්නය උඩ මොනයම් ආකාරයක හෝ හිස් වදන් නොයෙදිය යුතුය.

චීන හමුදාව පරිවර්තනය කිරීමේ කාර්යයට කොමියුනිස්ට්වාදීන් වන අපි සහයෝගය දීමට සූදානමින් සිටිමු. ජනතාව සමග එක්සත් වීමට කැමැත්තාවූද චීන විමුක්ති ප්‍රදේශවල හමුදාවලට සතුරුකම් කරනු වෙනුවට ජපන් ආක්‍රමණිකයිනට විරුද්ධව නැගී සිටින්නාවූද සියළු යුද්ධ හමුදාවන් මිත්‍ර සේනාවන් ලෙස සලකා, අටවෙනි මාර්ග හමුදාව හා නව සිව්වෙනි හමුදාව ඔවුනට සුදුසු ආධාර දිය යුතුය.

6. ඉඩම් ප්‍රශ්නය

ජපන් ආක්‍රමණිකයන් අතුගා දමා නව චීනයක් ගොඩනැගීමට නම් ඉඩම් ක්‍රමය ප්‍රතිසංස්කරණය කොට ගොවීන් මුදාලීම අවශ්‍යයෙන්ම කළ යුත්තකි. ධනපති ප්‍රජාතන්ත්‍රවාදී සවභාවයකින් යුත් අප විප්ලවයේ වර්තමාන අවධියට ආචාර්ය සුන් යත් සෙන්ගේ ''ඉඩම් ගොවීන්ටය'' යන න්‍යාය ගැලපේ.

අප විප්ලවයේ වර්තමාන අවධිය සවභාවය අතින් ධනපති ප්‍රජාතන්ත්‍රවාදීයයි අප කියා සිටින්නේ මන්ද? ඉන් අප අදහස් කරන්නේ මේ විප්ලවයේ ඉලක්කය වනුයේ පොදුවේ ධනවාදී පීඩනය අහෝසි කර දැමීම නොවන අතර විදේශික හා රදළ පීඩනය අහෝසි කර දැමීම පිණිස වන බවයි. ඒ වගේම මේ විප්ලවයේදී ගනු ලබන පියවරයන් පොදුවේ පෞද්ගලික දේපල අහෝසි කරනු වෙනුවට එය රැක දීමට යොමුවී පවතී. තවද මේ විප්ලවයේ ප්‍රතිඵලයක් වශයෙන් සමාජවාදය කරා චීනය මෙහෙය වීමට අවශ්‍ය ශක්තිය ගොඩනගාගැනීමට කම්කරු පංතිය සමත් වන අතර සෑහෙන දිගුකලක් ගතවන තුරු සුදුසු ප්‍රමාණයකට වර්ධනය වීමට ධනපති ක්‍රමයකටද ඉඩ සැලසෙන්නේය.

''ඉඩම් ගොවීන්ට ය'' යනුවෙන් අදහස් කෙරෙන්නේ වැඩවසම් සූරාකන්නන් අතින් ගොවීන් අතට ඉඩම් පවරා දීමය. රදළ ඉඩම් හිමියන්ගේ පෞද්ගලික දේපල ගොවීන්ගේ පෞද්ගලික දේපල බවට පත් කිරීමය. ඒ වගේම ගොවීන් වැඩවසම් ගොවි සබඳතාවලින් මුදවා කෘෂිකාර්මික රටක් කර්මාන්තමය රටක් බවට පරිවර්තනය වීමට ඉඩකඩ පාද දීමය. මේ අනුව බලනවිට ''ඉඩම් ගොවීන්ටය'' යන්න ධනපති – ප්‍රජාතන්ත්‍රවාදී පියවරක් මිස නිර්ධන – සමාජවාදී පියවරක් නොවේ. එය සියළු විප්ලවවාදී ප්‍රජාතන්ත්‍ර

LIBERATIONBASE

වාදීන්ගේ ඉල්ලීමක් මිස කොමියුනිස්ට්වාදීන් වන අපට පමණක් සීමා වූ ඉල්ලීමක් නොවේ. චීනයේ තත්වය අනුව දක්නට ලැබෙන වෙනස නම්, මේ ඉල්ලීම ගැන විශේෂ උනන්දුවකින් ක්‍රියා කරන්නේ කොමියුනිස්ට වාදීන් වන අප පමණක් වීමයි. අපි ඒ ගැන කථා කිරීමට පමණක් සීමා නොවී එය ක්‍රියාවටද නංවමු. විප්ලවවාදී ප්‍රජාතන්ත්‍රවාදීහු කවරහුද? ඉතාම දැඩි විප්ලවවාදී ප්‍රජාතන්ත්‍රවාදීන් වන නිර්ධන පංතිය හැරුන විට සිටින විශාලම විප්ලවවාදී ප්‍රජාතන්ත්‍රවාදී කණ්ඩායම ගොවි ජනතාවය. බහුතර ගොවි ජනතාව – එනම් වැඩවසම් වලිගයක් ඇති පොහොසත් ගොවීන් හැර අන් සියළු දෙන –''ඉඩම් ගොවීන්ටය'' යන ඉල්ලීම කෙලින්ම ඉදිරිපත් කරති. නාගරික සුළු ධනේශ්වර පංතියද විප්ලවවාදී ප්‍රජාතන්ත්‍රවාදීන් වන අතර ''ගොවීන්ට ඉඩම්'' ප්‍රතිපත්තියෙන් ඔවුනටද සෙතක් සැලසේ. මන්දයත් ඒ හේතුවෙන් කෘෂිකර්මයෙහි නිශ්පාදන බලවේගයන් වර්ධනය වීමට රුකුලක් ලැබෙන හෙයිනි. ජාතික ධනපති පංතිය වැනෙන සුළු වූ පංතියකි, ඔවුහුද ''ඉඩම් ගොවීන්ටය'' යන පිළිවෙත අනුමත කරති. ඒ ඔවුනට වෙළඳ පොලවල් අවශ්‍ය නිසාය. එහෙත් ඔවුන් අතුරින් බොහෝ දෙනෙක් වැඩි වශයෙන් ඉඩම් දේපල සමග සබඳකම් ඇතියවුන් නිසා ඒ ගැන බිය වෙති. ආචාර්ය සුන් යත් සෙන් චීනයෙහි ප්‍රථම විප්ලවවාදී ප්‍රජාතන්ත්‍රවාදියාය. ජාතික ධනපති පංතියේ විප්ලවවාදී කොටස මෙන්ම නාගරික සුළු ධනපති පංතිය හා ගොවි ජනතාව නියෝජනය කළ ඔහු ආයුධ සන්නද්ධ විප්ලවයක් කොට ''ඉඩම් අයිතිය සමකිරීමේ'' හා ''ඉඩම් ගොවීන්ට දීමේ'' ප්‍රතිපත්ති ඉදිරිපත් කළේය. එහෙත් අවාසනාවකට මෙන් ඔහු බලයට පත්ව සිටි කාලය තුළදී ඒ ගැන ආරම්භක උනන්දුවෙන් යුතුව ඉඩම් ක්‍රමය ප්‍රතිසංස්කරණය නොකළේය. කුඕමින්තානයේ ජනතා විරෝධී කල්ලිය බලයට පත්වූ වහාම ඔහුගේ එම අදහසට විරුඬ වූහ. දැන් ''ඉඩම් ගොවීන්ටය'' යන පිළිවෙතට එරෙහිව දැඩි ලෙස සතුරුකම් කරන්නේ ඒ කල්ලියයි. ඊට හේතුව ඔවුන් විසින් මහ ඉඩම් හිමියන්ගෙන්, බැංකු හිමියන්ගෙන් හා කොම්ප්‍රදෝරු ධනපතියන්ගෙන් යුත් සමාජ කොටස නියෝජනය කරනු ලැබීමයි. චීනයෙහි තනිකර ගොවි ජනතාව නියෝජනය කරන දේශපාලන පක්ෂයක් නොමැති හෙයින්ද ජාතික ධනපති පංතියේ දේශපාලන පක්ෂවලට දැඩි ඉඩම් ප්‍රතිපත්තියක් නැති හෙයින්ද ගොවි ජනතාවගේ සහ සෙසු සියළු විප්ලවවාදී ප්‍රජා

LIBERATIONBASE

තන්ත්‍රවාදීන්ගේ නායකයා වී ඇත්තේ චීන කොමියුනිස්ට පක්ෂයයි. දැඩි ඉඩම් ප්‍රතිපත්තියක් සකස් කොට ඒ ක්‍රියාත්මක කොට ඇත්තේද ගොවිජන සුභ සිද්ධිය සඳහා අවංකව සටන් කොට ඇත්තේද ඒ හේතුවෙන් ස්වකීය ශ්‍රේෂ්ඨ සහායකයා වශයෙන් බහුතර ගොවි ජනතාව තමන් වෙත දිනා ගෙන ඇත්තේද, කොමියුනිස්ට් පක්ෂය විසිනි.

ඉඩම් ක්‍රමය තරයේ ප්‍රතිසංස්කරණය කරනු සඳහාත් ආචාර්ය සුන්ගේ ''ඉඩම් ගොවීන්ට ය'' යන්න ක්‍රියාත්මක කරනු සඳහාත් 1927–36 කාලය තුලදී චීන කොමියුනිස්ට පක්ෂය විවිධ පියවර ගත්තාය. පුරා දස අවුරුද්දක් ජනතාවට විරුඬව යුඬ කරමින් ''ඉඩම් ගොවීන්ට ය'' යන පිළිවෙතට විරුඬව බිහිසුනු සටනක් කළේ ආචාර්ය සුන් යත් සෙන්ගේ අපකීර්තිමතිත් අනුගාමිකයන් රංචුව වූ කුඕමින්තානයේ ප්‍රතිගාමී කල්ලියයි.

ජපන් විරෝධී යුඬය සමයෙහිදී ''ඉඩම් ගොවීන්ට ය'' යන පිළිවෙත වෙනස් කොට බදු කුලිය සහ පොලිය අඩු කිරීමේ පිළිවෙතක් අනුගමනය කරමින් කොමියුනිස්ට් පක්ෂය සෑහෙන ඉඩක් දුන්නේය. මේ සහනය නිවැරදි එකක් විය. මන්දයත් එමගින් ජපන් විරෝධී යුඬයට කුඕමින්තානය ඇදා ගැනීමට රුකුල් ලැබුනු අතර යුඬය සඳහා අප විසින් විමුක්ති ප්‍රදේශවල ගොවීන් ක්‍රියාත්මක කිරීමට ඉඩම් හිමියන්ගෙන් නැගුනු විරෝධය අඩුවී ගියේය. විශේෂ බාධාවක් හට නොගතහොත් යුඬයෙන් පසුවත් මේ ප්‍රතිපත්තිය දිගටම ක්‍රියාත්මක කිරීමට අප සූදනම් ය. පළමුව බදු කුලිය හා පොලිය අඩු කිරීම මුළු රට පුරා ක්‍රියාත්මක කරනු ලබන අතර, ඊලඟට ''ඉඩම් ගොවීන්ට ය'' යන පිළිවෙත ක්‍රමක්‍රමයෙන් ක්‍රියාවට නැංවෙන පරිදි සුදුසු පියවර ගන්නවා ඇත.

කෙසේ වුවද ආචාර්ය සුන්ව පාවාදුන් පුද්ගලයෝ ''ඉඩම් ගොවීන්ට ය'' යන පිළිවෙතට පමණක් නොව බදු කුලිය හා පොලිය අඩු කිරීමටද විරුඬව ක්‍රියා කරති. ''බදු කුලිය 25% කින් අඩු කිරීමේ'' නීතිය සහ කුඕමින්තාන ආංඩුව විසින් පනවා ඇති මෙබඳු වෙනත් නීති ක්‍රියාත්මක කිරීම ඔවුන් විසින්ම අත්හිටවා තිබේ. ඒවා ක්‍රියාත්මක කර ඇත්තේ විමුක්ති ප්‍රදේශවල සිටින අප විසින්

පමණි. මේ අපරාධය නිසාදෝ විමුක්ති ප්‍රදේශ ''දේශ ද්‍රෝහී ප්‍රදේශ'' ලෙසින් හංවඩු ගසා ඇත.

ජපන් විරෝධී යුධය සමයේදී අවධි දෙකක් පිළිබඳ ඊනියා න්‍යායක් එළි දක තිබේ. ''ජාතික විප්ලවයේ'' අවධිය සහ ''ප්‍රජාතන්ත්‍රය හා මහජන සුභසාධනය සඳහා කරන විප්ලවයේ'' අවධිය ඒ උභය අවධියයි. මෙය වැරදි න්‍යායකි. යුධයේදී සම්පූර්ණ ජයග්‍රහනය අත්වීම වලකනු සඳහා කුඕමින්තානයේ ප්‍රතිගාමී කල්ලිය ඉදිරිපත් කරන විකාර සහගත න්‍යාය මෙසේය: ''බලගතු වූ සතුරකුට මුහුණ ලා සිටින විට ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණ හෝ ජනජීවනය පිළිබඳ ප්‍රශ්න මතු නොකළ යුතුය. ජපනා ඉවත් වන තුරු ඉවසා සිටීම හොඳය.'' මේ න්‍යාය පිළිරැව් කරන්නාවූද එහි වහල් අනුගාමිකයන් බවට පත්වී සිටින්නාවූද පුද්ගලයෝ සිටිති.

චීන කොමියුනිස්ට් පක්ෂය විසින් ඉදිරිපත් කරඇත්තේත්, කදිම ලෙස සාර්ථක ලෙස ප්‍රතිඵල ලබමින් ක්‍රියාවට නංවා ඇත්තේත් පහත සඳහන් න්‍යායයි; ''බලගතු සතුරකුට මුහුණ ලා සිටින විට ප්‍රජාතන්ත්‍රය සහ ජන ජීවනය පිළිබඳ ප්‍රශ්න නිරාකරණය කරන තුරු ජපනාට විරුද්ධව කඳවුරු ගොඩනැගීම හෝ ඔවුන්ගේ පහරවලට ප්‍රතිප්‍රහාර දීම හෝ කළ නොහැක්කේය''.

ජපන් විරෝධී යුද්ධය සමයේ දී බදුකුලිය හා පොලිය අඩු කිරීමත් අනිකුත් ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණයනුත් කරනුයේ යුද්ධය සඳහාමය. ඉඩම් හිමියන් යුද්ධ ප්‍රයත්නයට දක්වන විරෝධය අඩු කරනු සඳහා අපි ඔවුන්ගේ ඉඩම් අයිතිය අහෝසි කිරීමෙන් වැලකී සිටිමු. අප කර ඇත්තේ ඔවුන්ගේ බදුකුලී හා පොලී අඩු කිරීම පමණකි, ඒ එක්කම අපිත් ඔවුනට සිය ධනය කර්මාන්තවල යෙදීමට දිරි දී ඇත්තෙමු. තවද සෙසු ජනතා නියෝජිතයන් සමග එක්වී යුද්ධයට අදාල මහජන කටයුතුවලට හා ආංඩුවේ කටයුතුවලට සහභාගිවීමට ප්‍රබුද්ධ ප්‍රභූනට අප විසින් අවස්ථාව සලසා දී තිබේ. පොහොසත් ගොවීනට ස්වකීය නිෂ්පාදනය වර්ධනය කිරීමට අපි දිරිදී ඇත්තෙමු. මේ සියල්ල ග්‍රාමීය පෙදෙස්වල ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණයන් තරයේ ක්‍රියාවට නැන්වීමේ පිළිවෙතෙහිම කොටසක් වන අතර එය සහමුලින් අවශ්‍ය පියවරකි.

LIBERATION BASE

පිළිවෙත් දෙකක් තිබේ. එක්කෝ ප්‍රජාතන්ත්‍රය හා ජනජීවනය පිළිබඳ ප්‍රශ්නය විසඳීමට එන ගොවීන් ගන්නා උත්සාහයට දරුනු ලෙස විරුද්ධ වී දූෂිත අකර්මන්‍ය හා ජපානයට විරුද්ධව සටන් කිරීමට සහමුලින් අසමත් පිරිසක් බවට පත්විය යුතුය. එසේ නැත්නම් චීන ගොවි ජනතාවගේ ප්‍රයත්නයට තරයේ සහයෝගය දී ජනගහනයෙන් 80% වන ඔවුන් ශ්‍රේෂ්ඨතම සහායකයන් ලෙසින් තමන්ගේ පැත්තට දිනාගෙන අසහාය සටන් ශක්තියක් ගොඩ නගා ගතයුතුය. පළමු පිළිවෙත කුඕමින්තාන ආංඩුවේ පිළිවෙත වන අතර චීනයේ විමුක්ති ප්‍රදේශවල පිළිවෙත පසුකී පිළිවෙතයි.

අවස්ථාවාදීන්ගේ ක්‍රියා මාර්ගය වී ඇත්තේ මේ පිළිවෙත් දෙක අතර වැනෙමින් සිටීමය. ඔවුන් ගොවි ජනතාවට සහයෝගය දෙන බවක් කිවමුත්, බදුකුලී හා පොලී අඩු කිරීමටත් ගොවි ජනතාව සන්නාහ සන්නද්ධ කිරීමටත් ග්‍රාමීය පෙදෙස්වල ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන බලය පිහිටුවීමටත් ඔවුන් තුල අදිෂ්ඨානයක් නොමැත.

කුඕමින්තානයේ ජනතා විරෝධී කල්ලිය තම මුළු බලය යොදමින් චීන කොමියුනිස්ට් පක්ෂයට විරුද්ධව එළිපිට හා රහසේද යුද්ධමය හා දේශපාලනමයවූද ලේ සෙලවීමෙන් යුක්ත වූ හා නොවූ ද සෑම ආකාරයක දුෂ්ට විස හී පහර එල්ල කර තිබේ. සමාජයීය පසුබිම අනුව බලන විට දෙපක්ෂය අතර ඇති මතභේදය ඇත්ත වශයෙන්ම ගොවි සබඳතා පිළිබඳ ප්‍රශ්නය උඩ පදනම් වූවකි. කුඕමින්තාන ප්‍රතිගාමී කල්ලියට අපගෙන් රිදීමක් සිදුවූයේ නිසැකවම කවර කරුණක් උඩද? එය මේ ප්‍රශ්නය උඩ නොවෙයිද? මේ කල්ලිය ජපන් ආක්‍රමණිකයන්ගේ ප්‍රසාදය හා අනුබලය දිනාගන්නේ සිකුරටම මේ ප්‍රශ්නය උඩ ඔවුනට විශාල මෙහෙයක් ඉටුකිරීමෙන් නොවෙයිද? චීන කොමියුනිස්ට් පක්ෂයට විරුද්ධව මේ සෑම චෝදනාවක්–''ප්‍රතිප්‍රහාරක යුද්ධය කඩාකප්පල් කිරීම හා රාජ්‍ය අනතුරෙහි හෙළීම,'' ''දේශද්‍රෝහී පක්ෂය,'' දේශ ද්‍රෝහී ප්‍රදේශ,'' සහ ''ආංඩුවේ හා හමුදාවේ නියෝගවලට අකීකරුවීම'' ආදිය එල්ල කරන ලද්දේ එම පක්ෂය මේ අංශයෙන් ජාතියේ නියම සුභසෙත අරභයා අවංක සේවයක් කර තිබෙන නිසාම නොවේද?

චීනයේ කාර්මික කම්කරුවන් අවුත් සිටින්නේ ගොවි ජනතාව අතුරෙනි. අනාගතයේ ගොවීන් තව දශ ලක්ෂ ගණනාවක් නගරවලට ගොස් පැක්ටරි වලට ඇතුළුවනු ඇත. චීනය බලගතු ජාතික කර්මාන්ත සහ නවීන විශාල නගරයන් බොහෝවක් ගොඩ නැගීමට නම් ගම්වැසියන් නගර වැසියන් බවට පරිවර්තනයවීමේ ක්‍රියාදමයක් එකදිගටම පැවතිය යුතුය.

චීනයේ කර්මාන්තවල ප්‍රධාන වෙළඳපොල වනුයේ ගොවි ජනතාවයි. ආහාර ද්‍රව්‍ය හා අමුද්‍රව්‍ය බහුල වශයෙන් සැපයීමට හැක්කේද නිශ්පාදිත භාණ්ඩ විශාල වශයෙන් පරිභෝජනය කළ හැක්කේ ද ඔවුනටය.

චීන හමුදාවේ නිධානය ද ගොවි ජනතාවයි. සොල්දාදුවන් වූ කල්හි යුද්ධ ඇඳුමින් සැරසුන ගොවීන්ය. ඔවුහු ජපන් ආක්‍රමණිකයන්ගේ මාරක සතුරෝ වෙති.

වර්තමාන අවධියෙහි චීනයේ ප්‍රජාතන්ත්‍රයට පක්ෂව ඇති ප්‍රධාන දේශපාලන බලවේගය ගොවීන්ය. ගොවීන් තිස්හය කෝටියේ සහයෝගය මත විශ්වාසය නොරඳා චීන ප්‍රජාතන්ත්‍රවාදීන්ට කිසිදු සාර්ථක ප්‍රතිඵලයක් අත්කර ගත නොහැක්කේය.

වර්තමාන අවධියෙහි චීනයේ සංස්කෘතික ව්‍යාපාරයෙහි ප්‍රධාන සැලකිල්ල යොමු වී ඇත්තේ ගොවි ජනතාව කෙරෙහිය. ගොවීන් තිස් හය කෝටිය බැහැර කළහොත් "නූගත් බව නැති කර දැමීම" "අධ්‍යාපනය ජනතාව අතර පැතිරවීම" "සාහිත්‍යය හා කලාව ජනතාව වෙනුවෙන් කැප කිරීම" "මහජන සෞඛ්‍යය" ආදී සටන් පාඨ හුදෙක් පුහුඝෝෂා බවට පත් වන්නේය.

මෙසේ පැවසීමේදී නව කෝටියක් පමණ වන සෙසු ජනතාවගේ දේශපාලන ආර්ථික හා සංස්කෘතික වැදගත්කම මා අමතක කරන්නේ නැත. විශේෂයෙන් අධිකතම දේශපාලන විඥානයකින් යුක්තවූද එම නිසා සමස්ත විප්ලවවාදී ව්‍යාපාරයට නායකත්වය දීමේ සුදුසුකමින් යුක්තවූද කම්කරු පංතිය මවිසින් අමතක නොකෙරේ,

මේ පිළිබඳව වැරදි අවබෝධයක් ඇතිකර නොගත යුතුය. මේ කරුණු කොමියුනිස්ට්වාදීන් විසින් පමණක් නොව සැම ප්‍රජාතන්ත්‍රවාදියකු විසින් ද අවබෝධ කර ගැනීම සහමුලින් අවශ්‍යය,

ඉඩම් ක්‍රමයෙහි ප්‍රතිසංස්කරණයක් සිදුවූවිට-එය බදු හා පොලී අඩුකිරීම වැනි සුළු ප්‍රතිසංස්කරණයක් වුවද, ගොවි ජනතාව නිෂ්පාදනය ගැන වඩා උනන්දුවෙති. අනතුරුව ගොවීනට ස්වෙච්ඡාවෙන්ම ගොවි සමුපකාරය හා සෙසු සමුපකාරයන් සංවිධාන කිරීමට රුකුල් දුන්විට නිෂ්පාදන බලවේගයන් වර්ධනය වනු ඇත. වර්තමාන අවධියේ ගොවි සමුපකාරයන් ශ්‍රම හුවමාරු කංඩායම් අන්‍යෝන්‍යාධාර කංඩායම් සහ වැඩ හුවමාරු කංඩායම් ආදී පෞද්ගලික ගොවි ආර්ථිකය මත (එනම් ගොවීන්ගේ පෞද්ගලික අයිතිය මත) පදනම්වූ සාමූහික අන්‍යෝන්‍යාධාර ශ්‍රම සංවිධානයන් පමණක් විය යුතුයි. මේ තත්වය යටතේ පවා ශ්‍රමයේ ඵලදායකත්වය දැනටමත් පුදුමාකාර ලෙස ඉහල නැග තිබේ. මෙබඳු සංවිධාන චීනයේ විමුක්ති ප්‍රදේශවල පුළුල් ලෙස වර්ධනය කොට ඇති අතර මෙතැන් පටන් ඒවා හැකිතාක් පැතිරවිය යුතුය.

ශ්‍රම හුවමාරු කංඩායම්වල ආකාරයේ සමුපකාර සංවිධාන දිගු කලෙක පටන් ගොවි ජනතාව අතර පැවති බව මෙහිලා සඳහන් කළ යුතුය. එහෙත් අතීතයෙහිදී ඒවා ස්වකීය දුක්ඛදායක තත්වය මගහරවා ගැනීමට ගොවීන් විසින් යොදගත් උපක්‍රමයක් පමණි. අද චීනයේ විමුක්ති ප්‍රදේශවල ඇති ශ්‍රම හුවමාරු කංඩායම් සැකැස්ම හා හරය අතින් ඊට වඩා වෙනස්ය. ඒවා ගොවි ජනතාව විසින් නිශ්පාදනය අධික කරන්නාවූද වඩා හොඳ ජීවිතයක් උදකර ගැනීමට යොද ගෙන ඇත්තාවූද මාර්ගයන් වී තිබේ.

අවසාන වශයෙන් සලකා බලන විට ඕනෑම චීන දේශපාලන පක්ෂයක ප්‍රතිපත්තියේ හා ක්‍රියා මාර්ගයේ හොඳ හෝ නරක, විශාල හෝ සුළු, බලපෑම රඳා පවත්නේ එම පක්ෂය ජනතාවගේ නිශ්පාදන බලවේගයන් වර්ධනය කිරීමට කෙතරම් දුරට උපකාරී වේද එම බලවේගයන් සීමා කරයිද එසේ නැත්නම් ඒවා මුදා හරියිද යන ප්‍රශ්නය උඩය. චීනයේ සමාජමය නිශ්පාදන බලවේගයන් වර්ධනය කළහැක්කේ ජපන් ආක්‍රමණිකයන් විනාශ කර දැමීමෙනුත් ඉඩම් ප්‍රතිසංස්කරණය සිදුකිරීමෙනුත් ගොවීනට නිදහස ලබා දීමෙනුත් නවීන කර්මාන්ත දියුණු කිරීමෙනුත් ස්වාධීන නිදහස් ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් සෞභාග්‍යමත් හා බලගතු නව චීනයක් පිහිටුවාලීමෙනුත් පමණකි. මේ පියවරට චීන ජනතාවගේ අනුමැතිය ලැබෙනු ඇත.

LIBERATIONBASE

ගම්බද පෙදෙස්වල සේවය කිරීමට එන නාගරික බුද්ධිමතුනට ගම්බද පෙදෙස්වල ලක්ෂණයන් – එනම් එම පෙදෙස් තවම විසිරී ගිය හා නොදියුනු පෞද්ගලික ආර්ථිකයක් මත පදනම් වී ඇති බවත්, ඊටත් වැඩියෙන් විමුක්ති ප්‍රදේශ සතුරා නිසා තාවකාලිකව එකිනෙකින් වෙන්වී තිබෙන බව හා ඒවා ගරිල්ලා යුද්ධයක නියැලී සිටින බවත් – තේරුම් ගැනීම පහසු නැති බව තව දුරටත් පෙන්වා දිය යුතුය. මේ ලක්ෂණයන් අවබෝධ කර ගැනීමට අසමත් වන ඔවුහු බොහෝ විට ගම්බද ප්‍රශ්න වලට හා ගම්බද වැඩකටයුතු වලට වැරදි ආකාරයෙන් අත ගසති, ඔවුන් එම ප්‍රශ්න දෙස බලන්නේ නගරවල ජීවිතය හා වැඩකටයුතු අනුව සිතමිනි. මෙසේ වූ විට ඔවුහු ගම්බද යථා තත්වයෙන් ඈත්වී ගොවි ජනතාව සමග පැහී සිටීමට අපොහොසත් වෙති. අධ්‍යාපනය මගින් මේ තත්වය මග හරවාලීම අවශ්‍යය. චීනයේ අනේක විප්ලවවාදී බුද්ධිමත්හු ගොවි ජනතාව සමග පැහී සිටීමේ අවශ්‍යතාවය අවබෝධ කර ගත යුත්තාහ. ගොවීනට ඔවුන් හා ඔවුන්ගේ ආධාරය උවමනා කර තිබේ. ඔවුන් ගම්බද පෙදෙස් වලට උද්යෝගයෙන් යුතුව ගොස් තම සිසු ඇඳුම් ඉවතලා කයෝර ඇඳුම් ලාගෙන කොතරම් සුළු තරමේ හෝ ඕනෑම වැඩක් කැමැත්තෙන්ම පටන් ගත යුතුය. ගොවීනට උවමනා කරන්නේ කුමක්දැයි ඔවුන් වටහා ගත යුතුය. ගම්බද පෙදෙස්වල ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය සාර්ථක කිරීමේ අරගලය සඳහා එය චීනයේ ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය සතු අතිශය වැදගත් කාර්‍යයන්ගෙන් එකකි–ගොවීන් පුබුදුවා සංවිධාන කළ යුතුය.

ජපන් ආක්‍රමණිකයන් අතුගා දැමීමෙන් පසුඔවුන් හා ප්‍රධාන දේශද්‍රෝහීන් විසින් කොල්ල කා ගත් ඉඩම් අත්පත් කරගෙන ඒවා ඉඩම් නැති හෝ ඉඩම් ස්වල්පයක් ඇති ගොවීන් අතර බෙදා දිය යුතුය.

7. කර්මාන්ත ප්‍රශ්නය

ජපන් ආක්‍රමණිකයන් පරාජය කොට නව චීනයක් ගොඩ නගනු සඳහා කර්මාන්ත වර්ධනය කළ යුතුය. එහෙත් කුඕමින්තාන ආංඩුව යටතේ සෑම දෙයක් සම්බන්ධයෙන් විදෙස් රටවලට ගැති වී තිබේ. එම ආංඩුවේ මූල්‍ය හා ආර්ථික ප්‍රතිපත්තිය නිසා ජනතාවගේ මුළු ආර්ථික ජීවිතය විනාශ වෙමින් පවතී. කුඕමින්තාන පෙදෙස්වල දක්නට ඇත්තේ සුළු කර්මාන්ත ව්‍යාපාර කීපයක් පමණි. ඉන් බොහොමයක්ද බංකොලොත් නොවී සිටීමට අපොහොසත්වී ඇත. දේශපාලන ප්‍රතිසංස්කරණයන් නොමැති හෙයින් සියළු නිෂ්පාදන බලවේගයන් විනාශ වෙමින් පවතී. කෘෂිකර්මය මෙන්ම කර්මාන්ත සම්බන්ධයෙන් ද මෙය සත්‍යයකි.

LIBERATIONBASE

චීනය ස්වාධීන, නිදහස් ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් රටක් වන තුරු කර්මාන්ත වර්ධනය කළ නොහැක. ජපන් ආක්‍රමණිකයන් අතුගා දැමීමෙන් ස්වාධීනතාවය ලැබේ. කුඕමින්තානයේ ඒකපාක්ෂික ඒකාධිපතිත්වය විනාශ කොට දමා ප්‍රජාතන්ත්‍රවාදී හා එක්සත් සභාග ආංඩුවක් පිහිටුවා චීනයේ සියළු සේනාවන් මහජනතාවගේ ආයුධ සන්නද්ධ හමුදවක් බවට පත් කොට, ඉඩම් ප්‍රතිසංස්කරණය ක්‍රියාත්මක කර ගොවීන්ට විමුක්තිය උදකර දුන් පසු නිදහස, ප්‍රජාතන්ත්‍රය හා සමගිය ඇතිවේ. ස්වාධීනතාවය, නිදහස ප්‍රජාතන්ත්‍රය හා සමගිය නැතිව නියම වශයෙන් විශාල පරිමාණයෙකින් යුත් කර්මාන්ත ගොඩනැගිය නොහැක. කර්මාන්ත නොමැතිව බලගතු ජාතික ආරක්ෂක ශක්තියක් ගොඩනගනු බැරිය. ඒ වගේම ජනතාවගේ සුභසෙත සලසනු හෝ ජාතියට සෞභාග්‍යය හා ශක්තිය උදකර දිය නොහැක. 1840 සිදුවූ අබින් යුධයේ[11] පටන් ගෙවීගිය වසර 105 ක ඉතිහාසය විසින්ද කුඕමින්තානය බලයට පත්වීමෙන් පසු ගෙවී ගිය දහ අට වසර විසින්ද මේ වැදගත් කරුණ චීන ජනතාවට

ඒත්තු ගන්වා තිබේ. දුප්පත් හා දුබල නැතිවූත් සෞභාග්‍යමත් හා බලගතු චීනයක් යනු යටත්විජිතමය හෝ අර්ධ යටත්විජිතමය නොවන මුත් ස්වාධීන වූද අර්ධ වැඩවසම්කාරී නොවන මුත් නිදහස්, හා ප්‍රජාතන්ත්‍රවාදී වූද භේදභින්න නොවන මුත් එක්සත් වූද චීනයකි. අර්ධ යටත්විජිතමය අර්ධ වැඩවසම්කාරී හා භේද රහිත චීනයකි. බොහෝ දෙනා අවුරුදු ගණනාවක් මුළුල්ලේ කර්මාන්ත වර්ධනය කිරීමේ ජාතික ආරක්ෂක ශක්තිය ගොඩනැගීමේ ජනතාවට සුභසෙත සැලසීමේ සහ ජාතියට සෞභාග්‍යමත් බලයක් හිමි කර දීමේ සිහින දුටහ. එහෙත් මේ සියළු සිහින සුනුවිසුනු වී ගොස් තිබේ. හොඳ හිතැති බොහෝ අධ්‍යාපනඥයන්, විද්‍යාඥයන් හා ශිෂ්‍යයන් ස්වකීය වැඩකටයුතුවල හා අධ්‍යයන කටයුතුවල නියැලී සිටින මුත් දේශපාලනය කෙරෙහි සැලකිලිමත් වී නැත. ඔවුන් මෙසේ කර තිබෙන්නේ ස්වකීය බුද්ධිමහිමයෙන් රටට සේවයක් කළ හැකිය යන හැඟීම උඩය. මෙයද හුදෙක් සිහිනයක් බවට පත් වී තිබේ. මෙය ඇත්තවශයෙන්ම හොඳ ලකුණකි. මන්දයත් මෙබඳු ළාමක සිහින සුනුවිසුනු වී යෑම චීනය සෞභාග්‍ය හා බලපරාක්‍රමයේ මාවතට පිළිපත් බවේ ලකුණකි. චීන ජනතාව යුද්ධයේදී බොහෝ දේ ඉගෙනගෙන තිබේ. ජපන් ආක්‍රමනිකයන් පරාජය කිරීමෙන් තම ස්වාධීනතාවය, නිදහස, ප්‍රජාතන්ත්‍රය, සමගිය, සෞභාග්‍ය හා බලවික්‍රමය භුක්ති විඳින නව ප්‍රජාතන්ත්‍රවාදී චීනයක් ගොඩනැගිය යුතු බව ඔවුහු දනිති. මේ සියළු ලක්ෂණයන්ගේ එකිනෙකට සම්බන්ධය අනිවාර්යයෙන් තිබිය යුතුය. ඔවුන් එසේ කළහොත් චීනය හමුවෙහි ඇත්තේ ප්‍රභාමත් අනාගතයකි. චීන ජනතාවගේ නිෂ්පාදන බලවේගයන්ගේ විලංගු ගැලවී ඒවා සෑම ආකාරයකින් වර්ධනය වීමේ ඉඩකඩ පැදෙන්නේ චීනයේ සෑම පෙදෙසක් පුරා නව ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමය ක්‍රියාත්මක වන විටය. මේ කරුණ දිනපතා ජනතාව වැඩිවැඩියෙන් පසක් කර ගනිමින් සිටිත්.

නව ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමය දිනාගැනීමෙන් පසුත් දිගුකලක් මුළුල්ලේ පියවරින් පියවර මහකර්මා සුළුන්ත හා කර්මාන්ත ගොඩනගනු සඳහාත් චීනය ගොවි රටක තත්වයෙන් කාර්මික රටක් බවට පරිවර්තනය කරනු සඳහාත් ප්‍රායෝගික පියවර ගැනීමට චීන ජනතාවට හා ඔවුන්ගේ ආංඩුවට සිදුවන්නේය. නව

ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක පදනම වශයෙන් ප්‍රබල ආර්ථිකයක් නොමැතිනම් දැනට වඩා දියුණු කෘෂිකර්මයක් නොමැති නම් ජාතික ආර්ථිකයේ ප්‍රධාන තැනක් ගන්නා විශාල පරිමාණයේ කර්මාන්ත නොමැති නම් ඊටම සරිලන ප්‍රවාහන ක්‍රම වෙළඳාම හා මුදල් නොමැති නම් එම රාජ්‍ය තහවුරු කළ නොහැක්කේය.

සියළු ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ හා මුළු රටේ කර්මාන්ත ව්‍යාපාරික කංඩායම් සමග සහයෝගයෙන් කටයුතු කරමින් ඒ අරමුණ ඉටු කරගනු සඳහා සටන් කිරීමට කොමියුනිස්ට් වාදීන් වන අප සූදනම්ය. මේ කාර්‍යයේදී චීන කම්කරු පංතිය වැදගත් මෙහෙයක් ඉටුකරනු ඇත.

පළමුවන ලෝක යුධයේදී පටන් චීන කම්කරු පංතිය චීනයේ ස්වාධීනතාවය හා විමුක්තිය සඳහා අවබෝධයකින් යුතුව සටන් කර තිබේ. කම්කරු පංතියේ පෙරමුණුවූ බලඇණිය වන චීන කොමියුනිස්ට් පක්ෂය වර්ෂ 1921 දී බිහිවූ අතර එතැන් පටන් විමුක්ති අරගලය අළුත් අවධියකට පා තැබීය. පසුකාලීන වකවානුවලදී එනම් උතුරු යුද ගමන ගොවිජන විප්ලවකාරී යුධය සහ ජපන් විරෝධී ප්‍රතිප්‍රහාරක යුධය පැවති සමයයන්හිදී චීන කොමියුනිස්ට් පක්ෂය හා කම්කරු පංතිය අතිශය කටුක වෙහෙසක් ගනිමින් චීන ජනතාවගේ විමුක්ති ව්‍යාපාරයට අප්‍රමාණ සේවයක් ඉටුකර තිබේ. ජපන් ආක්‍රමණිකයන් අවසාන වශයෙන් පරාජය කරනු සඳහා ගෙන යන අරගලයේදී විශේෂයෙන්ම මහ නගර හා වැදගත් ගමනාගමන මාර්ග ආපසු අල්ලා ගැනීම සඳහා ගෙනයන අරගලයේදී චීන කම්කරු පංතිය විශාල මෙහෙයක් ඉටුකරනු ඇත. ජපන් විරෝධී යුධයෙන් පසු චීන කම්කරු පංතියේ උත්සාහය හා මෙහෙවර කොටස වඩාත් අධික වන බව කල්තබා කිවහැක. චීන කම්කරු පංතියේ කාර්‍යය වනුයේ නව ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් පිහිටුවීම සඳහා පමණක් නොව චීනය කර්මාන්ත රටක් කරනු සඳහාත් ඇගේ කෘෂිකර්මය නවීන පන්නයට හැඩගසනු සඳහාත් අරගල තිබීමයි.

නව ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය ක්‍රමය යටතේ ශ්‍රමයේ හා ප්‍රාග්ධනයේ උවමනා එපාකම් ගැලපෙන අන්දමේ ප්‍රතිපත්තියක් අනුගමනය කරනු ඇත. එක් අතකින් එය කම්කරුවන්ගේ සුභසිද්ධිය ආරක්ෂා

LIBERATIONBASE

කරනු ඇත. ඒ ඒ තත්වයන් අනුව පැය අටේ සිට දහය දක්වා සීමා වූ වැඩ දිනයක් අරඹනු ඇත. සුදුසු විරක්ෂා සහන සහ සමාජයීය රක්ෂණ ක්‍රමයන් සපයනු ඇත. වෘත්තීය සමිති අයිතිවාසිකම් ආරක්ෂා කර දෙනු ඇත. අනික් අතට රජය තනි පුද්ගලයන් හා සමුපකාරයන් සතු හරියාකාර පාලනය වන ව්‍යාපාරයන්හි නීත්‍යානුකූල ලාභයක් ආරක්ෂා කරදෙනු ඇත. මේ අනුව මහජන හා පෞද්ගලික දෙඅංශයත් ශ්‍රමය හා ප්‍රාග්ධනයත් කාර්මික නිශ්පාදනය වර්ධනය කිරීමට එකට එක්වී වැඩ කරනු ඇත.

චීනයෙහි තිබෙන ජපන් ආක්‍රමණිකයන්ගේ හා ප්‍රධාන පෙලේ දේශද්‍රෝහීන්ගේ ව්‍යාපාර හා දේපල අත්පත් කරගෙන ජපානය පරාද වූ පසු ඒවා ආංඩුවට භාරදෙනු ඇත.

8. සංස්කෘතිය අධ්‍යාපනය හා බුද්ධිමතුන් පිළිබඳ ප්‍රශ්නය

විදේශීය හා වැඩවසම් පීඩනය විසින් චීන ජනතාවට පමුණුවා ඇති විපත්තිකර තත්වයන් අපගේ ජාතික සංස්කෘතිය කෙරෙහිද බලපා තිබේ. ප්‍රගතිශීලී සංස්කෘතික හා අධ්‍යාපනික ආයතනයන්ද ප්‍රගතිශීලී සංස්කෘතික සේවකයන්ද අධ්‍යාපනඥයන්ද විශේෂයෙන් විපතට පත් වී තිබේ. විදේශීය හා වැඩවසම් පීඩනය අතුගා දමා නව ප්‍රජාතන්ත්‍රවාදී චීනයක් ගොඩනගනු සඳහා ජනතාව වෙනුවෙන් කැප වූ අධ්‍යාපනඥයන් හා ගුරුවරුන් විශාල සංඛ්‍යාවක්ද මහජනතාවගේ විද්‍යාඥයන්, ඉංජිනේරුවන්, කාර්මිකඥයන්, වෛද්‍යවරුන්, පත්‍ර කලාවේදීන්, ලේඛකයන්, ශාස්ත්‍රඥයන්, කලාකරුවන් සහ සාමාන්‍ය සංස්කෘතික සේවකයන්ද අපට අවශ්‍ය වේ. ඔවුන් ජනතාවට සේවය කිරීමේ හැඟීමෙන් පණපෙවුන පුද්ගලයන් වියයුතු අතර මහන්සිවී වැඩ කළ යුතුය. මනාලෙස ජනතාවට සේවය කරන්නාවූ සියළු බුධිමතුන් අගනා ජාතික හා සමාජයීය වස්තූන් ලෙසින් සැලකිය යුතුය. බුධිමතුන් පිළිබඳ ප්‍රශ්නය චීනය සම්බන්ධයෙන් විශේෂයෙන් වැදගත් වනුයේ විදේශීය හා වැඩවසම් පීඩනයේ ප්‍රතිඵලයක් වශයෙන් රට සංස්කෘතික අතින් නොදියුණු තත්වයකට වැටී ඇති හෙයිනුත් ජනතාවගේ විමුක්ති අරගලය සඳහා බුධිමතුන් වහාම අවශ්‍ය වී ඇති හෙයිනුත් ය. ඉකුත් අඩ සියවස තුල කෙරුනු මහජන විමුක්ති අරගලයේදී – විශේෂයෙන්ම 1919 මැයි 4 ද ව්‍යාපාරයෙන් පසුවත් ජපන් විරෝධී යුධය කෙරුනු අට අවුරුද්ද තුලත්– විවිධ විප්ලවවාදී බුධිමතුන් අතින් විශාල මෙහෙයක් ඉටුවී තිබේ. අනාගත අරගලවලදී ඔවුන් වඩාත් විශිෂ්ඨ මෙහෙයක් ඉටු කරනු ඇත. එනිසා ජනතාව අතුරින් සියළු ආකාරයේ බුධිමත් කාඩර්වරුන් ක්‍රමානුකූලව වර්ධනය කිරීමත් ඒ එක්කම දැනට සිටින වැඩ

දයක බුද්ධිමතුන් සියළු දෙනා සමග එක්වී ඔවුනට අළුතින් අධ්‍යාපනයක් ලබා දීමට වගබලාගැනීමත් මහජන ආංඩුවක් සතු කාර්ය වේ.

ජනගහනයෙන් 80% ක් අතර පවත්නා නූගත් බව අකාමකා දැමීම නව චීනය සතු වැදගත් කාර්යයක් වේ.

වහල්කාරී වැඩවසම් හා පැසිස්ට් සංස්කෘතිය හා අධ්‍යාපනය සුදුසු හා දැඩි පියවර ගත යුතුය. ජනතාව අතර බෝවෙන හා අනිකුත් රෝග පැතිරීම වලකනු සඳහාත් ඒවා සුවකරනු සඳහාත් ජනතාවගේ වෛද්‍ය හා සෞඛ්‍ය සේවාවන් ව්‍යාප්ත කරනු සඳහාත් කාර්ය ශීලී පියවර ගත යුතුය.

පැරණි පන්නයේ සංස්කෘතික හා අධ්‍යාපනික සේවකයන්ටත් වෛද්‍යවරුනටත් ජනතාවට සේවය කරනු සඳහා නව දර්ශණයන් හා නව ක්‍රමයන් අත්කර ගත හැකිවන පරිදි ඔවුනට සුදුසු ලෙස අළුත් අධ්‍යාපනයක් සැපයිය යුතුය.

චීන ජනතාවගේ සංස්කෘතිය හා අධ්‍යාපනය නව ප්‍රජාතන්ත්‍රවාදී ඒවා විය යුතුය. එනම් චීනය ස්වකීයම වූ නව ජාතික විද්‍යානුකූල හා මහජන සංස්කෘතියකුත් අධ්‍යාපනයකුත් පිහිටුවා ගත යුතුය.

විදේශීය සංස්කෘතිය ගැන කිවයුත්තේ එය පිටු දැකීම වැරදි පිළිවෙතක් බවයි. ඒ වෙනුවට අප කළයුත්තේ චීනයේ නව සංස්කෘතියට වැඩදයක වන එහි ප්‍රගතිශීලී අංගයන්ගෙන් ආභාෂය ලැබීමයි. එය අන්ධ ලෙස අනුකරණය කිරීමත් වැරදිය. අප කළ යුත්තේ චීන ජනතාවගේ නියම අවශ්‍යතාවයනට සරිලන පරිද්දෙන් විචාරශීලීව ඉන් ආභාෂය ලැබීමයි. සෝවියට් දේශයෙහි නිර්මානය කර තිබෙන නව සංස්කෘතිය අපේ ජනතා සංස්කෘතිය ගොඩනගනු සඳහා ආදර්ශයක් ලෙසින් ගතහැක. ඒවගේම පැරණි චීන සංස්කෘතිය සහමුලින් පිටුදැකිය යුතු හෝ අන්ධ ලෙස අනුකරණය කළ යුතු හෝ නොවේ. එය චීනයේ නව සංස්කෘතියේ දියුණුවට ආධාර වන පරිදි හොඳ නරක තෝරා බේරා පිළිගත යුතුය.

9. සුළු ජාතීන් පිළිබඳ ප්‍රශ්නය

කුඕමින්තානයේ ජනතා විරෝධී කල්ලිය චීනයෙහි ජාතීන් බොහොවක් වෙසෙන බව නොපිළිගනිති. හැන්ග් ජාතිය හැරුන විට අනිත් සියළුම ජාතීන් ඔවුන් හංවඩු ගසන්නේ "ගෝත්‍ර" ලෙසිනි. ඔවුහු සුළු ජාතීන් සම්බන්ධයෙන් චිං රජ පෙළපතේ සහ උතුරු යුධාධිපතියන්ගේ ආංඩුවල ප්‍රතිගාමී පිළිවෙතම අනුගමනය කරමින් එම ජාතීන් හැකි සෑම ආකාරයකින් පීඩනයට හා සූරාකෑමට ලක් කරති. 1943 දී ඉක්වාඕ සංගමයට අයත් මොංගෝලියානු ජාතිකයන් ඝාතනය කර දැමීමත් 1944 දී සිංකියැන් පලාතේ සුළු ජාතීන් ආයුධ බලයෙන් මැඩලීමත් මෑත කලෙකදී කාන්සූ පලාතේ හුයි ජනතාව සංහාරය කිරීමත් ඒ පිළිබඳ පැහැදිලි නිදසුනකි. මේවා වැරදි සහගත හැන්-පටු ජාතිවාදී ප්‍රතිපත්තිය හා දෘෂ්ඨියක ලක්ෂණයන්ය.

ආචාර්ය සුන් යත් සෙන් 1924 දී කුඕමින්තානයේ ප්‍රථම ජාතික සම්මේලනයේ වැඩ සටහනෙහි මෙසේ ප්‍රකාශ කර තිබේ. "කුඕමින්තානයෙහි ජාතික ප්‍රතිපත්තියෙහි අර්ථ දෙකක් තිබේ. පලමුවැන්න චීන ජාතියට විමුක්තිය උදකර ගැනීමයි. දෙවැන්න චීනයේ සියළු ජාතීන්ට සමානාත්මතාවය හිමිකර දීමයි. චීනයේ සියළු ජාතීන්ගේ ස්වයං තීරණ අයිතිය තමන් පිළිගන්නා බවත් අධිරාජ්‍ය විරෝධී යුධාධිපති විරෝධී විප්ලවය ජයගත් විගස නිදහස් හා එක්සත් චීන සමූහ ආංඩුවක් (සියළු ජාතීන්ගේ නිදහස් සංගමයක්) පිහිටුවන බවත් කුඕමින්තානය භක්ති පූර්වකව ප්‍රකාශ කර සිටී".

මෙහි සඳහන් ආචාර්ය සුන්ගේ ජාතීන් පිළිබඳ පිළිවෙතට චීන කොමියුනිස්ට් පක්ෂය සහමුලින් එකඟය. ඒ සඳහා සටන් කිරීමට සියළු සුළු ජාතීනට අයත් ජනතාවට කොමියුනිස්ට්වාදී කාර්යශීලීහු

LIBERATIONBASE

ආධාර කළ යුතුය. ඒවගේම ස්වකීය දේශපාලන ආර්ථික හා සංස්කෘතික විමුක්තිය හා අභිවර්ධනය සඳහා සටන් කිරීමටත් ජනතාවගේ සුභසෙත රකිනු සඳහා ස්වකීයම වූ හමුදා පිහිටුවා ගැනීමටත් කොමියුනිස්ට්වාදීන් සුළු ජාතීනට හා ජන සබඳකම් ඇති ඔවුන්ගේ නායකයනට ආධාර කළ යුතුය. ඔවුන්ගේ කථික හා ලිඛිත භාෂාවනට, ඔවුන්ගේ සිරිත් විරිත්වලට හා ආගමික විශ්වාසයනට ගරු කළ යුතුය.

ෂෙන්සි–කාන්සු–නින්සියා දේශ සීමා ප්‍රදේශය සහ උතුරු චීනයේ විමුක්ති ප්‍රදේශ අවුරුදු ගණනාවක් මුලුල්ලේ මොන්ගෝලියානු සහ හුයි ජාතීන් සම්බන්ධයෙන් අනුගමනය කර ඇති ප්‍රතිපත්තිය නිවැරදිය. එම පෙදෙස් විසින් ගෙන ඇති පියවර වැඩදායක වී තිබේ.

10. විදෙස් පිලිවෙත පිළිබඳ ප්‍රශ්නය

අත්ලන්තික් ප්‍රඥප්තිය සහ මොස්කව්, කයිරෝ, ටෙහෙරාන් ක්‍රිමියා[12] ජාත්‍යන්තර සම්මේලන විසින් ගත් තීරණයන් පැසිස්ට් ආක්‍රමණිකයන් පරාජය කිරීමට හා ලෝක සාමය රැකීමට තුඩු දෙන හෙයින් චීන කොමියුනිස්ට් පක්ෂය ඒවාට එකඟ වේ.

චීන කොමියුනිස්ට් පක්ෂය ඉදිරිපත් කරන විදෙස් පිලිවෙතේ මූල ධර්මය මෙසේය: ජපන් ආක්‍රමණිකයන් සම්පූර්ණයෙන් පරාජය කළ යුතුය, ලෝක සාමය ආරක්ෂා කළ යුතුය. ජාතික ස්වාධීනත්වය හා සමානතාවය කෙරෙහි අන්‍යෝන්‍ය වශයෙන් ගරු කළ යුතුය. රාජ්‍යයන් හා ජනතාවන් අතර අන්‍යෝන්‍ය සුභසෙත හා උවමනාවන් සහ මිත්‍රත්වය වැඩි දියුණු කළ යුතුය, යන මූලික කොන්දේසි උඩ චීනය සියළු රටවල් සමග තානාපති සබඳකම් ඇතිකර ගෙන යුධ කටයුතු, සාම සාකච්ඡා, වෙළඳාම හා මුදල් ආයෝජනය කිරීම ආදී පොදුවේ බලපාන සියළු ප්‍රශ්න නිරාකරණය කරගනු ඇත.

යුධයෙන් පසු ජාත්‍යන්තර සාමය හා ආරක්ෂාව සලසනු සඳහා සංවිධානයක් පිහිටුවීමට ඩුම්බාටන් ඕක්ස් සම්මේලනය හා ක්‍රිමියා සම්මේලනය විසින් ගන්නා ලද තීරණවලට චීන කොමියුනිස්ට් පක්ෂය සහමුලින් එකඟවේ. සැන්ප්‍රැන්සිස්කෝවේ පැවති ජාත්‍යන්තර සහයෝගය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මේලනයද පක්ෂයේ ප්‍රසාදයට ලක්වේ. චීන ජනතාවගේ අභිමතය පලකරනු සඳහා කොමියුනිස්ට් පක්ෂය විසින් මේ සම්මේලනයට සහභාගිවන චීන දූත පිරිසට ස්වකීය නියෝජිතයකු පත් කර තිබේ.[13]

කුඕමින්තාන ආංඩුව සෝවියට් දේශය කෙරෙහි දක්වන සතුරු බව අත්හැර චීන–සෝවියට් සබඳතා සීඝ්‍රයෙන් වැඩි දියුණු කර ගත යුතු බව අපගේ විශ්වාසයයි. චීනය සමග පැවති අසමාන

LIBERATIONBASE

ගිවිසුම් අත්හැර දමා අළුත් සමාන ගිවිසුම් අත්සන් කළ පළමුවන රට සෝවියට් දේශයයි. 1924 දී ආචාර්ය සුන් යත් සෙන් විසින් කුඕමින්තානයේ පළමුවෙනි ජාතික සම්මේලනය කැඳවන ලද අවස්ථාවේදී හා පසුව සිදුවූන උතුරු යුද ගමනේදී චීනයේ විමුක්ති සටනට සහය වූ එකම රට සෝවියට් දේශයයි. 1937 දී ජපන් විරෝධී යුධය ඇරඹුන විට ජපන් ආක්‍රමණිකයින්ට විරුධව චීනයට ආධාර දුන් පළමුවෙනි රට සෝවියට් දේශයයි. මේ උදව් උපකාරයන් ගැන චීන ජනතාව සෝවියට් දේශයට කෘතඥවේ. ශාන්තිකර පෙදෙසේ ප්‍රශ්නයන් සෝවියට් දේශයේ සහභාගීත්වයෙන් තොරව අවසාන වශයෙන් හා තරයේ නිරාකරණය නොකළ හැකි බව අපි විශ්වාස කරමු.

චීන ජනතාවගේ හඬට හොඳින් සවන් දෙන ලෙසත් ඔවුන්ගේ අභිමතයට පටහැනි විදෙස් පිළිවෙත් අනුගමනය කරමින් ඔවුන් සමග ඇති මිත්‍රත්වයට හානි නොකරගන්නා ලෙසත් එක්සත් ජනපදය හා බ්‍රිතාන්‍ය ප්‍රමුඛ සියළු මිත්‍ර රටවල ආංඩුවලින් අපි ඉල්ලා සිටිමු. යම්කිසි විදේශීය ආංඩුවක් චීනයේ ප්‍රතිගාමීන්ට උදව් කරමින් චීන ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයට සතුරුකම් කරයි නම් එය බරපතල වරදක් කරන බව අපි කියා සිටිමු.

චීනය සමග පැවති අසමාන ගිවිසුම් අතහැර දමා අළුත් සමාන ගිවිසුම් ඇතිකර ගැනීමෙන් බොහෝ විදේශීය ආංඩු ගෙන ඇති පියවර චීන ජනතාව විසින් අගය කරනු ලැබේ. කෙසේ වුවද සමාන ගිවිසුම් ඇතිකර ගත් පලියට චීනය ඇත්තවශයෙන්ම නියම සමතාවයක් දිනාගෙන ඇති බවක් අපි විශ්වාස නොකරමු. අවංක හා නියම සමානතාවය කිසිමදක විදේශීය ආංඩුවලින් තෑගි වශයෙන් ලැබෙන දෙයක් නොවේ. එය ප්‍රධාන වශයෙන් චීන ජනතාව ස්වෝත්සාහයෙන් දිනාගත යුත්තකි. එය දිනාගැනීමේ මාර්ගය නම් දේශපාලන ආර්ථික හා සංස්කෘතික වශයෙන් නව ප්‍රජාතන්ත්‍රවාදී චීනයක් ගොඩනැගීමයි. එසේ නොමැති නම් ඇතිවන්නේ නාම මාත්‍ර ස්වාධීනතාවයක් හා සමානතාවයත් විනා නියම ස්වාධීනතාවයක් හා සමානතාවයක් නොවේ. වෙන වචනවලින් කියතොත් කුඕමින්තාන ආංඩුවේ වර්තමාන පිළිවෙත අනුගමනය කිරීමෙන් චීනයට කිසිදක නියම ස්වාධීනතාවය හා සමානතාවය දිනාගත නොහැක. ජපන් ආක්‍රමණිකයන් පරාජය කිරීමෙන් හා කොන්දේසි විරහිත යටත්වීමකට භාජන කිරීමෙන් පසු ජපන් පැසිස්ට්වාදය හා යුධකාමිත්වයත් එහි දේශපාලන ආර්ථික හා සමාජයීය මූලයනුත්

තරයේ අහෝසිකර දැමිය හැකිවන පරිද්දෙන් ස්වකීයම වූ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයක් පිහිටුවා ගැනීමට ජපන් ජනතාවගේ සියළු ප්‍රජාතන්ත්‍රවාදී බලවේගයනට ආධාර කළයුතු යයි අපි කල්පනා කරමු. ජපන් ජනතාව සතුව ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයක් නොමැතිතුරු ජපන් පැසිස්ට් වාදය හා යුධකාමිත්වය අකාමකා දමනු හෝ ශාන්තිකර පෙදෙසෙහි සාමය රකිනු හෝ කළ නොහැකි දෙයකි.

කොරියාවේ ස්වාධීනතාවය සම්බන්ධයෙන් කයිරෝ සම්මේලනය ගත් තීරණය නිවැරදි බව අපේ හැඟීමයි. විමුක්තිය දිනාගනු සඳහා චීන ජනතාව කොරියානු ජනතාවට ආධාර කළයුතුය.

ඉංදියාව ස්වාධීනතාවය දිනා ගනු ඇතැයි අපි අපේක්ෂා කරමු. ස්වාධීන හා ප්‍රජාතන්ත්‍රවාදී ඉංදියාවක් ඉංදීය ජනතාවට උවමනා කරනවා පමණක් නොව ලෝක සාමය සඳහාද එය අවශ්‍යය.

බුරුමය, මලයාව, ඉන්දුනීසියාව, වියට්නාමය සහ පිලිපයිනය ආදී අග්නිදිග ආසියාතික රටවල් සම්බන්ධයෙන් අප බලාපොරොත්තු වන්නේ එම රටවල ජනතාව ජපන් ආක්‍රමනිකයන් පරාජය කිරීමෙන් පසු ස්වාධීන හා ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයන් පිහිටුවීමේ අයිතිය ක්‍රියාත්මක කරාවිය යන්නය. තායිලන්තයට සැලකිය යුත්තේ යුරෝපයේ පැසිස්ට්වාදී රුකඩ රාජ්‍යයනට සලකන ආකාරයෙනි.

අපගේ විශේෂ වැඩ සටහනේ ප්‍රධාන කරුණු සම්බන්ධයෙන් කිවයුත්තේ එපමනය.

මේ විශේෂ වැඩ සටහනේ කිසිදු කරුණක් සමස්ත ජාතියේ සහයෝගය ලබන ප්‍රජාතන්ත්‍රවාදී සහාග ආංඩුවක් නොමැතිව රටපුරා සාර්ථක ලෙසට ක්‍රියාත්මක කළ නොහැක. චීන කොමියුනිස්ට් පක්ෂය චීන ජනතාවගේ විමුක්තිය සඳහා ගෙනගිය විසි හතර වසරක අරගලය හේතු කොට ගෙන එම පක්ෂය හිමි කරගෙන ඇති තත්වය කෙබඳුද කිවහොත් චීනය සම්බන්ධයෙන් එම පක්ෂය දරන මත නොසලකා හරින්නා වූ යම් දේශපාලන පක්ෂයක් හෝ සමාජ කංඩායමක් හෝ යම් චීනෙක් හෝ විදේශිකයෙක් හෝ වේ නම් ඔවුන් ඒ කරන්නේ බරපතල වරදකි. ඔවුන් ඒ ගන්නේ සහතික වශයෙන් අසාර්ථකවන පියවරකි. අපේ සිතුම් පැතුම් අමතක කොට දමා තමන්ගේම වැරදි ක්‍රියා මාර්ගයන් අනුගමනය කරන සමහරු එදත් සිටියහ, අදත් සිටිති. එහෙත්, ඒ සියළු දෙනා අතරමං වී ඇත්තාහ. මන්ද? ඊට හේතුව අපේ සිතුම් පැතුම්

LIBERATIONBASE

චීන ජනතාවගේ සුභ සිද්ධියට අනුකූලවන හෙයිනි. චීන කොමියුනිස්ට් පක්ෂය චීන ජනතාවගේ ඉතාම භක්තිමත් නියෝජිතයා වේ. ඊට ගරු කිරීමට අසමත් වන යමෙක් වේ නම් ඔවුහු ඇත්ත වශයෙන්ම චීන ජනතාවට ගරු නොකරත්. ඔවුන් පරාජය වනු සිකුරුය.

කුඕමින්තාන පෙදෙස්වල ඉටු කළ යුතු කාර්‍යයන්

මවිසින් දුන් අප පක්ෂයේ පොදු හා විශේෂ වැඩ සටහන් ගැන විස්තර සහගත ලෙස කරුණු පැහැදිලි කරන ලදී. මේ වැඩ සටහන් අන්තිමේදී චීනය පුරා ක්‍රියාත්මක කරන බව නිසැකය. ජාත්‍යන්තර හා දේශීය තත්වය සමස්තයක් වශයෙන් ගත් විට චීන ජනතාව සඳහා විවෘත වී ඇති අනාගතය එබඳුය. කෙසේ වුවද දැනට කුඕමින්තාන පෙදෙස්වල, සතුරාට යටත් පෙදෙස්වල හා විමුක්ති පෙදෙස්වල තත්වය එකිනෙකට වෙනස්ය. අපගේ වැඩ සටහන ක්‍රියාත්මක කිරීමෙහිදී මේ වෙනස්කම් සැලකිල්ලට ගැනීම අවශ්‍ය විය. විවිධ තත්වයන් අනුව විවිධ කාර්‍යයන් පැන නගී. මේ සමහර කාර්‍යයන් මවිසින් දැනටමත් තේරුම් කරදී ඇති අතර අනික්වා ගැන වැඩි දුර විවරණයක යෙදිය යුත්තේය.

කුඕමින්තාන ප්‍රදේශවල දේශප්‍රේමී කටයුතුවල යෙදීමට ජනතාවට නිදහස නැත. එහි ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයන් නීති විරෝධී ලෙසින් සලකනු ලැබේ. එහෙත් විවිධ සමාජ කොටස්, ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ හා පුද්ගලයන් වැඩි වැඩියෙන් ක්‍රියාකාරී වෙමින් සිටිති. කුඕමින්තානයේ ඒකපාක්ෂික ආඥාදායකත්වය අවසන් කොට දමා සභාග ආංඩුවක් පිහිටුවිය යුතු යයි ඉල්ලා සිටිමින් චීන ප්‍රජාතන්ත්‍රවාදී සංගමය මේ අවුරුද්දේ ජනවාරියේදී ප්‍රකාශයක් නිකුත් කෙළේය. බොහෝ ජන කොටස් එබඳු වූ ප්‍රකාශන නිකුත් කර තිබේ. කුඕමින්තානය තුළ සිටින බොහෝ අයද තම පක්ෂයේ ප්‍රමුඛ සංවිධානවල ප්‍රතිපත්ති ගැන වැඩි වැඩියෙන් සැක කිරීමට හා කලකිරීමට පටන්ගෙන තිබේ. තම පක්ෂය ජනතාවගෙන් ඈත්වීමේ අන්තරාය වැඩි වැඩියෙන් අවබෝධ කරගෙන සිටින ඔවුහු, කලට ඔබින ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණයන් ඉල්ලා සිටිති. චුංකිංහි සහ අනිකුත් ප්‍රදේශවල කම්කරුවන්, ගොවීන්, සංස්කෘතික කංඩායම්, ශිෂ්‍යයන්,

අධ්‍යාපනික කංඩායම්, කාන්තාවන්, කර්මාන්ත හා වෙළඳ කංඩායම්, රජයේ සේවකයන් අතරත්, හමුද භටයන් හා නිළධාරීන් අතරත් ප්‍රජාතන්ත්‍ර ව්‍යාපාරයන් වැඩෙමින් පවතී. සියළු පීඩිත ජන කොටස්වල ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයන් පොදුවූ පරමාර්ථයක් වටා ක්‍රමක්‍රමයෙන් ඒකරාශීවන බව මේ කරුණු වලින් පෙනේ. වර්තමාන ව්‍යාපාරවල එක් දුබලතාවයක් නම් සමාජයේ මූලික කොටස් තවම පුළුල් වශයෙන් ඊට සම්බන්ධව නොසිටීමයි. ඉතාම වැදගත් බලවේගයන් වන කටුක පීඩනයට ලක්වී සිටින ගොවීන්, කම්කරුවන්, සොල්දදුවන්, රජයේ සුළු සේවකයන් හා ගුරුවරුන් තවම සංවිධානවී නොමැත. තවත් දුබලකමක් නම් ව්‍යාපාරයට සම්බන්ධ බොහෝ ප්‍රජාතන්ත්‍රවාදී පුද්ගලයන් මූලික ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් – එනම් ප්‍රජාතන්ත්‍රවාදී ජනතා පදනමක් උඩ කෙරෙන අරගලයක් තුලින් – තත්වයෙහි වෙනසක් සිදුකළ යුතු බව තවමත් නොපැහැදිලි හා විචිකිච්ඡා සහගත තත්වයක සිටීමයි. කෙසේ වුවද සියළු පීඩිත ජනකොටස්වලට, දේශපාලන පක්ෂවලට හා සමාජ කොටස්වලට ක්‍රමක්‍රමයෙන් අවදිවී එක්සත් වීමට යථාතත්වය විසින් බලකරනු ලැබේ. මේ ව්‍යාපාරයේ ඉදිරි ගමන වැලැක්මට කුඕමින්තාන ආංඩුවේ මර්දනකාරී ක්‍රියාවන් අපොහොසත්ය. කුඕමින්තාන පෙදෙස්වල සියළු පීඩිත ජන කොටස් දේශපාලන පක්ෂ හා සමාජ කොටස් ස්වකීය ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාර පුළුල් පරිමාණයකින් ව්‍යාප්ත කොට ජාතික සමගිය සඳහාත්, සභාග ආංඩුවක් පිහිටුවනු සඳහාත් ජපන් ආක්‍රමණිකයන් පරාජය කරනු සඳහාත්, නව චීනයක් ගොඩ නගනු සඳහාත්, විසිරී ගිය ස්වකීය බලවේගයන් ක්‍රමක්‍රමයෙන් ඒකාබද්ධ කළ යුතුය. චීන කොමියුනිස්ට් පක්ෂය හා විමුක්ති ප්‍රදේශවල ජනතාව ඔවුනට හැකි සෑම ආධාරයක් සැපයිය යුතුය.

කුඕමින්තාන ප්‍රදේශවල කොමියුනිස්ට්වාදීන් ජපන් විරෝධී පුළුල් ජාතික එක්සත් පෙරමුණක පිලිවෙත නොකඩවා අනුගමනය කළ යුතුය. පොදු පරමාර්ථයන් සඳහා කරන සටනේදී ඊයේ අපට විරුද්ධව කටයුතු කළ මුත්, අද එසේ නොකරන ඕනෑම කෙනෙකු සමග සහයෝගයෙන් කටයුතු කළ යුත්තෙමු.

ජපනාට යටත් ප්‍රදේශවල කළයුතු කාර්‍යයන්

ආයුධ සන්නද්ධ කැරලි ගැසීම් ඇති කරනු සඳහා ප්‍රංශ හා ඉතාලි ආදර්ශයන් අනුව යමින් සංවිධාන හා රහස් හමුද ගොඩනගන ලෙස

LIBERATIONBASE

යටපත් වී ඇති ප්‍රදේශවල ජපන් විරෝධී සියළු දෙනාගෙන් කොමියුනිස්ට්වාදීන් ඉල්ලා සිටිය යුතුය. එවිට නිසිකල එළඹී විට පිටතින් පහරදෙන හමුදවන් සමග සම්බන්ධ වී ජපන් ආක්‍රමණිකයන් අතුගා දැමීමට ඔවුහු සමත් වන්නාහ. ජපන් ආක්‍රමණිකයන් සහ ඔවුන්ගේ වහල් ගැත්තන් විසින් යටපත් ප්‍රදේශවල වෙසෙන අපගේ සහෝදර සහෝදරියනට කරන ලද අපරාධයන්, මංකොල්ලකෑම්, ස්ත්‍රී දූෂණ හා චිත්ත පීඩාව සියළු චීන ජාතිකයන්ගේ කෝපාග්නියට තුඩුදී තිබේ. ඔවුන්ගෙන් පලිගන්නා මොහොත සීඝ්‍රයෙන් ලඟාවෙමින් පවතී. යුරෝපීය යුධ බිමෙහි අත්වී ඇති ජයග්‍රහණයන් අපේ අටවෙනි මාර්ග හමුදව හා නව සිව්වෙනි හමුදව විසින් අත්කර ගෙන ඇති ජයග්‍රහණයන්ද හේතු කොට ගෙන, යටපත් ප්‍රදේශවල ජනතාවගේ ජපන් විරෝධී හැඟීම් උසි ගැන්වී පණ ගැන් වී තිබේ. හැකිතාක් ඉක්මනින් විමුක්තිය උදකර ගනු සඳහා සංවිධානය වීමට ඔවුනට වහාම උවමනා කර තිබේ. එම නිසා යටපත් ප්‍රදේශවල අපේ වැඩ කටයුතු වලට, විමුක්ති ප්‍රදේශවල අපේ වැඩකටයුතු වලට තරම් වැදගත් තැනක් දිය යුතුය. අපේ ක්‍රියාකාරී පුද්ගලයන් විශාල සංඛ්‍යාවක් එහි වැඩ කරනු සඳහා පිටත් කළ යුතුය. මෙහි ජනතාව අතර සිටින ක්‍රියාකාරී පුද්ගලයන් විශාල සංඛ්‍යාවක් පුහුනු කළ යුතු අතර ඔවුන් ඒ ප්‍රාදේශීය වැඩ කටයුතුවල නිරත විය යුතුය. අන් කිසිම පලාතකට වඩා දිගු කලක් යටපත් වී සිටින්නාවූද ජපන් ආක්‍රමනිකයන්ගේ කර්මාන්ත ව්‍යාපාර හා භට සේනාවන් වැඩි වශයෙන් ඒකරාශි වී තිබෙන්නාවූද ඊසාන දිග සතර පලාතෙහි අපේ රහස් කටයුතු අධික කළ යුතුය. මේ අහිමි වූ ප්‍රදේශ ආපසු අල්ලා ගැනීමේ අරමුණ ඇතිව ඊසාන දිග සිට දකුණට පලා විත් සිටින ජනතාව සමග අපි වඩ වඩා සහයෝගයෙන් ක්‍රියාකළ යුත්තෙමු.

සියළු යටත් ප්‍රදේශවල කොමියුනිස්ට්වාදීහු ඉතාම පුළුල් එක්සත් පෙරමුණු ප්‍රතිපත්තියක් අනුගමනය කළ යුතුය. පොදු සතුරා පරාජය කරනු සඳහා ඔවුහු ජපන් ආක්‍රමනිකයන්ට හා ඔවුන්ගේ වහල් ගැත්තන්ට රුහැනි වූ ඕනෑම කෙනෙකු සමග එක්සත් විය යුත්තාහ.

රූකඩ හමුදවන් රූකඩ පොලිසිය හා සතුරාට ආධාර වෙමින් ස්වකීය රටවැසියනට එරෙහිව කටයුතු කරන සියළු දෙනා තම ක්‍රියාවන්හි සාපරාදිභාවය ඉක්මනින් අවබෝධ කරගෙන කල් ඇතිව ඒ ගැන පසුතැවිලි වී ඒ අපරාධවල පාපය ගෙවනු සඳහා සතුරාට පටහැනිව රටවැසියනට ආධාර කළයුතු බවට අපි ඔවුනට අවවාද කළ යුත්තෙමු. ඔවුන් එසේ නොකළහොත් සතුරා ඇද වැටුනු ද ජාතිය විසින් සහතික වශයෙන් ඔවුන් ගැන වගබලා ගන්නවා ඇත.

මහජන අනුගාමිකත්වයක් ඇති සියළු රූකඩ සංවිධාන කෙරෙහි ප්‍රචාරක කටයුතු යොමුකර නොමග ගිය ජනතාව ජාතියේ සතුරාට විරුඩව අපේ පැත්තට නමා ගනු සඳහා කොමියුනිස්ට්වාදීන් ක්‍රියාකළ යුතුය. ඒ එක්කම ඉතාම බිහිසුනු අපරාධ කර තිබෙන්නාවූ ද දඩබ්බර ලෙස සතුරා සමග සහයෝගයෙන් කටයුතු කරන්නාවූද පුද්ගලයන් පිළිබඳ සාක්ෂි රැස්කළ යුතුය. එවිට නැති වූ පෙදෙස් ආපසු අල්ලා ගත් විට ඔවුනට යුක්තිය ඉටුකළ හැකිවේ.

LIBERATIONBASE

චීන ජනතාවට, කොමියුනිස්ට් පක්ෂයට, අටවෙනි මාර්ග හමුදවට, නව සිව්වෙනි හමුදවට සහ ජනතාවගේ සෙසු ආයුධ සන්නද්ධ හමුදවනට විරුද්ධව එළිපිටම සතුරා සමග එක්වී සටන් කරනු සඳහා පුද්ගලයන් සංවිධාන කිරීමෙන් ජාතිය පාවා දුන් කුඹිමින්තාන ප්‍රතිගාමීන්, කල්වේලා ඇතිව ඒ වැරදි හරි ගස්සා ගතයුතු බවට ඔවුනට අනතුරු ඇඟවීමක් කළ යුතුය. ඔවුන් එසේ නොකළහොත් අහිමිවූ ප්‍රදේශ නැවත අල්ලා ගත් පසු ජපනාට සහයෝගය දක්වූවන්ට දඬුවම් කරන ගමන් මොවුන්ගේ අපරාධ ගැන මොවුනටද සහතික වශයෙන් දඬුවම් කරනු ලැබේ. මොවුනට අනුකම්පාවක් දක්වන්නේ නැත.

විමුක්ති ප්‍රදේශවල කළ යුතු කාර්යයන්

අප පක්ෂය විසින් එහි සම්පූර්ණ නව ප්‍රජාතන්ත්‍රවාදී වැඩ සටහන කඩිම සාර්ථක ප්‍රතිඵල සහිතව විමුක්ති ප්‍රදේශවල ක්‍රියාවට නංවා එමගින් දැවැන්ත ජපන් විරෝධී බලයක් ගොඩ නගා තිබේ. මෙතැන් පටන් මේ ශක්තිය සෑම ආකාරයකින් වර්ධනය කොට තහවුරු කළ යුතුය,

දැනට පවත්නා තත්වයන් යටතේ විමුක්ති ප්‍රදේශ පුළුල් කොට යටත් ප්‍රදේශ අඩු කරනු සඳහා විමුක්ති ප්‍රදේශවල භට

සේනාවෝ ජපනුන්ගෙන් හා ඔවුන්ගේ ගැත්තන්ගෙන් ආපසු අල්ලා ගතහැකි සෑම තැනකටම දිගට හරහට පහර දිය යුත්තාහ.

ඒ එක්කම මතක තබා ගත යුත්තක් නම්, සතුරා තවම බලසම්පන්න බවත් ඔවුන් විමුක්ති ප්‍රදේශවලට තව තවත් පහර දිය හැකි බවත්ය. අපේ ප්‍රදේශවල හමුදව සහ ජනතාව සතුරු පහරවල් මැඩලීමට නිරන්තර සූදනමින් සිටිය යුත්තා සේම, එම ප්‍රදේශ තහවුරු කරගැනීමට සෑම ආකාරයකින් කටයුතු කළ යුතුය.

විමුක්ති ප්‍රදේශවල හමුදවන්, ගරිල්ලා සේනාවන්, මහජන බලකායන් සහ ස්වයං ආරක්‍ෂක බලකායන් පුළුල් කොට ආක්‍රමනිකයන් අවසාන වශයෙන් පරාජය කිරීමට ප්‍රමාණවත් තරමේ ශක්තියක් ගොඩනැගිය හැකිවන පරිදි එම බලකායන් පුහුනු කිරීම හා තහවුරු කිරීම ඉක්මන් කොට ඒවායෙහි සටන් ශක්තිය අධික කළයුතුය.

විමුක්ති ප්‍රදේශවල හමුදව රජයට ආධාර කළයුතුය. ජනතාව රැකබලා ගත යුතුය. හමුදවට ආධාර කිරීමටත් ජපානයට විරුද්ධවත් සටන් කරන සොල්දදුවන්ගේ පවුල් හොඳින් රැකබලා ගැනීමටත් ජනතාව යොමු කිරීම ප්‍රජාතන්ත්‍රවාදී ආංඩු සතු කාර්‍යයකි. මෙසේ කටයුතු කරන විට හමුදව හා ජනතාව අතර ඇති සම්බන්ධය තව තවත් වැඩි දියුනු වන්නේය. ප්‍රාදේශීය සභාග ආංඩු වල සහ මහජන සංවිධානවල වැඩ කටයුතු වලදී කොමියුනිස්ට්වාදීහු නව ප්‍රජාතන්ත්‍රවාදී වැඩ සටහන පදනම් කරගෙන ජපන් විරෝධි ප්‍රජාතන්ත්‍රවාදීන් සමග කිට්ටු සහයෝගයකින් දිගින් දිගටම ක්‍රියා කළ යුතුය.

ඒ වගේම යුද්ධ කටයුතු වලදී අප සමග සහයෝගයෙන් කටයුතු කිරීමට කැමති සියළු ජපන් විරෝධී ප්‍රජාතන්ත්‍රවාදීන් සමග – ඔවුන් විමුක්ති ප්‍රදේශවල හමුදවන්හි සාමාජිකයන් වුවත් නොවුවත් – කොමියුනිස්ට්වාදීහු කිට්ටු සහයෝගයකින් ක්‍රියා කළ යුත්තාහ.

යුද්ධය හා නිෂ්පාදන කටයුතු සඳහා කම්කරුවන් ගොවීන් සහ සෙසු වැඩ කරන ජනතාව වඩ වඩා උනන්දු කරවනු සඳහා බදු

කුලී සහ පොලිය අඩු කිරීමේ ප්‍රතිපත්තියද කම්කරුවන්ගේ හා කාර්‍යාලීය සේවකයන්ගේ පඩි වැඩි කිරීමේ ප්‍රතිපත්තියද තරයේ ක්‍රියාත්මක කළ යුතුය. විමුක්ති ප්‍රදේශවල කාඩර්වරු ආර්ථික කටයුතු වල යෙදීමට ප්‍රඥාන්විතව ඉගෙන ගත යුතුය. කෘෂිකර්මය, කර්මාන්ත හා වෙළඳාම පුළුල් ලෙස වර්ධනය කරනු සඳහාත්, සොල්දදුවන්ගේ හා ජනතාවගේ ජීවන තත්වය වැඩි දියුනු කරනු සඳහාත් සියළු බලවේගයන් සංවිධාන කළ යුතුය. මෙම කාර්‍යය සඳහා ආදශීමත් ශ්‍රම ව්‍යාපාර පවත්වා ශ්‍රමයේ වීරයනට හා ආදශීමත් කම්කරුවනට තෑගි පිරිනැමිය යුතුය. ජපන් ආක්‍රමණිකයන් නගර වලින් පලවා හැරීමෙන් පසු නාගරික ආර්ථික කටයුතු කරගෙන යන ආකාරය අපේ නිලධාරීන් විසින් සීඝ්‍රයෙන් ඉගෙන ගත යුතුය.

විමුක්ති ප්‍රදේශවල ජනතාවගේ – විශේෂයෙන්ම ගොවි කම්කරුවන්ගේ හා සොල්දදුවන්ගේ – දේශපාලන ඥානයේ මට්ටම ඉහල නංවනු සඳහාත් කාඩර්වරු විශාල සංඛ්‍යාවක් පුහුනු කරවනු සඳහාත් අපගේ සංස්කෘතික හා අධ්‍යාපනික කටයුතු වර්ධනය කළ යුතුය. මේ පියවර ගැනීමේදී ඊට සම්බන්ධ අය විසින් ග්‍රාමීය තත්වයනට හා ගම්බද ජනතාවගේ අවශ්‍යතාවයනට හා ප්‍රාර්ථනයට ගැලපෙන අන්දමේ ස්වරූපයන් හරයයන් තෝරා ගත යුතුවේ.

විමුක්ති ප්‍රදේශවල අපගේ සියළු වැඩකටයුතු වලදී මිනිස් ශක්තිය හා ද්‍රව්‍ය ශක්තිය ඉතා සකසුරුවම්ව ප්‍රයෝජනයට ගත යුතුය. සෑම ක්‍ෂෙත්‍රයකදී දීඝීකාලීන සැලැස්මක් අනුව වැඩකළ යුතු අතර වැරදි ලෙස පාවිච්චි කිරීම හා අපතේ යැවීම මග හැලයුතුය. ජපන් ආක්‍රමනිකයන් පරාජය කිරීමට මෙන්ම නව චීනය ගොඩ නැගීමටද මෙසේ කිරීම අවශ්‍ය වේ.

විමුක්ති ප්‍රදේශවල අප කරන සියළු කටයුතු වලදී, ප්‍රාදේශීය කටයුතු පරිපාලනය කරනු සඳහා, ප්‍රාදේශීය ජනතාවට උදව්වීමට විශේෂයෙන් වගබලා ගතයුතුය. හොඳම ප්‍රාදේශීය ජනයා අතුරින් බොහෝ ප්‍රාදේශීය කාඩර්වරුන් ගොඩ නැගීමටද විශේෂයෙන් වගබලා ගත යුතුය. අනිකුත් ප්‍රදේශ වලින් ගම්බද පෙදෙස්වල වැඩට එන සහෝදරයන් ප්‍රාදේශීය ජනතාව සමග පෑහීමට අපොහොසත් වූවහොත් – ප්‍රාදේශීය කාඩර්වරුනට මුළු හදවතින්

LIBERATIONBASE

යුක්තව වෙහෙස මහන්සිවී යථා තත්වයනට ගැලපෙන පරිදි උදව්වීමට අපොහොසත් වූවහොත්, ඔවුන් තමන්ගේම සහෝදර සහෝදරියන් ලෙසින් අගය කිරීමට අසමත් වූවහොත්, ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයේ ශ්‍රේෂ්ඨ කාර්ය ගම්බද පෙදෙස්වල සාර්ථක ලෙස ඉටු කිරීමට නොහැකි වන්නේය.

අටවෙනි මාර්ග හමුදාවේ, නව සිව්වෙනි හමුදාවේ හෝ වෙන යම්කිසි මහජන හමුදාවක සේනාංකයක් යම්කිසි පළාත්කට පැමිණි විට එවිසින් වහම කළයුත්තේ ප්‍රාදේශීය කාඩර්වරුන්ගේ නායකත්වයෙන් යුතුව හමුදාවන් ගොඩ නැගීමට ජනතාවට උදව්වීමයි. ඊට මහජන බලකාය සහ ස්වයං ආරක්ෂක බලකාය පමණක් නොව ප්‍රාදේශීය සේනාවන් සහ ප්‍රාන්තීය හමුදාවන්ද ඇතුලත් කළ යුතුය. මෙසේ කළ විට අන්තිමේදී ප්‍රාදේශීය ජනතාවගේ නායකත්වයෙන් යුත් එහි හමුදාවන් සහ ස්ථිර හමුදා සේනාංක ගොඩනැගිය හැකි වන්නේය. මේ ඉතාම වැදගත් කාර්යයකි. එය ඉටුකරන තුරු අපට ස්ථිර ජපන් විරෝධී කඳවුරු පෙදෙස් ගොඩනැගීමට හෝ මහජන හමුදාව පුළුල් කිරීමට හෝ නොහැකි වන්නේය.

ඒවගේම සෙසු පළාත් වලින් එන විප්ලවවාදී කම්කරුවන් හා මහජන හමුදාවන් සාදරයෙන් පිලිගෙන ඔවුනට ආධාර කිරීම ප්‍රාදේශීය ජනතාව සතු යුතුකම වේ.

රහසිගත කඩාකප්පල්කරුවන් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ ප්‍රශ්නය ගැන සියළු දෙනා සෝදිසියෙන් සිටිය යුතුය. මන්ද යත් ජාතික ව්‍යාපාරයට එලිපිටම හතුරුකම් කරන හා එය කඩාකප්පල් කරන අයවලුන් අල්ලා ගැනීම හා ඔවුනට කළයුතු දේ කිරීම පහසු වැඩක් වන මුත් රහසේ ක්‍රියා කරන්නන් ගැන වගබලා ගැනීම එතරම් පහසු නොවන නිසාය. එම නිසා මේ කරුන ඉතා බරපතල ප්‍රශ්නයක් ලෙසින් සලකා එබඳු පුද්ගලයන් සම්බන්ධයෙන් ඉතා ප්‍රවේශමෙන් ක්‍රියා කළ යුතුය.

ආගම් ඇදහීමේ නිදහස පිලිබඳ ප්‍රතිපත්තිය අනුව චීනයේ විමුක්ති ප්‍රදේශවල සියළු ආගම් වලට ඉඩ දී තිබේ, රෙපරමාදු, ක්‍රිස්තියානි ධර්මයේ, කතෝලික ආගමේත්, ඉස්ලාම් ධර්මයේ;

බුද්ධාගමේ සහ අනිකුත් ආගම්වල සියළු අනුගාමිකයන් මහජන ආංඩුවේ නීතිවලට අනුකූලව ක්‍රියා කරනතුරු ඔවුනට එම ආංඩුවේ ආරක්ෂාව සැලසේ. ඇදහීමේ හෝ නැදහීමේ නිදහස සැම කෙනෙකුට තිබේ; බලකිරීමකට හෝ වෙනස් කොට සැලකීමකට හෝ ඉඩ දෙනු නොලැබේ.

විවිධ විමුක්ති ප්‍රදේශවල වැඩ කටයුතු ඒකාබද්ධ කිරීම, ප්‍රතිප්‍රහාරක යුද්ධයේදී එම ප්‍රදේශ වලින් සිදුවන වැඩ කොටස ශක්තිමත් කිරීම, කුඕමින්තාන ප්‍රදේශවල ජනතාවගේ ජපන් විරෝධී ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයට ආධාර කිරීම, යටත් ප්‍රදේශ වල රහසේ කටයුතු කරන ජනතාවගේ ආයුධ සන්නද්ධ හමුදාවනට ආධාර කිරීම, ජාතික සමගිය වැඩි දියුනු කිරීම හා සභාග ආංඩුවක් පිහිටුවීම, ආදී ප්‍රශ්න ගැන සාකච්ඡා කරනු සඳහා හැකිතාක් ඉක්මනින් චීන විමුක්ති ප්‍රදේශවල 14 ජනතා සම්මේලනයක් යේනාන්හිදී පිහිටුවිය යුතු බව අප සම්මේලනය විසින් විමුක්ති ප්‍රදේශවල ජනතාවට යෝජනා කළ යුතුය. ජපන් විරෝධී දේශව්‍යාප්ත ජනතා අරගලයේ සහ රට මුදා ගැනීම සඳහා ගෙන යන අරගලයේ කේන්ද්‍රස්ථානය බවට චීනයේ විමුක්ති ප්‍රදේශ දැන් පත්වී ඇති හෙයින් රට පුරා පුළුල් ජනතාව බලාපොරොත්තු රඳවා ඇත්තේ අප මතය. එනිසා ඔවුන්ගේ බලාපොරොත්තු සුන් නොකිරීම අපේ යුතුකමය. එබඳු සම්මේලනයකින් චීන ජනතාවගේ ජාතික විමුක්ති ව්‍යාපාරයට මහත් රුකුලක් ලැබේ.

LIBERATIONBASE

V. මූළු පක්‍ෂය එක්සත් වී රට හිමි කාර්‍යයන් ඉටුකරනු සඳහා සටන් කළ යුතුය

සහෝදරවරුනි, අප සතු කාර්‍යයන් සහ එම කාර්‍යයන් ඉටු කරනු සඳහා අනුගමනය කළයුතු ප්‍රතිපත්ති දැන් අපට අවබෝධවී ඇති හෙයින් මේ ප්‍රතිපත්ති අනුගමනය කිරීමේදී හා මේ කාර්‍යයන් ඉටු කිරීමේදී අප තුල තිබිය යුත්තේ කෙබඳු ආකල්පයක්ද?

වර්තමාන ජාත්‍යන්තර හා දේශීය තත්වය දෙස බලන විට අපට හා සමස්ත චීන ජනතාවට ප්‍රභාමත් අනාගතයක් හා පෙර නොවූවිරූ ආකාරයේ වාසිදයක තත්වයක් මතුවී ඇති බව පෙනේ. මෙය සුපැහැදිලි නිසැක කරුනකි. එහෙත් ඒ එක්කම තවම බරපතල කම්කටොලු නැත්තේ නොවේ. වාසිදයක අංශය දකින මුත් කම්කටොලු සහගත අංශය නොදකින කිසිවෙකුට පක්‍ෂයේ කාර්‍යයන් ඉටුකරනු සඳහා සාර්ථක ලෙස සටන් කළ නොහැක.

ජපන් විරෝධි ප්‍රතිප්‍රහාරක යුද්ධය කෙරුනු අට අවුරුද්ද ඇතුළු අප පක්‍ෂයේ විසි හතර අවුරුද්දක ඉතිහාසය තුලදී අප පක්‍ෂය චීන ජනතාව සමඟ එක්වී චීන ජාතිය සඳහා දැවැන්ත ශක්තියක් ගොඩනගා තිබේ. අපේ වැඩ කටයුතුවල සාර්ථකත්වය පැහැදිලිය. සැකයෙන් තොරය. එහෙත් ඒ එක්කම අපේ කටයුතු වල තවම සදෙස් තැන් දක්නා ලැබේ. සාර්ථක අංශය පමණක් දකිමින් සදෙස්තැන් නොදකින කිසිවෙකුට පක්‍ෂයේ කටයුතු ඉටු කරනු සඳහා සාර්ථක ලෙස සටන් කිරීමට එපරිද්දෙන්ම නොහැක්කේය.

චීන කොමියුනිස්ට් පක්‍ෂය බිහිවූ වර්ෂ වූ 1921 පටන් මේ දක්වා ගෙවී ගිය විසිහතර අවුරුද්ද තුලදී පක්‍ෂය විශාල අරගල තුනක් ඔස්සේ ගමන් කර තිබේ. එනම් උතුරු යුද ගමනත් ගොවිජන විප්ලවකාරී යුද්ධයත් දැනට කෙරී ගෙන යන

ජපන් විරෝධි ප්‍රතිප්‍රහාරක යුද්ධයත්ය. ආරම්භයේ පටන්ම අප පක්‍ෂය පදනම් වී ඇත්තේ මාක්ස් ලෙනින්වාදී න්‍යාය උඩය. ඒ මන්දයත් මාක්ස් ලෙනින්වාදය වූ කලී ලෝක නිර්ධන පංතියේ ඉතාම නිවැරදි හා ඉතාම විප්ලවවාදී විද්‍යානුකූල චින්තනයේ හරය වීමය. මාක්ස් ලෙනින් වාදයේ විශ්ව සත්‍යය චීන විප්ලවයේ යථා භාවිතයට ඒකාබද්ධ කිරීමට පටන් ගත් පසු චීන විප්ලවය සහමුලින් අළුත් පැහැයක් ගනිමින් මුළු මහත් නව ප්‍රජාතන්ත්‍රවාදී ඓතිහාසික අවධිය උදාවිය. මාක්ස් ලෙනින්වාදී න්‍යායෙන් සන්නද්ධ වූ චීන කොමියුනිස්ට් පක්‍ෂය විසින් චීන ජනතාවට අළුත් වැඩ ශෛලියක් හිමිකර දී තිබේ. අවශ්‍යයෙන්ම න්‍යාය හා භාවිතය ඒකාබද්ධ කිරීමත් ජනතාව සමග කිට්ටු සම්බන්ධකම් ගොඩනැගීමත් ස්වයං විවේචනය ක්‍රියාත්මක කිරීමත් මේ වැඩ ශෛලියේ අංගයන්ය.

ලෝක ව්‍යාප්ත නිර්ධන පංතික අරගලයේ භාවිතය පිලිබිඹු කරන මාක්ස් ලෙනින්වාදයේ විශ්ව සත්‍යය චීන නිර්ධන පංතියේ සහ ජනතාවගේ විප්ලවකාරී අරගලයේ යථාභාවිතය සමග ඒකාබද්ධ කොට ගත් විට එය චීන ජනතාවගේ අතට පත් අනභිභවනීය ආයුධයක් වන්නේය. චීන කොමියුනිස්ට් පක්ෂය විසින් මේ තත්වය උදකර ගෙන තිබේ. මේ ප්‍රතිපත්තියට පටහැනිවූ සෑම ආකාරයක සිද්ධාන්තවාදී සහ ප්‍රායෝගිතාවාදී ලක්ෂණයනට විරුද්ධව කෙරුනු දැඩි අරගලයන් ඔස්සේ අප පක්ෂය වර්ධනය වී ඉදිරියට ගොස් ඇත. සිද්ධාන්ත වාදය යථාභාවිතයෙන් ඈත් වූවක් වන අතර කඩින් කඩ ලබන අත්දැකීම් විශ්ව සත්‍යය ලෙසින් ප්‍රායෝගිතාවාදය විසින් වරදවා වටහා ගනු ලැබේ. මේ දෙආකාරයේම අවස්ථාවාදී චින්තනය මාක්ස්වාදයට පටහැනිය. අවුරුදු විසි හතරක අරගලය තුලදී අප පක්ෂය විසින් මෙබඳු වැරදි චින්තනයට විරුද්ධව සාර්ථක ලෙස සටන් කර තිබේ. දැනුදු එසේ කරනු ලැබේ. මෙසේ කිරීමෙන් පක්ෂය දෘෂ්ඨිමය වශයෙන් බොහෝසේ තහවුරු වී ඇත. දැන් අප පක්ෂයේ සාමාජික සංඛ්‍යාව 12,10,000 කි. බහුතර සංඛ්‍යාව ප්‍රතිප්‍රහාරක යුද්ධය පවතිද්දී බැඳී ඇති අතර ඔවුන්ගේ දෘෂ්ටියෙහි නොයෙක් අපිරිසිදු තැන් තිබේ. යුද්ධයට කලින් පක්ෂයට බැඳුනු සාමාජිකයන් සමහරෙකුගේ තත්වයද එබඳුය. ඉකුත් අවුරුදු ස්වල්පය තුල කරගෙන යන ලද සදෙස් තැන් නිදෙස් කිරීමේ කාර්‍යය අතිශයින් සාර්ථක වී ඇති අතර එම අපිරිසිදු දෑ ඉවත් කිරීම අතින් බොහෝ දුර ගොස් සිටිමු. මේ කටයුත්ත දිගින් දිග

LIBERATIONBASE

වම කරගෙන යා යුතු අතර ''අනාගත වැරදි වලකනු සඳහා අතීත වැරදි වලින් පාඩම් ඉගෙනීමේ,'' සහ ''ලෙඩා බේරා ගනු සඳහා ලෙඩේ සුව කිරීමේ'' පිලිවෙත අනුව යමින් පක්ෂය තුල දෘෂ්ඨිමය අධ්‍යාපනය වඩ වඩා පැතිර විය යුතුය. අප පක්ෂය අනික් සියළු දේශපාලන පක්ෂවලින් වෙන් කොට දක්වන ලක්ෂණය නම් න්‍යාය හා භාවිතය අතර දෘඩ ඒකාබද්ධතාවයක් තිබීම බව පක්ෂයේ සෑම මට්ටමක ප්‍රමුඛ කාඩර්වරුනට වටහා ගැනීමට ඉඩ සැලසිය යුතුය. මේ අනුව බලන විට විශාල දේශපාලන අරගලයන් සඳහා මුළු පක්ෂය එක්සත් කරනු සඳහා තිබෙන්නාවූ ප්‍රධාන බැම්ම දෘෂ්ඨිමය අධ්‍යාපනයයි, මේ කාර්‍යය ඉටුකර තුරු පක්ෂයට එය සතු කිසිදු දේශපාලන කාර්‍යයක් සම්පූර්ණ කළ නොහැක්කේය.

අප පක්ෂය අනිකුත් සියළු දේශපාලන පක්ෂවලින් වෙන්කොට දක්වන ප්‍රධාන ලක්ෂණයක් නම් එය හා පුළුල් බහුජනතාව අතර ඇති කිට්ටු සම්බන්ධතාවයයි. අපගේ විශේෂ ලක්ෂණය වී ඇත්තේ ජනතාවට මුළු හදවතින් සේවය කිරීමත්, ජනතාවගෙන් මොහොතකට හෝ වෙන් වී නොසිටීමත්, සෑම කරුණක් සම්බන්ධයෙන් මහජනයාගේ සුබ සෙත ගැන මුල්තැන දී ක්‍රියා කිරීමත්, පුද්ගලයන්ගේ හෝ කණ්ඩායම්වල සුභසිද්ධිය ගැන නොසැලකීමත්, මහ ජනතාවට අපේ ඇති වගකීමේ හා පක්ෂයේ ප්‍රමුඛ ආයතනවලට ඇති වගකීමේ සමානතාවය වටහා ගැනීමත්ය. කොමියුනිස්ට්වාදීහු සියළු කල්හි සත්‍යයට පක්ෂව නැගී සිටීමට සූදනමින් සිටිය යුතුය. ඊට හේතුව, සත්‍යය ජනතාවගේ යහපත පිණිස වීමයි. කොමියුනිස්ට්වාදීහු සියළු කල්හි ස්වකීය වැරදි හරිගස්සා ගැනීමට සූදනම් විය යුතුය. මන්දයත් වැරදි සහගත දේවල් ජනතා සුභසෙතට පටහැනිවේ. නිවැරදි කාර්‍යය ප්‍රතිපත්තිය හා වැඩ ශෛලිය හේතුකොට ගෙන අවසානයේදී ඒවා යම්කිසි නිශ්චිත අවස්ථාවකදී හා ස්ථානයකදී ජනතාවගේ උවමනාවන්ට සරිලන බවත්, එමගින් අප හා ජනතාව අතර ඇති සබඳකම් තහවුරු වන අතර අනික් අතට, වැරදි සහගත කාර්‍යය ප්‍රතිපත්තිය සහ වැඩ ශෛලිය අවසානයේදී යම්කිසි නිශ්චිත අවස්ථාවකදී හා ස්ථානයකදී ජනතාවගේ උවමනාවන් සමග ඝට්ටනය වී ජනතාවගෙන් අප ඈත් කරන බවත් විසිහතර අවුරුද්දක අත්දැකීම විසින් අපට උගන්

වනු ලැබේ. සිඩාන්තවාදය, ප්‍රායෝගිකතාවාදය, විධානවාදය, වල්ගාවාදය, නිකාය වාදය, නිලධාරි බලය සහ වැඩ කටයුතුවලදී අහංකාර ආකල්පයක් ඇතිකර ගැනීම යන දෝෂයන් ස්ථිර වශයෙන් අනතුරුදායක හා නොපිලිගතහැකි වීමට හේතුව, මේ රෝගවලින් පෙලෙන යම් කෙනෙක් ඒවා සුවකර ගත යුතු වීමට හේතුව, ඒ නිසා අප ජනතාවගෙන් ඈත්වීමට මග පාදෙන බැවිනි. මුළු පක්ෂය සෝදිසියෙන් යුතුව සිටිය යුතු බවටත් කිසිම නිලයක සිටින සහෝදරයෙක් ජනතාවගෙන් ඈත් නොවී සිටිය යුතු බවටත් අප සම්මේලනය වගබලාගත යුතුය. ජනතාවට සෙනෙහස දැක්වීමටත් ඔවුන්ගේ හඬට හොඳින් සවන්දීමටත් යන යන තැනදී ජනතාවට වඩා ඉහලින් සිටිනු වෙනුවට ඔවුන් සමග පෑහී සිටීමටත් ජනතාව තුල මිශ්‍රවීමටත් අප සම්මේලනය විසින් සෑම සහෝදරයෙකුට උගැන්විය යුතුය. ඒ වගේම ඔවුන්ගේ වර්තමාන තත්වයට අනුකූලව ඔවුන් පුබුදුවා හෝ ඔවුන්ගේ දේශපාලන ඥනය ඉහල නංවා යම්කිසි නිශ්චිත වේලාවකදී හා ස්ථානයකදී බල පවත්නා අභ්‍යන්තරික හා බාහිර තත්වයන් අනුව කළ හැකි සියළු අවශ්‍ය අරගලයන් දියත් කිරීමටත් ස්වෙච්ඡාවෙන් සංවිධාන වීමටත් ඔවුනට ක්‍රමක්‍රමයෙන් ආධාරවිය යුතුය. ඕනෑම ආකාරයේ වැඩකදී විධාන වාදය තිබීම හොඳනැත. ඒ මන්දයත් ජනතාවගේ දේශපාලන ඥනයේ මට්ටම ඉක්මවා යෑමෙන් හා ස්වෙච්ඡා මහජන ක්‍රියාකාරිත්වයේ මූලධර්මය උල්ලංඝනය කිරීමෙන් විධානවාදයෙහි ඇති දඩබ්බර කම පිළිබිඹුවේ. තමන්ට තේරෙන සෑම දෙයක් ජනතාවටද තේරේයයි අපේ සහෝදරයන් නොසිතිය යුතුය. ජනතාවට යමක් අවබෝධ වේද ඔවුන් ක්‍රියාකාරී වීමට සූදනම්වේද යනු සොයාගත හැක්කේ ඔවුන් අතරට ගොස් පිරික්සුමක් කිරීමෙන් පමණි. එසේ කළහොත් අපට විධානවාදයෙන් මිදිය හැක. ඕනෑම කටයුත්තකදී වල්ගාවාදය අනුගමනය කිරීමත් වරදකි. මන්දයත් ජනතාවගේ දේශපාලන ඥනයේ මට්ටමට වඩා පහලට වැටීමෙන් හා ජනතාව ඉදිරියට මෙහෙයවීමේ ප්‍රතිපත්තිය උල්ලංඝනය කිරීමෙන් කටයුතු පමා කිරීමේ රෝග ලක්ෂණ පිළිබිඹුවේ. තමන්ට තවම නොතේරෙන දේ ජනතාවටද නොතේරේයයි අප සහෝදරයන් කල්පනා නොකළ යුතුය. බොහෝ අවස්ථාවලදී අප සහෝදරයන් තවමත් ඇතැම් උකටලී කොටස් පිටුපසින් වැටී සිටියදී ජනතාව අප පසු කර

LIBERATIONBASE

ගෙන පියවරක් ඉදිරියට යාමට උනන්දුවෙන් සිටිති. එබඳු සහෝදරවරු ජනතාවගේ නායකයන් ලෙසින් ක්‍රියා කරනු වෙනුවට ඒ ඒ නොදියුණු කොටස්වල අදහස් පිළිබිඹු කරමින් ඒ අදහස් පුළුල් ජනතාවගේ අදහස්යයි වරදවා වටහා ගනිති. කොටින් කියතොත් කොමියුනිස්ට්වාදියකුගේ වචන හා ක්‍රියාවන් උරගා බලන ප්‍රධාන ක්‍රමය වනුයේ ඒවා බහුතර ජනතාවගේ උපරිම සුබසෙතට අනුකූලවේද ඊට ඔවුන්ගේ අනුමැතිය ලැබේද යනු සොයා බැලීම බව සෑම සහෝදරයකුට අවබෝධ කරදිය යුතුය. ජනතාව කෙරෙහි අප විශ්වාසය බඳවා සිටිනතුරු ජනතාවගේ නොසිඳෙන නිර්මාණ ශක්තිය කෙරෙහි තරයේ විශ්වාස කෙරෙනතුරු ඒ වගේම ජනතාව විශ්වාසයට ගෙන ඔවුන් හා පෑහී සිටින තුරු අපට ඕනෑම සතුරකු පොඩිපට්ටම් කර දමා ඕනෑම කරදරයකින් ගොඩ ආහැකි අතර කිසිම සතුරකුට අප පොඩිපට්ටම් කළ නොහැකි බවත් සෑම සහෝදරයකුට තේරුම් කර දිය යුතුය.

LIBERATION BASE

අවංක ආධ්‍යාගයෙන් ස්වයං විවේචනයෙහි යෙදීම අප පක්ෂය අනිකුත් සියළු දේශපාලන පක්ෂවලින් වෙන්කර දක්වන ලකුණකි. නිතර ඇමදින්නේ නැති කාමරයක් තුල දූලි රොක්වනු ඇත. නිතර හෝදන්නේ නැති මුහුණුවල කුණු තැවරී තිබෙනු ඇත. අප සහෝදරයන්ගේ සිත්වල හා අප පක්ෂයේ වැඩ කටයුතුවල දූලි තැවරී තිබිය හැකි නිසා ඒවා අතුගා දැමීම හා සෝදා හැරීම අවශ්‍යවේ. ''ගලන දිය කිසිදක පල්නොවන්නාසේම දොර සරනේරුවක් කිසිදක ගුල්ලන් විදින්නේ නැතැ''යි යන ප්‍රස්ථාව පිරුළේ තේරුමත් නිතර ක්‍රියාකාරී වන විට විෂබීජ හා වෙනත් ප්‍රාණීන් ආක්‍රමණය කිරීම වලකින බවයි. අප සහෝදරයන්ගේ සිත් සතන් හා අප පක්ෂයේ ශරීරය සෑම ආකාරයෙක දේශපාලන දූලියෙන් හා විෂබීජයෙන් දූෂිත වීම වැලැක්වීමට ඇති එකම සාර්ථක ක්‍රමය නම් අපි ඒ වැඩ කටයුතුවල හොඳ නරක නිතර සොයා බැලීම හා එසේ කිරීමේදී ප්‍රජාතන්ත්‍රවාදී වැඩ ශෛලියක් වර්ධනය කර ගැනීමත් විවේචනය හෝ ස්වයං විවේචනය ගැන බිය නොවීමත් ''ඔබ දන්නා සියළු දේ පවසනු. අඩු ලුහුඬු නැතිව පවසනු, කථිකයාට දෙස් නොපවරා ඔහුගේ වචන අනතුරු ඇඟවීමක් ලෙසින් සලකනු.'' ''ඔබ අතින් වැරදි සිදුවී තිබේ නම් හරිගස්සා ගනු – වැරදි නොකර තිබේනම් වැරදි සිදු

නොකිරීමට ප්‍රවේශම් වනු'' ආදී ජනප්‍රිය චීන කියමන් ක්‍රියාවට යෙදීමත්ය ''අනාගත වැරදි වලකනු සඳහා අතීත වැරදිවලින් පාඩම් ඉගෙනීමත් ලෙඩා බේරාගනු සඳහා ලෙඩේ සුව කිරීමත්'' ස්වකීය කාර්‍යය කොටගත් නිදෙස් කිරීමේ ව්‍යාපාරයෙහි අතිශය සාර්ථකත්වයට හේතුව වූයේ අප විසින් කරගෙන ගිය විවේචනය හා ස්වයං විවේචනය අව්‍යාජ හා අවංක එකක් වීමත් නොසැලකිල්ලෙන් හෝ විකෘත ලෙස නොකළ එකක් වීමත්ය. චීන බහුජනතාවගේ උපරිම අවශ්‍යතාවයන් අනුව නිරන්තරයෙන් ක්‍රියා කරන්නාවූද අප ව්‍යාපාරයෙහි ඇති යුක්ති යුක්ත භාවය ගැන සහමුලින් ඒත්තුගෙන සිටින්නාවූද චීන කොමියුනිස්ට්වාදීන් වන අපි කිසිදු පෞද්ගලික පරිත්‍යාගයක් කිරීමට පසුබට නොවෙමු. ව්‍යාපාරය වෙනුවෙන් අප ජීවිතය වුවද පරිත්‍යාග කිරීමට නිතර සූදනමින් සිටිමු. එසේ වී තිබියදී ජනතාවගේ උවමනාවනට නොසරිලන ඕනෑම අදහසක් දර්ශණයක් හෝ ක්‍රමයක් ඉවතලීමට අපට මැලිවිය හැකිද? අපගේ පිරිසිදු මුහුණු කිලිටි කිරීමට හෝ අපගේ නිරෝගී ශරීරය තුලට කාවැදීමට දේශපාලන දූලිවලට හා විෂබීජවලට අපට ඉඩදිය හැකිද? ජනතාවගේ යහපත සඳහා විප්ලවවාදී වීරයන් අගණිත සංඛ්‍යාවක් ජීවිත පරිත්‍යාග කොට තිබේ. ජීවත්වෙමින් සිටින අපට ඔවුන් සිහිපත් වන විට හදවත් ශෝකයෙන් පිරේ. ඉදින් අප විසින් පරිත්‍යාග නොකරන්නාවූ කිසියම් පෞද්ගලික සුබසෙතක් හෝ අප විසින් ඉවත නොලබනු ලබන කිසියම් වරදක් හෝ තිබිය හැකිද?

සහෝදරවරුනි! මේ සම්මේලනය හමාරවූ පසු අපි යුද පෙරමුණට යන්නෙමු. සම්මේලනයේ යෝජනාවලින් මග පෙන්වනු ලබන අප එහිදී ජපන් ආක්‍රමණිකයන් අවසාන වශයෙන් පරාජය කොට නව චීනයක් ගොඩනැගීමට සටන් කරන්නෙමු. මේ අරමුණ ඉටුකර ගනු සඳහා අප රටේ සියළු ජනතාව සමග අපි එක්සත් වන්නෙමු. මම නැවතත් මෙසේ කියමි: අපි ජපන් ආක්‍රමණිකයන් පරාජය කිරීමට හා නව චීනයක් ගොඩනැගීමට කැමති ඕනෑම පංතියක්, ඕනෑම පක්ෂයක්, ඕනෑම කංඩායමක් හෝ පුද්ගලයෙකු සමග එක්සත් වන්නෙමු. මේ අරමුණ ඉටුකර ගනු සඳහා සංවිධානය හා විනය පිළිබඳ ප්‍රජාතන්ත්‍රවාදී මධ්‍යගත ප්‍රතිපත්ති මත අප පක්ෂයේ සියළුම බලවේගයන් දැඩි සේ

එක්සත් කරන්නෙමු. පක්ෂයේ වැඩ සටහන, නීති මාලාව හා තීරණයන්ට එකඟ වන ඕනෑම සහෝදරයෙකු සමග අපි එක්සත් වන්නෙමු. උතුරු යුද ගමන සමයෙහි අප පක්ෂයට සිටියේ 60,000කට අඩු සාමාජික සංඛ්‍යාවකි. මින් වැඩි දෙනෙකු සතුරා විසින් පසුව විසුරුවා හරින ලදී. ගොවිජන විප්ලවකාරි යුද්ධය සමයේදී අපේ සාමාජික සංඛ්‍යාව 300,000 කට අඩු ගණනකි. ඔවුන්ගෙන් බොහෝ දෙනෙකුම එපරිද්දෙන්ම සතුරා විසින් විසුරුවා හරින ලදී. දැන් අපගේ සාමාජික ශක්තිය 1,20,000 කි, මෙවර මොනම හේතුවක් නිසාවත් අප විසුරුවාලීමට සතුරාට ඉඩ නොතැබිය යුතුය. මේ වකවානු තුනේ අත්දැකීම් වලින් අපට ප්‍රයෝජන ගත හැකි නම් අපි නිහතමානීව හා උඩඟු නොවී සිටිමු නම් පක්ෂය ඇතුලේ සිටින සියළු සහෝදරයන්ගේ සමගිය තහවුරු කිරීමටත් පක්ෂයෙන් පිටත සිටින සියළු ජනයා සමග දැඩි ලෙස එක්සත් වීමටත් අප සමත් වේ නම්, සතුරා විසින් අප විසුරුවා හරිනු වෙනුවට ජපන් ආක්‍රමණිකයන් සහ ඔවුන්ගේ වහල් බලු ගැත්තන් අදිටන් සහගතව තරයේ, මුළුමනින් හා සම්පූර්ණයෙන් පරාජය කොට එයින් පසු නව චීනයක් ගොඩනැගීමට අපට හැකි වනු නිසැකය.

චීන කොමියුනිස්ට් පක්ෂයේ උත්සාහය නොමැතිව චීන, ජනතාවගේ බලපවුර ලෙසින් චීන කොමියුනිස්ට්වාදීන් නොසිටින්නට, චීනයට කිසිදක නිදහස හෝ විමුක්තිය ලබා ගැනීමටත්, කර්මාන්ත දියුණු කිරීමට හා කෘෂිකර්මය නූතන ක්‍රමයට හැඩගැසීමටත් නොහැකි බව විප්ලවයේ ත්‍රිවිධ වකවානුවේ අත්දැකීම්වලින් විශේෂයෙන්ම, ජපන් විරෝධී ප්‍රතිප්‍රහාරක යුධයෙන් අපට හා සමස්ත චීන ජනතාවට ඒත්තු ගොස් තිබේ.

සහෝදරවරුනි! විප්ලව තුනේ අත්දැකීම් වලින් සන්නද්ධ වූ චීන කොමියුනිස්ට් පක්ෂය ඇතිවිට අපගේ ශ්‍රේෂ්ඨ දේශපාලන කාර්‍යය සාර්ථක ලෙස ඉටුකළ හැකි බව මම තරයේ විශ්වාස කරමි.

දස දහස් ගණන් වීරයින් ජනතාව වෙනුවෙන් වික්‍රමාන්විත ලෙස ස්වකීය ජීවිත පරිත්‍යාග කර තිබේ; ඔවුන්ගේ රුධිරයෙන් රක්තවර්ණ වූ මාවත ඔස්සේ ඔවුන්ගේ ධජය ඉහලින් ඔසවාගෙන අප ඉදිරියට යමු.

නව ප්‍රජාතන්ත්‍රවාදී චීනයක් ඉක්මණින් බිහිවන්නේය! ඒ ශ්‍රේෂ්ඨ දිනයට ජයවේවායි අපි ප්‍රාර්ථනය කරමු!

සටහන්

1. චීන ජාතික විමුක්තිකාමී පෙරමුණු බලකාය හෙවත් ජාතික විමුක්ති පෙරමුණු බලකාය වශයෙන් කෙටින් හැඳින්වෙන්න වූකලී 1935 දෙසැම්බර් 9 ද ව්‍යාපාරයට සහභාගි වූ ප්‍රගතිශීලී තරුණයන් 1936 සැප්තැම්බරයේදී චීන කොමියුනිස්ට් පක්ෂයේ නායකත්වය යටතේ පිහිටුවන ලද විප්ලවවාදී තරුණ සංවිධානයයි. ප්‍රතිප්‍රහාරක යුද්ධය ආරම්භ වීමෙන් පසු එහි බොහෝ සාමාජිකයෝ සටන්වලට සහභාගි වී සතුරු පෙදෙස් වලට පිටුපසින් කඳවුරු පෙදෙස් පිහිටුවීමට පටන් ගත්හ. කුඕමින්තාන පෙදෙස්වල ජාතික පෙරමුණු බලකායේ සංවිධාන 1938 දී චියංකායිෂෙක් ආංඩුව විසින් බලහත්කාරයෙන් විසුරුවා හරින ලදී. විමුක්ති ප්‍රදේශවල පැවති එම සංගම් පසුව ජාතිකාරක්ෂක තරුණ සංගමය සමග ඒකාබද්ධ කරන ලදී. එය ඊටත් වඩා පුළුල්වැඩ පිළිවෙළක් තිබුන සංවිධානයකි.

2. 1937 ජූලි 7 ද ජපන් ආක්‍රමණකාරී හමුද පීකිනයට කිලෝමීටර 10 ක් නිරිත දිගින් පිහිටි ලූ කව්චියාඕ හි චීන හමුද කඳවුරට පහර දුන්හ. උද්යෝගිමත් හා දේශ ව්‍යාප්ත ජපන් විරෝධි ව්‍යාපාරයේ ආභාෂය ලැබූ චීන සේනාවෝ ප්‍රති ප්‍රහාරයක් එල්ල කළහ. මේ සිද්ධිය වසර 8 ක් පැවති චීන ජනතාවගේ ජපන් විරෝධි විරෝදර ප්‍රති ප්‍රහාරක යුද්ධයේ ආරම්භ විය.

3. කොමියුනිස්ට් විරෝධි ප්‍රහාරයන් තුන ගැන සම්පූර්ණ විස්තරයක් සඳහා "කුඕමින්තානයේ, මධ්‍යම විධායක සභාවේ සහ මහජන දේශපාලන මංඩලයේ රැස්වීම් පිළිබඳ විවරණයක්" නමැති ලිපිය බලන්න. (මාඕ සේතුංගේ තෝරාගත් කෘතීන්, 3 වෙනි වෙළුම, 137–51 පිටු)

4. චීනයේ උතුරු - දකුණු මහා දුම්රිය මාර්ගය ගමනා ගමනය සඳහා විවෘත කිරීමට කරන ලද මේ කටයුතු ජපන් හමුදාව 1944 මැයි මස කැන්ටන්-හැන්කව් දුම්රිය මාර්ගය මුළුමනින් අල්ලා ගෙන උතුරු හා දකුණු චීනය අතර කෙලින්ම ගොඩ බිමෙන් සම්බන්ධයක් ඇති කිරීමට එල්ල කළ ප්‍රහාරයේ කොටසක් විය.

5. ස්කෝබී ග්‍රීසිය ආක්‍රමණය කල බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී හමුදා වල අණදෙන නිලධාරියා විය. 1944 ඔක්තෝබරයේදී ජර්මන් ආක්‍රමනිකයන් පරාජය ලබා යුරෝපීය මහාද්වීපයෙහි පසු බසිමින් සිටියදී ස්කොබිගේ හමුදා ග්‍රීසියට ඇතුළු වී එතෙක් ලන්ඩනයෙහි පැවති ප්‍රතිගාමී විදෙස්ගත ග්‍රීක ආණ්ඩුව ග්‍රීසියෙහිම පිහිටුවා ලීහ. ජර්මන් ආක්‍රමණිකයන්ට විරුද්ධව දිගු කලක් මුළුල්ලේ විරෝදර අරගලයක් කළ ග්‍රීක මහජන විමුක්ති හමුදාවට පහර දෙනු සඳහාත් ග්‍රීක දේශප්‍රෙමීන් මරා දමනු සඳහාත් එම ආණ්ඩුවට ආධාර දී ග්‍රීසිය ලෙයින් නැහැවූ මිනිහා ස්කෝබීය.

6. පාඕ චියා වූ කලී කුඕමින්තාන ප්‍රතිගාමී කල්ලිය සවකීය පැසිස්ට්වාදී පාලනය පහල මට්ටමෙහි ක්‍රියාත්මක කරනු සඳහා යොදා ගත් පරිපාලන ක්‍රමයයි. 1932 අගෝස්තු 1 දා චියැන්-කායිෂෙක් ''පාඕ සහ චියා සංවිධාන කිරීමට අණපනත් සහ කෝරළවල ජන සංගණනයක් ඇති කිරීමෙ අණපනත්'' පැණ විය. මෙම සංගනනයට හෝනාන්, හූපේ සහ අන්වියන පලාත් ඇතුලත් වූහ. පාඕ සහා චියා පවුල් අනුව සංවිධාන කළ යුතු බව එම රෙකුලාසි වලින් කියවිණි. එක් චියාවක් පවුල් 10 කින් සමන්විත වූ අතර එක් පාඕවක් චියා 10 කින් සමන්විත විය. අසල්වැසියන් එකිනෙකාගේ කටයුතු ගැන සොයා බලා නිලධාරීන්ට වාර්තා කළ යුතු විය. එකෙක් වරද කරු වනු විට සියල්ලන්ටම දඩුවම් ලැබුණි. බලහත්කාර-යෙන් වැඩ ගැනීමේ ප්‍රතිවිප්ලවවාදි රෙකුලාසිද පනවනු ලැබීය. කුඕමින්තාන පාලනය යටතේ පවත්නා සියලු පලාත්වල නාගරික පෙදෙස්වල මේ පැසිස්ට් වාදි පාලන ක්‍රමය ක්‍රියාත්මක කෙරෙන බව 1934 නොවැම්බර් 7 දා කුඕමින්තාන ආණ්ඩුව විසින් නිල වශයෙන්ම නිවේදනය කරන ලදී.

7. 1943 නොවැම්බරයේදී චීනයේ එක්සත් ජනපදයේ සහ බ්‍රිතාන්‍යයේ සහභාගිත්වයෙන් පැවැත්වූ කයිරෝ සම්මේලනය

විසින් තායිවානය සහ තවත් පෙදෙස් චීනයට ආපසු භාර කළ යුතු යයි පැහැදිලිවම පොරොන්දු වෙමින් කයිරෝ ප්‍රකාශනය නිකුත් කරන ලදී. 1950 ජූනියේදී එක්සත් ජනපද ආණ්ඩුව මේ ගිවිසුම අමු අමුවේ කඩා දමමින් තායිවානය පාලනය කරනු සඳහා නාවික හමුදාවක් එවීය. මෙසේ කරන ලද්දේ චීනයට ඇති හිමිකම නැති කරනු සඳහාය.

8. යු ආන් ෂිකායි, වූකලී චිං රජ පෙළපතේ අවසාන කාල-යෙහි විසූ උතුරුකරයේ යුද්ධාධිපතියන්ගේ නායකයාය. 1911 විප්ලවය විසින් චිං රජ පෙළපත පෙරළා දැමීමෙන් පසු ඔහු සමූහාණ්ඩුවේ ජනාධිපතිකම පැහැර ගෙන උතුරු යුද්ධාධිපතියන්ගේ ප්‍රථම ආණ්ඩුව පිහිටුවාලීය. එය මහ ඉඩම් හිමි පංතිය හා කොම්ප්‍රදෝරු පංතිය නියෝජනය කළ ආණ්ඩුවක් විය. ඔවුහු මෙසේ කළේ ප්‍රතිවිප්ලවවාදී ආයුධ සන්නද්ධ හමුදාවන් සහ අධිරාජ්‍යවාදීන්ගේ ආධාරය ඇතිවය. ඒවගේම එවකට විප්ලවය මෙහෙයවමින් සිටි ධනපති පංතියේ සමාදන කාමී සවභාවයෙන් ප්‍රයෝජන ගනිමිනි. 1915 දී අධිරාජයා වීමට උවමනා වූ ඔහු ජපන් අධිරාජ්‍යවාදීන්ගේ ආධාරය ලබා ගනු සඳහා මුළුමහත් චීනය තම පාලනය යටතට ගනු සඳහා ජපානය ඉදිරිපත් කළ ඉල්ලීම් 21 පිළිගත්තේය. ඒ අවුරුද්දේම දෙසැම්බරයේදී ඔහුගේ සිංහාසනාරූඪ වීමට විරුද්ධව යුනාන් පලාතේ කැරැල්ලක් හටගත් අතර ඊට රට පුරා සහයෝගය ලැබුණි. යු ආන් ෂි කායි 1916 ජූනි මස පීකිනයේදී මිය ගියේය.

9. ඕමෙයි වූ කලී සේ චු ආන් ප්‍රාන්තයේ නිරිත දිග කොට සෙහි පිහිටි ප්‍රසිද්ධ කන්දකි. මෙහිදී ඉන් නියෝජනය වන්නේ ජපන් විරෝධි ප්‍රතිප්‍රහාරක යුද්ධයේදී චියැංකායිෂෙක් පාලක පිරිසේ අන්තිම නිවහන වූ සේ චු ආනයේ කඳුකර පෙදෙස්ය,

10 1924 නොවැම්බර් 10 දා දරණ ආචාර්ය සුන්යත් සෙන්ගේ ''මා උතුරට යන ගමන ගැන ප්‍රකාශයක්'' නමැති ලියවිල්-ලෙන් උපුටා ගන්නා ලදී.

11. 18 වෙනි ශතවර්ෂයේ අග භාගයේ පටන් බොහෝ කලක් ගතවන තුරු බ්‍රිතාන්‍යය චීනයට වැඩි වැඩියෙන් අබිං

එවන්නට විය. මෙනිසා චීන ජනතාව අබිංවලට ඇබ්බැහි වූවා පමණක් නොව. චීනයේ ධනයද කොල්ලකනු ලැබීය. අබිං ජාවාරමට චීනයෙහි දැඩි විරෝධයක් ඇතිවිය. චීනය සමග ඇති වෙළඳ ගනුදෙනු ආරක්ෂා කිරීමේ පියවරක මුවා වෙන් 1840 දී චීනයට විරුඬව ආයුධ සන්නඬ ආක්‍රමණයක යෙදුනහ. ලින් ට් සේ-ෂ්සු ගේ නායකත්වයෙන් යුත් චීන සේනාවෝ ප්‍රතිප්‍රහාරයක් එල්ල කළහ, කැන්ටනයේ ජනතාව "බ්‍රිතාන්‍ය හමුදාව මැඩලීමේ" ව්‍යාපාරයක් සෙවච්ඡාවෙන්ම සංවිධාන කළහ. මෙයින් ආක්‍රමණකාරී බ්‍රිතාන්‍ය හමුදාවලට දරුණු පහරවල් එල්ල විය. එසේ වුවද දූෂිත චිං ආණ්ඩුව 1842 දී බ්‍රිතාන්‍යය සමග නැන්කින් ගිවිසුම අත්සන් කළේය. මේ ගිවිසුමෙන් වන්දි ගෙවීමටද හොංකොනය බ්‍රිතාන්‍යයට පැවරීමටද, ෂැංහයි, පූචෞ, ඇමෝයි, නිංපෝ, සහ කැන්ටන් යන නගරයන් බ්‍රිතාන්‍ය වෙළඳාම සඳහා විවෘත කිරීමටද චීනයට ගෙන්වනු ලබන බ්‍රිතාන්‍ය බඩුවල රේගු බදු බ්‍රිතාන්‍යය හා චීනය ඒකාබඬ වී නියම කිරීමටද පොරොන්දු වුනි.

12. අත්ලන්තික් ප්‍රඥප්තිය 1941 අගෝස්තු මස පැවැති අත්ලන්තික් සම්මේලනය අවසානයේදී එක්සත් ජනපදය හා බ්‍රිතාන්‍යය විසින් ඒකාබඬව නිකුත් කරන ලද්දකි. මොස්කව් සම්මේලනය සෝවියට් දේශයේ, එක්සත් ජනපදයේ, සහ බ්‍රිතාන්‍යයේ විදේශීය ඇමතිවරුන් විසින් 1943 ඔක්තෝබරයේදී පවත්වන ලද්දකි. ටිහිරාන් සම්මේලනය 1943 නොවැම්බර-දෙසැම්බර සමයෙහි සෝවියට් දේශය, එක්සත් ජනපදය සහ බ්‍රිතාන්‍යය අතර අයිරානයේ අගනුවර පැවැත්වුනු සාකච්ඡාවකි. ක්‍රිමියා සම්මේලනය සෝවියට් දේශය, එක්සත් ජනපදය සහ බ්‍රිතාන්‍යය අතර 1945 පෙබරවාරියේදී යෝල්ටාහි පැවති සාකච්ඡාවකි. මේ සියළු ජාත්‍යන්තර සම්මේලනවලට සහභාගි වූ රටවල් පොදු උත්සාහයක් මගින් පැසිස්ට් ජර්මනිය හා ජපානය පරදලීමටත්, යුඬයෙන් පසු ආක්‍රමණකාරී සහ පැසිස්ට්වාදී බලවේග නැවත හිස එසවීම වැලකීමටත්, ලෝක සාමය රැකීමටත්, සියළු රටවලට ස්වාධීනතාවය සහ ප්‍රජාතන්ත්‍රය දිනා ගැනීමට උදව්වීමටත් ගිවිස ගත්හ. එහෙත් යුඬය හමාර වූ විගස එක්සත් ජනපදය සහ බ්‍රිතාන්‍යය ඒ සියළු ගිවිසුම් උල්ලංඝනය කළහ.

13. 1945 අප්‍රියෙල්-ජූනි සමයෙහි රටවල් පනහක සහභාගිත්වයෙන් සැන්ෆ්‍රැන්සිස්කෝහි පැවැත්වුණු ජාත්‍යන්තර සංවිධානය පිළිබඳ එ. ජා. සාකච්ඡාවට චීනයේ විමුක්ති ප්‍රදේශවල නියෝජිතයා වශයෙන් වුං-පි වූ සහෝදරයා සහභාගි විය. එ. ජා. සංවිධානය පිහිටුවීමේ යෝජනා සකස් කරන ලද්දේ සෝවියට් දේශයේ, එක්සත් ජනපදයේ, බ්‍රිතාන්‍යයේ සහ චීනයේ නියෝජිතයන්ගේ සහභාගිත්වයෙන්, මොස්කව් හා ටිහිරාන් සාකච්ඡාවනට අනුකූලව, එක්සත් ජනපදයේ ඩුම්බාර්ටන් ඕක්ස්හිදී 1944 අගෝස්තු-ඔක්තෝබර් සමයෙහි පැවැති සම්මේලනයේ දීය.

14. චීනයේ විමුක්ති ප්‍රදේශවල ජනතා සම්මේලනයක් කැඳවනු සඳහා කටයුතු සූදනම් කිරීමේ කොමිටියක් චීන කොමියුනිස්ට් පක්ෂයේ සත්වන ජාතික සම්මේලනයෙන් පසු යේනානයෙහි පිහිටුවන ලද මුත්, සියළු විමුක්ති ප්‍රදේශවල නියෝජිතයන්ගේ සහභාගිත්වයෙන් ආරම්භක රැස්වීමක් පවත්වන ලදමුත් ජපානයේ යටත්වීමත් සමග තත්වයෙහි වෙනසක් සිදු වූයෙන් පළමු කී සම්මේලනය නොකැඳවන ලදී.

LIBERATIONBASE

LIBERATIONBASE

කම්කරුවා මුද්‍රණාලය
නො: 121,
යුනියන් පෙදෙස,
කොළඹ-2.

LIBERATIONBASE
ඩිජිටල් පුස්තකාලය

ඩිජිටල් පුස්තකාලය සහ ලේඛණ සංරක්ෂණ ව්‍යාපෘතිය
ආරම්භය (***NMSG Library*** ලෙස): 2010
LIBERATIONBASE ලෙස නැවත නාමකරණය: 2013

සූචිකරණ දත්ත

- කෘතිය: සහාග ආණ්ඩුව ගැන
- කතෘ/පරිවර්තක: මාඕ සේතුං/-
- ප්‍රකාශක: කම්කරුවා ප්‍රකාශනයකි, කොළඹ
- පළමු ඩිජිටල් පළ කිරීම: 2019-05-31
- ඩිජිටල් සංස්කරණයන්: V1:2019-05-29
- පිටු ගණන: 108
- භාෂා මාධ්‍ය: සිංහල
- ගොනු ආකෘතිය: PDF

Web: https://liberationbase.wordpress.com
Email: slradical@ymail.com